# රණවිරුවා

2023 ජූලි • 257 කලාපය




## ඒතෙර ජයගොස නැංවූ මෙතෙර රණවිරු අභිමානය

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර






# රාමඤ්ඤ නිකායේ
# උපසම්පදා
# විනය කර්මය







ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ 73 වන උපසම්පදා විනය කර්ම පිංකමෙහි සමාරම්භක උත්සවය පසුගිය ජූලි මස 20 වන දින මාතලේ එඩ්වඩ් ක්‍රීඩාංගණයේදී මහා සංඝරත්නය ඇතුළු සම්භාවනීය අමුත්තන් පිරිසකගේ සහභාගීත්වයෙන් ආරම්භ වූහ. එම අවස්ථාවට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්, හිටපු කථානායක කරු ජයසූරිය මහතා, මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමන්, රාජ්‍ය අමාත්‍යවරු, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ ජ්‍යේෂ්ඨ පොලිස් නිලධාරීන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

රාජ්‍ය අනුග්‍රාහකත්වය යටතේ පැවැත්වූ මෙම උත්සවයේදී සාමණේර භික්ෂූන් වහන්සේලා 300 නමක් ඉපැරණි බෞද්ධ පැවිදි සම්ප්‍රදායට අනුකූලව උපසම්පදාව ලබා ගත්හ. ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක අතිපූජ්‍ය මකුලෑවේ විමල මහා නාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මෙම උපසම්පදා විනය කර්මය පැවැත්විණි.



# රත්නපුර ශ්‍රී සුමන සමන් දේවාල පරිශ්‍රයේ ආබාධිත බැතිමතුන්ට විශේෂ ගමන් මාර්ගයක්



රත්නපුර ශ්‍රී සුමන සමන් දේවාල පරිශ්‍රයේ ආබාධිත පුද්ගලයින් සහ බැතිමතුන් වෙනුවෙන් ඉදිකරනු ලැබූ විශේෂ ගමන් මාර්ගය විවෘත කිරීමේ උත්සවය පසුගිය ජූලි 23 වන දින පැවති අතර, එම අවස්ථාව සඳහා ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මහතා සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූහ.

බස්නායක නිලමේ වරයාගේ සහ ශ්‍රී සුමන සමන් දේවාලයේ බලධාරීන්ගේ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත 6 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ හටපිරිස්වල ශ්‍රමදායකත්වය සහ තාක්ෂණික දැනුම උපයෝගී කරගනිමින් මාස දෙකකට අඩු කාලසීමාවක් තුළ අඩි 265 ක දිගකින් සමන්විත මෙම විශේෂ ගමන් මාර්ගය ඉදිකරනු ලැබූහ. මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සඳහා රත්නපුර දිස්ත්‍රික් ජාත්‍යන්තර සිංහ සමාජයේ 306 සී/2 වෙතින් අනුග්‍රාහකත්වය දැක්විය.





# දීඝවාපිය චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ 2 වන අදියර ඇරඹේ

ශ්‍රී ලංකාවේ පූජනීය සිද්ධස්ථාන දහසයෙන් එකක් වන අම්පාර "දීඝවාපිය" චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ 1 වන අදියර යටතේ උස අඩි 69 ක ප්‍රමාණයක් නිමකිරීමෙන් පසු එහි 2 වන අදියර ඉකුත් ජූලි මස 10 වන දින ආරම්භ කරනු ලැබිය. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, යුද්ධ හමුදාධිපති, ගුවන් හමුදාධිපති ඇතුළු තවත් සම්භාවනීය අමුත්තන් රැසක් එහි සමාරම්භක අවස්ථාවේදී ඊට මුල්ගල් තැබීමට එක්වූහ.

එහිදී, ඔවුහු විහාරස්ථානයේ ධාතු මන්දිරය, බැතිමතුන්ගේ විවේකාගාරය සහ භික්ෂූන් වහන්සේලාගේ සංඝාවාසයන්හි දැනට සිදුකෙරෙමින් පවතින ඉදිකිරීම් කටයුතු පිළිබඳවද නිරීක්ෂණය කළහ. නාවික හා ගුවන් හමුදා සාමාජිකයන් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව ඉංජිනේරු සේවා බලකාය සහ 8 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සාමාජිකයන් විසින් සමස්ත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබති.



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රවීන පුරාවිද්‍යාඥයන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අඩි 268 ක් උසැති චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය ත්‍රිවිධ හමුදාවේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් එක්ව 2020 වසරේ ආරම්භ කරනු ලැබූ අතර, ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් "දීඝවාපිය භාර අරමුදල" වෙතින් සම්පාදනය කරනු ලබයි.



# "අක්ත පත්‍ර" ප්‍රදානය කිරීමේ පුණ්‍යෝත්සවය යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන්

පැලියගොඩ ජයතිලකාරාම පුරාණ විහාරස්ථානයේ විහාරාධිපති ගැටබෙරිකන්දේ රතනසිරි හිමිපාණන් වෙත අමරපුර මහා නිකායේ සිරිසද්ධම්මවංශ පාර්ශ්වය මගින් බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝනායක පදවිය සමගින් "විමලසිරි වංශාලංකාර ධර්මකීර්ති ශ්‍රී" යන ගෞරව නාමය පිරිනමා ඇත. එහි "අක්ත පත්‍ර" ප්‍රදානය කිරීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී වූයේය. එහිදී, උන්වහන්සේ වෙත බුරුම රජයෙන් පිරිනමන ලද "අග්ගමහා සද්ධම්ම ජෝතික ධජ" ගෞරව උපාධි නාමය ප්‍රදානය කිරීම ද සිදුවිය.



මෙම පුණ්‍යෝත්සවය අමරපුර මහා නිකායේ වැඩබලන මහානායක පූජ්‍ය කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති නාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැලියගොඩ ජයතිලකාරාම විහාරස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා මහා සංඝරත්නය, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි, 141 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු විශාල බැතිමතුන් පිරිසක් එක්ව සිටියහ.







# ශ්‍රී ලංකාවේ ඉන්දුනීසියානු තානාපති යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාවේ ඉන්දුනීසියානු තානාපති ඩිවි ගුස්ටිනා ටෝබිං (*Dewi Gustina Tobing*) මහත්මිය, ශ්‍රී ලංකාවේ ඉන්දුනීසියානු තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශක හේරු ප්‍රයිත්නෝ (*Mr' Heru Prayitno*) මහතා ඉකුත් ජූලි 11 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සමඟ සුහද සාකච්ඡාවක නිරතවූහ.

එහිදී යුද්ධ හමුදාවේ සංවර්ධනය ඉලක්ක කරගත් කාර්යභාරයන් පිළිබඳව සහ දෙරට අතර පවතින සුහදතාවය, සහයෝගීතාවය මෙන්ම ද්විපාර්ශ්වික සබඳතාවයේ දිගුකාලීන බැඳීම, ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව සඳහා ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ඒකාබද්ධ අභ්‍යාසවලට සහභාගී කරවීමේ හැකියාව පිළිබඳව අදහස් හුවමාරු කරගන්නා ලදී. මෙම හමුව අවසානයේදී යුද්ධ හමුදාධිපති සහ ශ්‍රී ලංකාවේ ඉන්දුනීසියානු තානාපතිතුමන් අතර සුහදතාවය සහ සහයෝගීතාව සංකේතවත් කරමින් සමරු තිළිණ හුවමාරුවක් ද සිදුකෙරිණි.

# ශ්‍රී ලංකාවේ මාලදිවයින් ජනරජයේ මහ කොමසාරිස් යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාවේ මාලදිවයින් ජනරජයේ මහ කොමසාරිස් අතිගරු අලි ෆායිස් (Ali Faiz ) මහතා පසුගිය ජූලි 27 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.

මෙම සුහද හමුවේදී, යුද්ධ හමුදාවේ සංවර්ධනය ඉලක්ක කරගත් කාර්යභාරයන් පිළිබඳව සහ දෙරට අතර පවතින සුහදතාවය, ද්විපාර්ශ්වික සබඳතාවයේ දිගුකාලීන බැඳීම ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව සඳහා ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ඒකාබද්ධ අභ්‍යාසවලට සහභාගී කරවීමේ හැකියාව පිළිබඳව අදහස් හුවමාරු කරගන්නා ලදී.

# ධුරයෙන් නික්මයන ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජ්‍ය මහ කොමසාරිස් යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජ්‍ය මහ කොමසාරිස් ධුරයේ රාජකාරී හෙබවූ විනෝද් කුරියන් ජේකබ් මහතා (*Mr Vinod Kurian Jacob*) ඉකුත් ජූලි මස 14 වන දින මෙරට සිය රාජ්‍යතාන්ත්‍රික කටයුතු අවසන් කර පිටත්ව යාමට පෙරාතුව යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවී සුහද පිළිසඳරක නිරත විය. මෙම හමුවේදී නියෝජ්‍ය මහ කොමසාරිස්තුමන් තම ධුර කාලය තුළ ලබා දුන් සහයෝගය සහ සුහදතාවය පිළිබඳව යුද හමුදාධිපති විසින් සිය කෘතඥතාව පළ කරන ලදී.

# ශ්‍රී ලංකාවේ පාකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවේ

ශ්‍රී ලංකාවේ පාකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක ධුරයේ රාජකාරි කටයුතු සිදුකළ කර්නල් මුහම්මද් සෆ්දාර් ඛාන් (*Colonel Muhammad Safdar Khan*) ඉකුත් ජූලි මස 05 වන දින මෙරට සිය රාජ්‍යතාන්ත්‍රික කටයුතු අවසන් කර තම රට වෙත පිටත්ව යාමට පෙරාතුව යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.



එහිදී පැවැති හමුවේදී කලාපයේ පොදු කරුණු සහ දෙරටේ හමුදාවන් අතර දිනෙන් දින වර්ධනය වන ද්විපාර්ශ්වික සබඳතා පිළිබඳව දෙදෙනා අදහස් හුවමාරු කර ගත්හ. කර්නල් මුහම්මද් සෆ්දාර් ඛාන් තම සේවා කාලය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලබාදුන් සහයෝගය වෙනුවෙන් එහිදී කෘතඥතාව පළකළ යුද්ධ හමුදාධිපති ඔහුගේ ඉදිරි කටයුතු සඳහා සුබ පැතුම් එක් කළේය.

# රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි

රුසියාවේ මොස්කව් නුවර පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක ලෙස පත්කරන ලද ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගෲප් කපිතාන් එස්ආර් ජයරත්න ඩබ්ලිව්වී ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඉකුත් ජූනි මස 30 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.



යුද්ධ හමුදාධිපති විසින් එහිදී ඔහු වෙත සිය සුභාශිංසන පිරිනැමූ අතර, නව පත්වීමේ වැදගත්කම සහ රාජ්‍ය තාන්ත්‍රිකයකු වශයෙන් රටේ යහපත වෙනුවෙන් ඉටුකළ හැකි කාර්ය භාරය පිළිබඳවද අවධාරණය කළේය.



# මාතලේ විජය විද්‍යාලයේ ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණයට රණවිරු සහාය





මාතලේ විජය විද්‍යාලයේ විදුහල්පති රාජීත තීක්ෂණ මහතා විසින් කළ ඉල්ලීමකට අනුව එම විද්‍යාලයේ ක්‍රීඩා පිටියේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම සඳහා රණවිරුවෝ දායකත්වය දැක්වූහ. එම විද්‍යාලයේ ආදිශිෂ්‍යයකු වන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් තම අධ්‍යාපනය හැදෑරූ පාසල් මාතාවට කෘතගුණ සැලකීමක් ලෙස එම කටයුත්ත සඳහා උපදෙස් හා මගපෙන්වීම ලබාදෙන ලදී. ඒ අනුව ඉකුත් ජූලි 19 වන දින ඇරඹි එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරුගේ අධීක්ෂණයෙන් 6 ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ භටපිරිස් අවශ්‍ය තාක්ෂණික සහ ශ්‍රම දායකත්වය ලබාදෙනු ලැබූහ.

එහිදී, යුද්ධ හමුදාධිපති විද්‍යාල පරිශ්‍රය නිරීක්ෂණය කරමින් විදුහල්පති සහ ගුරුභවතුන් සමග සුහද පිළිසඳරකද නිරත විය. යුද්ධ හමුදාධිපති සිය පාසල් අධ්‍යාපනය හදාරන අතරතුර පාසල් ශිෂ්‍යභට බළකායේ සාමාජිකයකු ද වූ අතර, විද්‍යාලයීය බාලදක්ෂ කණ්ඩායමේ සාමාජිකයකු ලෙස මෙන්ම ප්‍රධාන ශිෂ්‍ය නායක ධුරයද හොබවා ඇත. මෙම අවස්ථාව සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී, ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී, ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී මෙන්ම පාසල් කාර්ය මණ්ඩලය සහ ආදිශිෂ්‍ය සංගමයේ නියෝජිතයෝ රැසක්ද සහභාගී වූහ.

# එතෙර දස්කම් පෑ දිරිය දරුවන්ට බුහුමන් පිදේ

තායිලන්තයේ බැංකොක් නුවර පසුගියදා පැවති ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලිය - 2023, පැරිසියේ පැවති පැරා මලල ක්‍රීඩා ලෝක ශූරතාවලිය - 2023 සහ පොදුරාජ්‍ය මණ්ඩලීය ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ සහ යොවුන් ශූරතා තරගාවලිය - 2023 යන තරගාවලි සඳහා සහභාගී වී ජාත්‍යන්තර වාර්තා තබමින් ශ්‍රී ලංකාවට පදක්කම් හිමිකරදුන් යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 10 දෙනකු වෙත නිල උසස්වීම් ලබාදීම ඉකුත් ජූලි මස 21 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් සිදුකෙරිණ. යුද්ධ හමුදාධිපති එහිදී එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමගින් ඔවුන්ගේ ජයග්‍රහණ හා අත්දැකීම් පිළිබඳව විමසමින් සුහදව අදහස් බෙදාහදා ගත්තේය.



"ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලිය-2023" සඳහා සහභාගී වී විශිෂ්ට දස්කම් දැක්වූ 2 (සේවා)ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සැරයන් කුමාරගේ එච්කේකේ සහ ලාන්ස් කෝප්‍රල් රාජකරුණා ආර්එම්ආර්එන් ද, 6 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ බොම්බාඩියර් දර්ශන එස්ඒ, ලාන්ස් බොම්බාඩියර් රාජකරුණා පීඑම්පීඑල් හා තුවක්කු සෙබළ නිකු ජීඩීකේකේ ද, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කෝප්‍රල් රාමනායක එන්, කෝප්‍රල් ලේකම්ගේ එච්එල්එන්ඩී සහ කාන්තා සෙබළ කුරේ ඩීආර්එච් ද එලෙස යුද්ධ හමුදාධිපති අතින් ඇගයීමේ සංකේත හිමිකරගත් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ වූහ.



පොදුරාජ්‍ය මණ්ඩලීය ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ සහ යොවුන් ශූරතාවලිය - 2023 සහ පැරා මලල ක්‍රීඩා ලෝක ශූරතාවලිය - 2023 හි දී විශිෂ්ට දස්කම් දැක්වූ 15 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ බලලත් නිලධාරී II අබේවික්‍රම ඒජීඑස් සහ ශ්‍රී ලංකා පොලිස් සේවා බලකායේ පැරා මලල ක්‍රීඩක මාණ්ඩලික සැරයන් දුලාන් කේජීඑස් යන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙතද එහිදී නිල උසස්වීම් සහ ඇගයීමේ සංකේත ප්‍රදානය කෙරිණ.







# රණවිරු දෑතින් සෙවණක්





මාතලේ ප්‍රදේශයේ ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන පවුලක් වෙනුවෙන් රණවිරු ශ්‍රමයෙන් ඉදිකරන ලද නව නිවසක් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි මස 19 වන දින එම පවුලේ සාමාජිකයන් වෙත පවරා දෙනු ලැබූහ.

දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ජීවත් වූ අදාළ පවුල වෙත නිවසක් ඉදිකර දෙන ලෙස මාතලේ විජය විද්‍යාලයේ විදුහල්පති විසින් එම විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන යුද්ධ හමුදාධිපතිගෙන් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් එතුමන්ගේ උපදෙස් මත මෙම සත්කාරය සිදුකෙරිණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සම්බන්ධීකරණයෙන් ඕස්ට්‍රේලියාවේ පදිංචි දානපතිනියක වන කාංචනා ඉලංගසිංහ මහත්මිය විසින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී මෙම නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් ලක්ෂ 12.5 මුදලක් සහ සහ රු. 50,000.00 වටිනා ගෘහ භාණ්ඩ අදාළ නිවාසලාභී පවුල වෙත පරිත්‍යාග කරනු ලැබීය. මෙම නිවසේ ඉදිකිරීම් කටයුතු 532 වන පාබල බලසේනා බලප්‍රදේශයේ ස්ථාපිත 8 ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් සති කිහිපයක් ඇතුළත නිමකරනු ලැබූහ. මෙම නිවස පවරාදීමේ අවස්ථාවට පරිත්‍යාගශීලින් නියෝජනය කරමින් චිත්‍රා ඉලංගසිංහ යන මහත්මිය ද, අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති ඇතුළු පිරිසක් එක්වූහ.

# නිලධාරි පුහුණු දිනයට යුද්ධ හමුදාධිපතිද එක්වේ







ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ නිලධාරීන්ගේ පුහුණු දින වැඩමුළුව ඉකුත් ජූලි 20 මස දින එම රෙජිමේන්තු මූලස්ථානයේදී පැවැති අතර, එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු සහභාගී විය.

මෙම පුහුණු දින වැඩමුළුව සඳහා ශාරීරික අභ්‍යාස පුහුණුව, සරඹ පුහුණුවීම්, දේශන සහ ක්‍රීඩා වැඩසටහන් ඇතුළත් විය. ඒ සඳහා එම රෙජිමේන්තු නිලධාරීන් 150 දෙනකු සහභාගී වූ අතර, එදින සන්ධ්‍යාවේදී පුහුණු දිනයට සමගාමීව "නිලධාරී සන්ධ්‍යා සුහද හමුව" *(Dinners Club)* පැවැත්විණ.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ඒ කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී ගේ පිළිගැනුම් මධ්‍යයේ නිලධාරී නිවස්නයේ පැවති එම අවස්ථාව සඳහා යුද්ධ හමුදාධිපති එක්වෙමින් එහි නිලධාරීන් සමග අදහස් හුවමාරුවක ද නිරත විය. මේජර් ජෙනරාල් උදය පෙරේරා (විශ්‍රාමික) විසින් එම නිලධාරී සන්ධ්‍යා සුහද හමුවේදී නායකත්ව ලක්ෂණ පිළිබඳව 'What Makes a Leader' මැයෙන් ආරාධිත දේශනය පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එම්ජේඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී, අධ්‍යක්ෂ ජෙනරාල් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මේජර් ජෙනරාල් ජේඒආර්එස්කේ ජයසේකර යූඑස්පී පීඑස්සී ඇතුළු නිලධාරීන් පිරිසක්ද එක්වූහ.

## යුද්ධ හමුදාධිපති 1 වන ශ්‍රී ලංකා රයිෆල් බලකා මූලස්ථානයේ සංචාරයක

යුද්ධ හමුදාධිපති ඉකුත් ජූලි 20 වන දින මාතලේ ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ 73 වන උපසම්පදා විනය කර්ම මහෝත්සවයට සහභාගී වීමෙන් අනතුරුව එදින සන්ධ්‍යාවේ පල්ලෙකැලේ පිහිටි 1 වන ශ්‍රී ලංකා රයිෆල් බලකා කඳවුරේ නිල සංචාරයකද නිරත විය.

එහිදී, එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්ආර් ජයසිංහ ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපති එම ඒකකයේ භටපිරිස් සමගින් සුහද අදහස් හුවමාරුවකද නිරතව ඔවුන්ගේ පරිපාලන කටයුතු පිළිබඳවද සොයාබැලීය. සිය සංචාරය තුළ එම කඳවුරු පරිශ්‍රයේම පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා 810 සංයුක්ත බලගණය වෙතින් දැනට ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් කටයුතු පිළිබඳවද හෙතෙම නිරීක්ෂණය කළේය.





# ගුවන් හමුදාධිපති හා යුද්ධ හමුදාධිපති අතර හමුවක්

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 19 වන ගුවන් හමුදාධිපති ලෙස රාජකාරි භාරගත් එයාර් මාර්ෂල් ආර්ඒයූපී රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී (තෙවරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (එම්ඕඑ) ඇමරිකා එක්සත් ජනපදය, එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්ඒඅයිඑස් සහ එස් (එක්සත් රාජධානිය), බීඑස්සී (ආරක්ෂක අධ්‍යයන), එම්අයිඑම් (ශ්‍රී ලංකා), ඒඑම්අයිඊ (ශ්‍රී ලංකා), ආර්සීඩීඑස්, පීඑස්සී වෙත ඉකුත් ජූලි 13 වන දින ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේදී හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාර පුදකරනු ලැබිය. අනතුරුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ නව ගුවන් හමුදාධිපති අතර සුහද හමුවක් ද පැවැත්විණි. මෙම හමුවේදී යුද්ධ හමුදාව සහ ගුවන් හමුදාව අතර පවතින සමීප සහයෝගීතාව මෙන්ම එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය මෙරටින් තුරන් කිරීම සඳහා දෙපාර්ශවය එකතුව සිදුකළ දායකත්වය පිළිබඳ සිහිපත් කෙරිණි. තවද, අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන කරුණු රැසක් පිළිබඳ එහිදී සාකච්ඡා කළ අතර, මෙම සුහද හමුව සනිටුහන් කිරීම වස් දෙදෙනා අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදුකෙරිණි.

# ගජබා රෙජිමේන්තු සේවා මුක්ත භටසංගමයේ ජ්‍යේෂ්ඨ සාමාජිකයකු යුද්ධ හමුදාධිපති හමුවෙයි



ගජබා රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමයේ ජ්‍යේෂ්ඨ සාමාජිකයකු හා හිටපු යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානියකු වන ලුතිනන් ජෙනරාල් ජගත් ඩයස් (විශ්‍රාමික) ඉකුත් ජූලි මස 13 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය.

වර්ෂ 2015 දෙසැම්බර් මස යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ගනු ලැබූ කීර්තිමත් නිලධාරියකු වන එතුමන් යුද්ධ හමුදාව වෙනුවෙන් කැපී පෙනෙන මෙහෙවරක් ඉටුකළ සංග්‍රාම නායකයකු ලෙසද ප්‍රසිද්ධියට පත්වූ අයෙකි.

එම සුහද හමුවේදී යුද්ධ හමුදාපති විසින් එතුමන්ගේ වසර 35 කට අධික දීර්ඝ සේවා කාලය තුළ විවිධ ධුරයන් දරමින් සිදුකරනු ලැබූ සේවය සිහිපත් කළේය.




# අලගල්ල සෝදිසි මෙහෙයුමට සහභාගී වූ විරුවන් වෙත යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්

අලගල්ල කඳුකරයේ සංචාරයක නිරතව සිටියදී අතුරුදහන්ව සිටි ඩෙන්මාර්ක් ජාතික කාන්තාව සෙවීමේ මෙහෙයුම සඳහා සහභාගී වූ 11 වන පාබල සේනාංකයට අයත් යුද්ධ හමුදා සාමාජිකයින් පස් දෙනකු ඉකුත් ජූලි මස 15 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූගේ ඇගයීමට ලක්විය.

එහිදී, යුද්ධ හමුදාධිපති විසින් එම මෙහෙයුම සිදුකරනු ලැබූ භටපිරිස් සමග එහිදී මුහුණ දුන් අභියෝග සම්බන්ධව අදහස් හුවමාරුකරගත් අතර, අනතුරුව එම කාර්යය ඇගයීමට ලක්කරමින් ඔවුන් වෙත යුද්ධ හමුදාධිපති ප්‍රශංසාත්මක ලාංඡන පිළිගැන්වීමටද කටයුතු කරන ලදී.

මහනුවර, අම්පිටිය ප්‍රදේශයේ පිහිටි ***'Kandy Backpackers Hostel'*** හි නවාතැන් ගෙන සිටි ඩෙන්මාර්ක් ජාතික කාර්බ් මන්ක් එබ්සෙන් (***Karb Munk Ebssen***) මෙනවිය යළි එම හෝටලය වෙත නොපැමිණි බව එම සංචාරක නවාතැන්පොළෙහි බලධාරීන් විසින් පසුගිය ජූලි මස 13 වන දින මහනුවර සංචාරක පොලිසිය මාර්ගයෙන් 11 වන පාබල සේනාංක මූලස්ථානයට දන්වා ඇත. අනතුරුව ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති සහ 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ උපදෙස් මත එම පාබල සේනාංකයේ භටපිරිස් කඩිනමින් සෝදිසි මෙහෙයුම ආරම්භ කළහ. එහිදී අතුරුදන් වූ කාන්තාවගේ සිරුර ඉකුත් ජූලි මස14 වන දින උදෑසන අලගල්ල කඳු පාමුල කැලෑ ප්‍රදේශයේ තිබියදී සොයාගනු ලැබීය.






# පොලීසියේ සහයට යුද්ධ හමුදාවෙන් සන්නද්ධ රථ

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව එක්සත් ජාතීන්ගේ ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ භටපිරිස් විසින් දේශීයව නිෂ්පාදනය කරන ලද සන්නද්ධ රථ 6 ක් පසුගියදා පොලිස් විශේෂ කාර්ය බලකාය වෙත භාරදෙන ලදී.

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මඟපෙන්වීම මත අවම පිරිවැයක් යටතේ එලෙස නිෂ්පාදනය කළ සන්නද්ධ පිරිස් ප්‍රවාහන රථ (Armoured Personnel Carriers) දෙකක් සහ පිරිස් විසුරුවා හැරීමේ පොලිස් රථ (Police Crowd Control Vehicles) හතරක් භාරදෙනු ලැබිය. මෙම රථ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 100 ක් වන අතර, රුපියල් මිලියන 66 ක පිරිවැයකින් එහි වැඩ කටයුතු අවසන් කිරීමට ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ භටපිරිස් සමත් වූ අතර, ඒ තුළින් රුපියල් මිලියන 34 ක මුදලක් මෙරටට ඉතිරිකර ගැනීමට හැකිවිය. ඉකුත් ජූලි මස 25 වන දින පැවති මෙම සන්නද්ධ රථ ප්‍රදානය කිරීමේ උත්සව අවස්ථාව සඳහා පොලිස්පති සීඩී වික්‍රමරත්න සහ විශේෂ කාර්ය බලකායේ සේනාවිධායක නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දරද සහභාගී වූහ.

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් සඳහා පිටත්ව යන විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන්ට අවශ්‍ය සන්නද්ධ රථයක් ආනයනය කිරීම සඳහා රුපියල් මිලියන් 200 ක් වැය කිරීමට සිදුවන අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් රුපියල් මිලියන 66 ක් වැය කර මෙම සියලුම රථ නිෂ්පාදනය කිරීම තුළින් මෙරටට විශාල මුදලක් ඉතිරිකර ගැනීමට හැකියාව ලැබීම විශේෂත්වයකි.





# හෙට දිනන දරුවන්ට දිරියක්

ඩිජිටල්කරණයත් සමඟ පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු පහසුකරලීම සඳහා සුහසාධන ව්‍යාපෘතියක් දියත් කරමින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු යුද්ධ හමුදා සහ සිවිල් සාමාජිකයින් 55 දෙනකුගේ දරුවන් සඳහා ටැබ් යන්ත්‍ර ප්‍රදානය කරන ලදී.



යුද්ධ හමුදා මූලස්ථානයේදී ඉකුත් ජූලි 27 වන දින පැවැති මෙම උත්සව අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.



යුද්ධ හමුදා සේවාවනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ අදහසකට අනුව, හිටපු යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක වන ඇමරිකා එක්සත් ජනපදයේ පදිංචි තනුජා ඩයස් මහත්මියගේ සම්බන්ධීකරණයෙන් "සමාජ සත්කාර පදනමේ" සාමාජිකාවක් වන මල්ෂිනි පෙරේරා මහත්මිය විසින් මෙම වැඩසටහන සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලදී.



# යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, සුබ මොහොතින් රාජකාරී අරඹයි



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දෙවන ජ්‍යෙෂ්ඨතම ධූරය වන මාණ්ඩලික ප්‍රධානී ලෙස මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්එස්ඩීඑස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ඉකුත් ජූලි මස 20 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී රාජකාරී භාරගත්තේය.

වර්ෂ 1987 මාර්තු මස 16 දින කෙඩට් නිලධාරී පාඨමාලා අංක - 27 යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳුණු එතුමන් දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය තුළින් මූලික යුද පුහුණුව හදාරා දෙවන ලුතිනන්වරයකු ලෙස ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට එක්ව තිබේ. එතැන් පටන් යුද්ධ හමුදාවේ විවිධ මට්ටම්වල තනතුරු රැසක් දරා ඇති එතුමන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ධූරයද හෙබවූයේය.

යුද්ධ හමුදාවේ 11 වන යුද්ධ හමුදාධිපති, ඒකාබද්ධ මෙහෙයුම් ආඥාපති හා ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ ජෙනරාල් හැමිල්ටන් වනසිංහ (විශ්‍රාමික) ගේ වැඩිමහල් පුත්‍රයා වන්නේද එතුමන්ය. හිටපු යුද්ධ හමුදාධිපතිවරයකුගේ පුතකු යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී තනතුර දක්වා උසස්වීම් ලැබූ පළමු අවස්ථාව මෙය වන අතර, සිය පියාණන්ද 19 වන යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී වශයෙන් රාජකාරී ඉටුකර තිබීම විශේෂත්වයකි.

සිය හමුදා දිවිය තුළ අණ හා මාණ්ඩලික සහ උපදේශක පත්වීම් රැසක් හොබවා සුවිශේෂී හැකියාවන් පිළිබිඹු කර ඇති නව මාණ්ඩලික ප්‍රධානී තිස් වසරකට අධික කාලයක් මෙරට පැවති ත්‍රස්තවාදයට එරෙහි සටනටද සුවිශේෂී දායකත්වයක් දැක්වූ දක්ෂ නිලධාරියෙකි. එතුමන්ගේ නව තනතුර වෙනුවෙන් "රණවිරුවා" ද ඉතසිතින් සුබපැතුම් එක්කරයි.

# යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී රාජකාරී අරඹයි



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් ජූලි 18 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී රාජකාරී භාරගත්තේය. වර්ෂ 1987 දී කෙඩට් නිලධාරියකු ලෙස යුද්ධ හමුදාවට බැඳුණු එතුමන් වර්ෂ 1988 දෙසැම්බර් මස 10 දින 2/ලුතිනන් නිලයේ අධිකාරියට පත්ව ශ්‍රී ලංකා යුද හමුදාවේ ගජබා රෙජිමේන්තුවට ඇතුළත්ව ඇත.

වත්මන් යුද්ධ හමුදාධිපති 4 ගජබා රෙජිමේන්තුවේ විධායක අධිකාරී ධූරය දැරූ කාලසීමාවේ එතුමන් එම ඒකකයේ කණ්ඩායම්භාර නිලධාරී ධූරය ද හොබවනු ලැබීය. වර්ෂ 2009 මැයි මාසයට පෙර පැවති මානුෂීය මෙහෙයුමේ අවසන් අදියර පැවති කාලසීමාවේදී එතුමන් 14 ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙසද කැපීපෙනෙන මෙහෙවරක් ඉටුකරනු ලැබීය.

මේ වනවිට වසර 35 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එතුමන් ඒකක මට්ටමේ විවිධ තනතුරු දරා ඇති රණකාමී නිලධාරියෙකි. යුද්ධ හමුදාවේ අනෙකුත් ජ්‍යේෂ්ඨ තනතුරු රැසකද වගකීම් ඉටුකොට ඇති එතුමන් නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ධූරයට පත්වීමට ප්‍රථම වන්නි ආරක්ෂක සේනා ආඥාපති ලෙසද සුවිශේෂී මෙහෙවරක් සිදුකළ ජ්‍යේෂ්ඨ නිලධාරියෙකි. එතුමන්ගේ නව තනතුරට "රණවිරුවාද" ඉතසිතින් සුබපැතුම් ගෙනඑයි.

# අභිනව ජ්‍යේෂ්ඨ නිලධාරී නේවාසිකාගාරය විවෘත කෙරේ



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථාන කඳවුරු පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ ජ්‍යේෂ්ඨ නිලධාරී නේවාසිකාගාරය සුබ මොහොතින් විවෘත කිරීම ඉකුත් ජූලි 17 වන දින එහි සේනාවිධායක මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සුරතින් සිදුකෙරිණ. මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීකේආර් සිල්වා කේඑස්පී ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන්, නිලධාරිනියන් මෙන්ම සෙසුනිල සාමාජිකයෝ රැසක් සහභාගී වූහ.



# ස්වේච්ඡා බලසේනාවේ නිලධාරී පුහුණු දිනය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා නිලධාරීන් වෙනුවෙන් සංවිධානය කළ "නිලධාරී සන්ධ්‍යා සුහද හමුව" *(Dinners Club)* ඉකුත් ජූලි 07 වන දින සේනාවිධායක මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් එම මූලස්ථාන කඳවුරේදී පැවැත්විණ. එහි ආරාධිත දේශක වශයෙන් ආචාර්ය දමිත් පල්ලෙවත්ත මහතා සහභාගී විය. එහිදී, "තරුණ පරම්පරාවේ සංස්කෘතික හා චර්යා වෙනස්වීම් කෙරෙහි ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයේ අහිසි බලපෑම සහ හමුදාව කෙරෙහි එය බලපාන ආකාරය" යන මාතෘකාව යටතේ ආචාර්ය දමිත් පල්ලෙවත්ත මහතා එහි දේශනය පැවැත්වීය. එම අවස්ථාවට ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් තුසිත සිල්වා කේඑස්පී ඇතුළු නිලධාරීන්, නිලධාරිනියන් රැසක් සහභාගී වූහ.







# යාපනය ආරක්ෂක සේනා ආඥාපති ගේ සංචාරයන්

ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී ඉකුත් ජුනි 13 සහ 15 යන දෙදිනෙහි 51 හා 52 වන පාබල සේනාංකයන්හි සංචාරය කළේය.

එහිදී, එම සේනාංකයන්හි ක්‍රියාන්විත කටයුතු හා පාලන අවශ්‍යතා සොයාබැලූ හෙතෙම සියලු නිලයින් අමතන්නටද අමතක නොකළේය. මෙම අවස්ථාවන් සඳහා සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීවරු ඇතුළු නිලධාරී සෙසුනිල රැසක් සහභාගී වූහ.

# යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයෙන් හිසට සෙවණක්



511 වන පාබල බලසේනා බලප්‍රදේශයේ ස්ථාපිත 15 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරී මේජර් ඒඩීඑස්ඩී අතුකෝරල ගේ අධීක්ෂණය යටතේ උරුම්පිරායි (දකුණ) ග්‍රාම නිලධාරී වසමේ පදිංචි සන්තිපා විමලකාසන් මහත්මිය වෙනුවෙන් ඉදිකළ නව නිවස ඉකුත් ජූලි 04 වන දින යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් ප්‍රදානය කෙරිණ. 15 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ හටපිරිස්හි ශ්‍රමදායකත්වය සහ තාක්ෂණික දැනුම උපයෝගී කරගනිමින් මෙම නිවස ඉදිකෙරිණ.



තවද, 553 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීඑස්කේ පෙරේරා ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ වත්තිරායන්, කඩ්ඩෛයිකාඩු පදිංචි එස් ජෙස්ලි ජයරාජ් මහත්මා වෙත නව නිවසක් ඉදිකොට භාරදීමද ඉකුත් ජූනි 18 වන දින සිදුකෙරිණ. ඊට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යාපනය ආරක්ෂක සේනා ආඥාපති සහභාගී වූ අතර, නිවස ඉදිකිරීම සඳහා 12 (ස්වේච්ඡා) විජයබාහු පාබල රෙජිමේන්තු හටපිරිස් ශ්‍රම දායකත්වය ලබාදුන්හ.

# වව්නියාව වෙළඳ සංගම් නව ගොඩනැගිල්ල විවෘත කෙරේ





වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් මත 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ජීපීඑම් කාරියවසම් ආර්එස්පී එන්ඩීසී පීඑස්සී අයිජී ගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ යුද්ධ හමුදා භටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් ඉදිකරන ලද වව්නියාවේ වෙළඳ සංගම් නව ගොඩනැගිල්ල ඉකුත් ජූලි 09 වන දිනට යෙදුණු සුබ මොහොතින් වන්නි ආරක්‍ෂක සේනා ආඥාපතිගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණ.

වව්නියාව වෙළඳ සංගමයේ සභාපති පන්මුගරාජා සුජේන් මහතාගේ ඉල්ලීම පරිදි ඉදිකළ මෙම ගොඩනැගිල්ල විවෘත කිරීමේ අවස්ථාවට උතුරු පළාත් ප්‍රධාන ලේකම් බන්දුල සමරසිංහ මහත්මා, 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, වව්නියාව දිස්ත්‍රික්ක ලේකම්, ඉස්ලාම් හින්දු හා කතෝලික පූජකවරු ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

# බළඇණි පුහුණුවීම් සමාප්තිය සනිටුහන් කරමින්







ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ පාලනය වන 11 ගැමුණුහේවා බළඇණියේ බළඇණි පුහුණුවීම් කල්‍යාණිපුර බළඇණි පුහුණු පාසලේදී ඉකුත් ජූනි 20 වන දින අවසන් කෙරිණ. නිලධාරීන් 10 දෙනකුගෙන් සහ සෙසුනිලයින් 301 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවති මෙම පුහුණු පාඨමාලාවේ සමාප්තිය වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. 62 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 621 සහ 622 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු, ප්‍රධාන උපදේශක, නිලධාරීන් සහ සෙසුනිලයින් ද එම අවස්ථාවට සහභාගී වූහ.

# නැගෙනහිර ආඥාපතිගේ සුරතින් "සංඝාවාසයක්" පූජා කෙරේ

සිංහපුර ශ්‍රී ගැමුණු විහාරයේ අභිනවයෙන් ඉදිකරන ලද "සංඝාවාසය" නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ සුරතින් ඉකුත් ජූලි 02 වන දින එහි විහාරාධිපති දික්ඇල්ලේ ඥානප්‍රදීපාලංකාර නායක ස්වාමීන් වහන්සේ වෙත භාරදෙන ලදී.





රාජකීය විද්‍යාලයීය ආදිශිෂ්‍ය චින්තක අබේසේකර මහතා සහ විශාඛා විද්‍යාලයීය ආදිශිෂ්‍ය තේජා කපුරුගේ මහත්මියගේ මූල්‍ය දායකත්වයෙන් සහ ප්‍රසාද් ලොකුබාලසූරිය මහතාගේ සම්බන්ධීකරණයෙන් මෙම සංඝාවාසය ඉදිකිරීම සිදු විය. 233 වන බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඒකේසීඑස් ද සිල්වා ආර්එස්පී සහ 9 වන ක්ෂේත්‍ර ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්අයිඑස් චන්ද්‍රකුමාර යූඑස්පී පීඑස්සී අයිජී ගේ අධීක්ෂණය යටතේ සිදුකළ එහි ඉදිකිරීම් කටයුතු සඳහා 9 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා භටපිරිස් ශ්‍රමදායකත්වය ලබාදුන්හ.

මෙම අවස්ථාව සඳහා 233 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, 9 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# පන්සල්ගල අභිනවාරාම ස්තූපයේ කොත් වහන්සේ නිරාවරණය කෙරේ.

අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල උප සංඝනායක, අම්පිටියේ සුමනරතන නාහිමි සහ දායක සහා සාමාජිකයින්ගේ ආරාධනයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කෙවිලියාමඩුව පන්සල්ගල අභිනවාරාම විහාරස්ථානයේ ඉදිකළ "කොත් වහන්සේ" නිරාවරණය කිරීම පසුගිය ජූලි 02 වන දින නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ සුරතින් සිදුවිය.



මෙම ස්තූපය ඉදිකිරීමේ කටයුතු සඳහා මහඔය සිවිල් ආරක්ෂක බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩීඑල්වයිඑ ලක්පුර ගේ අධීක්ෂණයෙන් එහි භටපිරිස් සහ අභිනවාරාම විහාරස්ථානයේ දායක සභාව දායක වූහ. විශ්‍රාමලත් විදුහල්පතිනි ගුණවතී පෙරේරා මහත්මිය සහ එක්සත් රාජධානියේ පදිංචි බණ්ඩාරනායක මහතා සහ එම මහත්මියද රසික ලක්මාල් සහ පුෂ්පා හෙට්ටිආරච්චි මහත්ම මහත්මීන් ඇතුළු දෙස් විදෙස් පරිත්‍යාගශීලීන් මෙම "චෛතිය ආනන්ද ස්තූපය" ඉදිකිරීම සඳහා අත්වැල් බැඳගත්හ. මෙම අවස්ථාවට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් රන්ජන් ළමාහේවා මෙන්ම 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු නිලධාරීන් සෙසු නිලයින් රැසක් සහභාගී වූහ.



# "අත හිත - 2023" ප්‍රජාසත්කාර වැඩසටහන







උතුරු පළාතේ මුලතිව් අධ්‍යාපන කලාපයේ මුහුදුබඩපත්තු අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටා ඇති මු/තන්නිපුරිප්පු ප්‍රාථමික විද්‍යාලයෙහි සහ මු/උන්නාපිලව් ප්‍රාථමික විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සිසු දරු දැරියන් 110 දෙනකු හට රුපියල් 3,000.00 ක පමණ වටිනා අභ්‍යාස පොත් කට්ටල ප්‍රදානය කිරීමේ උත්සවයක් පසුගිය ජූලි 04 වන දින පැවැත්විණ. "අත හිත" සංවිධානයේ 2023 හත්වන අදියරේ දෙවන වැඩසටහන ලෙස ප්‍රසාද් ලොකුබාලසූරිය ගේ සංවිධායකත්වයෙන් පැවති එම කටයුත්තට රාජකීය විද්‍යාලයේ ආදිශිෂ්‍ය මිතුරු කැල සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය ආදි විද්‍යාර්ථි මිතුරු කැල මූල්‍ය දායකත්වය සැපයූහ.

මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මෙන්ම යුද්ධ හමුදා ඉංජිනේරු බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී එන්ඩියූ ගේ අදහසකට අනුව 592 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්ඩීපීසී ආරච්චිගේ ගේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ මෙම උත්සවය සිදුකෙරිණ.



# රණවිරු සවියෙන් හිසට සෙවණක්

අඩු ආදායම්ලාභී පවුලක් වෙත නවතමයෙන් ඉදිකරන ලද අංග සම්පූර්ණ නිවසක් භාරදීම පසුගිය ජූලි 29 වන දින මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ ගේ සුරතින් සිදුකෙරිණි.

68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ අදහසකට අනුව ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය රුපියල් මිලියන 1.5 ක් වැයදරා ඇත. 681 වන පාබල බලසේනාවට අයත් 6 වන බලඇණිය ගැමුණු හේවා බලකාය විසින් එහි ඉදිකිරීම් කටයුතු මාස දෙකක් ඇතුළත අවසන් කිරීම විශේෂත්වයකි. එමෙන්ම, එම නිවස සඳහා අවශ්‍ය උපකරණ පරිත්‍යාග කිරීමක්ද සිදුකෙරිණ.





# බලකාධිපති රෙජිමේන්තුවේ සංචාරයක





ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් ජූනි 08 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ 16 වන බලකාධිපති ලෙස වැඩ භාරගත්තේය. හෙතෙම පසුගිය ජූනි 21 දින සහ ජූලි 04 වන දින පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා මූලස්ථානයෙහි සංචාරයක නිරත විය.

මෙම සංචාරය අතරතුර ආඥාපති විසින් එම රෙජිමේන්තුවේ සොල්දාදුවන් අතර, විනය සහ වෘත්තීය භාවයේ වැදගත්කම පෙන්වා දෙන ලදී. එසේම, යුද හමුදාවේ සාරධර්ම සහ සම්ප්‍රදායන් ආරක්ෂා කරමින් උසස්ම චර්යා ප්‍රමිතීන් පිළිපැදීමේ අවශ්‍යතාව පිළිබඳවද අවධාරණය කළ හෙතෙම එම මූලස්ථානයේ යටිතල පහසුකම් පුළුල් කිරීම පිළිබඳව ද සාකච්ඡා කළේය.

# අසරණ පවුලක් වෙත නව නිවසක්





රඹුක්කන, ඊරියගොඩ ග්‍රාම නිලධාරී වසමේ පදිංචි නිදරු මවක් වන කේ.ජී නිලිමිණි දිල්රුක්ෂි මහත්මියගේ අසරණ පවුල වෙනුවෙන් ඉදිකළ නව නිවස භාරදීම ඉකුත් ජූලි 06 වැනි දින සිදුකෙරිණ.

611 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කෑගල්ල මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සමඟ එක්ව නිවස ඉදිකිරීමට අවශ්‍ය මුදල් හා අමුද්‍රව්‍ය ලබා දුන් අතර, 8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 8 වන ගැමුණු හේවා බලකායේ සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වය මෙම නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා හිමිවූහ.

මහජන බැංකුවේ 62 වැනි සංවත්සරයට සමගාමීව සිදුකළ මෙම මානුෂීය කටයුත්ත සඳහා බටහිර ආරක්ෂක සේනා ආඥාපති, 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 611 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, ඒකක අණදෙන නිලධාරීන් සහ කෑගල්ල මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# මධ්‍යම ආරක්‍ෂක සේනා ආඥාපති යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සංචාරයක



මධ්‍යම ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියන්ගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩියූ පීඑස්සී පසුගිය ජූලි 15 වන දින දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සංචාරයක නිරතවිය. එහිදී, විද්‍යාපීඨයේ සේනාවිධායක විසින් ආඥාපති උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව එතුමන් වෙත කඳවුරු සම්මාන මුරයක්ද පිරිනමන ලදී. සිය සංචාරයේදී ආඥාපති එහි පුහුණුව ලබන කැඩෙට් නිලධාරීන් සමඟ පිළිසඳරකද නිරත වූයේය.





## සංචාරයක මතක සටහන්





හකාස අණසක මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී විසින් ඉකුත් ජූලි 24 වන දින යුද්ධ හමුදා යුධෝපකරණ කර්මාන්ත ශාලාව, මධ්‍යම අවි පතුරොම් ගබඩාව සහ යුද්ධ හමුදා රෙදිපිළි ගබඩාවෙහි සංචාරයක නිරතවිය. එහිදී, එම අංශවල කටයුතු නිරීක්‍ෂණය කළ හෙතෙම එහි හටපිරිස්වල අවශ්‍යතා පිළිබඳවද සොයාබලමින් ඔවුන් හා කතාබහ කරන්නටද අමතක නොකළේය.

# රෙජිමේන්තු අධිපති නිරීක්ෂණ සංචාරයක





යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ පහළොස්වන රෙජිමේන්තු අධිපති ලෙස අභිනවයෙන් පත්වූ මේජර් ජෙනරාල් එච්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී පසුගියදා එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ හා ඒ යටතේ ඇති යාන්ත්‍රික පාබල පුහුණු මධ්‍යස්ථානය, 1 හා 2 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවල සංචාරයක නිරතවිය. එහිදී එම ස්ථානවල විවෘත කිරීම් කිහිපයකටද එක්වූ හෙතෙම එම පුහුණු පාසලේ හා ඒකකවල හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.

## 9 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ 15 වන සංවත්සරය





9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ 15 වන සංවත්සරය ඉකුත් ජූලි 15 වන දින ඒකක අණදෙන නිලධාරී ගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු පරිශ්‍රයේදී අභිමානවත් ලෙස පැවැත්විණ.

මෙම සංවත්සරයට සමගාමීව අණදෙන නිලධාරී ඇතුළු සියලුම නිලයින් විසින් ධජ ආශිර්වාද කිරීමේ උත්සවයක්ද ඉකුත් ජූලි 11 සහ 12 යන දෙදින තුළ යාබද විහාරස්ථානයේදී සහ කනකාම්බිකෙයි කුලම් කෝවිලේදී පවත්වන ලදී. තවද සංවත්සර දිනයේදී අණදෙන නිලධාරී වෙත කඳවුරු මුරයේ ගෞරවාචාරයද පුදකරන ලද අතර, අනතුරුව හෙතෙම සියලුම නිලයන් සමග දිවා භෝජන සංග්‍රහයකටද සහභාගී විය. මෙම උත්සව අවස්ථාවට ශ්‍රී ලංකා සංඥා බලකායේ ප්‍රධාන සංඥා නිලධාරී සහ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එස් රත්නායක එන්ඩියූ ද එක්විය.

## 56 වන පාබල සේනාංක නිලධාරී පුහුණු දිනය

56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ජීපීඑම් කාරියවසම් ආර්එස්පී එන්ඩීසී පීඑස්සී අයිජී ගේ මගපෙන්වීමෙන් 561 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්ජී බණ්ඩාරනායක යූඑස්පී පීඑස්සී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සංවිධානය කරනු ලැබූ "නිලධාරී සන්ධ්‍යා සුහද හමුව" *(Dinners Club)* ඉකුත් ජූනි 27 වන දින පැවැත්විණ.

එහිදී, රජරට විශ්වවිද්‍යාලයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී වෛද්‍ය ඩිලානි කසුන්දරා හෙට්ටිආරච්චි මහත්මිය විසින් "Keeping Healthy Work Life Balance"යන මාතෘකාව යටතේ දේශනය සිදුකළාය. බලප්‍රදේශයේ රාජකාරී නියුතු නිලධාරීන් අතර සුහදත්වය හා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් 56 වන පාබල සේනාංක දේශන ශාලාවේදී පැවති මෙම වැඩසටහනට එම සේනාංකය යටතේ පාලනය වන බලසේනා, ඒකකවලට අයත් නිලධාරීන්, නිලධාරිනියන් රැසක් සහභාගී වූහ.





# සිසු සිසුවියන් වෙනුවෙන් නායකත්ව වැඩමුළුවක්



කෑගල්ල උඩමකඩවර කනිෂ්ඨ විද්‍යාලයේ ශිෂ්‍ය නායක නායිකාවන් ඇතුළු සිසු සිසුවියන් 50 දෙනකු වෙනුවෙන් සංවිධානය කෙරුණු නායකත්ව පුහුණු වැඩටහනක් ඉකුත් ජූලි 01 වන දින එම පාසල් පරිශ්‍රයේදී පැවැත්විණ. දේශන, ගෘහස්ථ හා එළිමහන් අභ්‍යාස සහ ආදර්ශ සමගින් මෙම වැඩසටහන 611 වන පාබල බලසේනා බලප්‍රදේශයේ පිහිටි 8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 61 වන පාබල සේනාංකයේ භටපිරිස් විසින් පවත්වනු ලැබූහ.

පාසල් බලධාරීන්ගේ ඉල්ලීම පරිදි 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මගපෙන්වීමෙන් ක්‍රියාත්මක කරනු ලැබූ මෙම වැඩසටහනේ අධීක්ෂණ කටයුතු 611 වන පාබල බලසේනාවේ බලසේනාධිපති සහ 8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී විසින් සිදුකරනු ලැබූහ.

# 23 වන පාබල සේනාංක මූලස්ථානයේ 26 වන සංවත්සරය



23 වන පාබල සේනාංකයේ 26 වන සංවත්සරය ඉකුත් ජූලි මස 23 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු වැඩසටහන් එහි සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සීගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

ඒ අනුව ඉකුත් ජූලි 20 වන දින මඩකලපුව කල්කුඩා හි කිරිමිච්චෝලෙයි දෙමළ මිශ්‍ර පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත දිවා ආහාරය ලබාදී පාසල් උපකරණ බෙදාදීම , 23 වන සේනාංක චෛත්‍ය රාජයාණන් වහන්සේ අභියස එම සේනාංකයේ රාජකාරී කර මියගිය රණවිරුවන් වෙනුවෙන් සෙත් පතා බෝධිපූජා පිංකමක් පැවැත්වීම, සේනාංකාධිපති වෙත කඳවුරු මුරයක් පිරිනැමීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය සහ සේනාංකාධිපති විසින් එහි භටපිරිස් ඇමතීම ප්‍රධාන විය.



# සංඥා බළකාධිපතිගේ 1 වන සංඥා බලකා සංචාරය





ශ්‍රී ලංකා යුද හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩියූ පසුගිය ජූලි මස 15 වන දින 1 වන සංඥා බලකාය මුලතිව් හි සංචාරයක නිරත විය. සිය සංචාරය තුළ බලකාධිපති විසින් ඒකකයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජකාරීන් පිළිබඳව අධීක්ෂණය කළ අතර, භටපිරිස් ඇමතීමක්ද සිදුකරන ලදී.

# වෛද්‍ය සායනයක් හා පාසල් පොත් බෙදාදීමේ වැඩසටහනක්





වාකරේ මහා විද්‍යාලයේ ළමුන් 150ක් සඳහා රුපියල් 200,000.00 ක් වටිනා පාසල් පොත් බෙදාදීමේ වැඩසටහනක් හා ප්‍රදේශයේ සිවිල් වැසියන් වෙනුවෙන් සංවිධානය කළ වෛද්‍ය සායනයක් ඉකුත් ජූලි 09 වන දින පැවැත්විණි. 233 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඒකේසීඑස් ද සිල්වා ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් යුතුව එම බලසේනාවේ සාමාජිකයින් සමඟ කැළණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ජානක රාමනායක, වෛද්‍ය දිනුෂා පෙරේරා යන මහත්ම මහත්මීන් හා විද්‍යා පීඨයේ පවුල් වෛද්‍ය දෙපාර්තමේන්තුවට අයත් වෛද්‍ය කාර්ය මණ්ඩලයේ දායකත්වයෙන් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

මෙම වෛද්‍ය සායනය සඳහා අක්ෂි ශ්‍රවණ හා කර්න අංශයන්ද, ශරීර ස්කන්ද පරීක්ෂාව, අධි රුධිර පීඩන පරීක්ෂාව හා රුධිර ගත සීනි පරීක්ෂාවක්ද ඇතුළත් වූ අතර, එහිදී රුපියල් 250,000.00 ක් වටිනා ඖෂධ සහ ඇස් කණ්ණාඩිද බෙදාදෙන ලදී. තවද, දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා වෛද්‍ය ප්‍රදර්ශනයක්ද මීට සමගාමීව පවත්වන ලද අතර, ඒ සඳහා පාසල් සිසුහු 150 ක් හා සිවිල් වැසියෝ 300 ක් පමණ සහභාගී වූහ. මෙම උත්සව අවස්ථාව සඳහා 233 වන පාබල බලසේනාවේ හිටපු බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්ඩබ්ලිව්කේ හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, 233 වන පාබල බලසේනාවේ වත්මන් බලසේනාධිපති ඒකේසීඑස් ද සිල්වා ආර්එස්පී, 9 ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුවේ සහ 6 ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීහු සහ සෙසුනිලයෝ රැසක් සහභාගී වූහ.

# උතුම් ව්‍යාපෘතියකට දායක වෙමින්



කුරුණෑගල මහ රෝහලේදී පිළිකා රෝගීන් ඇතුළු නේවාසික රෝගීන්ට තැඹිලි පානය ලබා දීමේ උතුම් වැඩසටහනක් 143 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ මඟපෙන්වීම යටතේ පසුගිය ජූනි 17 වන දින සිදුකෙරිණ. 1 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සාමාජිකයෝ කුරුණෑගල මහ රෝහලේ කාර්ය මණ්ඩලය සමඟ සහයෝගයෙන් යුතුව මෙම වැඩසටහන පැවැත්වූහ.

# බටහිර ආරක්ෂක සේනා භටපිරිස් අතින් පුණ්‍ය කටයුත්තක්

බටහිර ආරක්ෂක සේනා ආඥාපති ගේ උපදෙස් මත එහි භටපිරිස් "අධි ඇසළ පොහොය" දිනයට සමගාමීව මාවතගම විද්‍යාලයීය ක්‍රීඩාංගණයේදී බත් දන්සැලක් පවත්වනු ලැබූහ. එහිදී, "මාවතගම තරුණ කැළ" විසින් 'K.D Construction Pvt. Ltd' පුද්ගලික සමාගමේ අනුග්‍රාහකත්වයද ඇතිව එම දන්සැලෙහි අතුරුපස ලෙස අයිස්ක්‍රීම් ලබාදීමටද කටයුතු කරන ලදී.



# අභිනවයෙන් ඉදිකළ නව නිලධාරී නිවස්නය විවෘත කෙරේ





ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශුසම්පත් බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි නව නිලධාරී නිවස්නය විවෘත කිරීම අධ්‍යක්‍ෂක ජෙනරාල් මූල්‍ය කළමනාකරණ සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී වීඑස්වී යූඑස්පී ගේ සුරතින් පසුගිය ජූලි 21 වන දින සිදුකෙරිණ. මේ සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීවරු සහ නිලධාරිනියන් රැසක් සහභාගී වූහ.

# නවීකරණය කරන ලද සුහසාධන පහසුකම් සෙසුනිල අයිතියට පත්කෙරේ

යුද්ධ හමුදා පුහුණු පාසල මාදුරුඔය නිත්‍ය කාර්ය මණ්ඩලයේ සහ පාඨමාලාවන් හැදෑරීම සඳහා රපෝර්තු කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සුභසාධනය උදෙසා භාවිතා කරන ලද වෙන් වෙන්ව පැවති ජන අවන්හල, පොත්හල, කරණවෑම් හල සහ මැහුම්හල වායු සමීකරණය කර නවීකණය කිරීමෙන් අනතුරුව විවෘත කිරීම එම පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් කේඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි 08 වන දින සිදුකෙරිණ.



# විශිෂ්ට ජයග්‍රහණය වෙනුවෙන් උපහාර පිදේ



මඩකලපුව කල්ලඩි ප්‍රදේශයේ පදිංචි 20 හැවිරිදි තරුණයකු වන තවේන්ද්‍රන් මධුෂිගන් මහතා ඉකුත් මැයි 05 වන දින ඉන්දියාවේ ධනුෂ්කොඩි සිට ශ්‍රී ලංකාවේ තලෙයිමන්නාරම දක්වා පිහිනා ගොස් පැමිණි 4 වැනි පුද්ගලයා ලෙස වාර්තාවක් තැබීය. ඔහු එම දුර පිහිනීමට පැය 12 විනාඩි 58 ක් ගත කළේය. එබැවින් ඔහුට උපහාර දැක්වීම සඳහා 231 වන පාබල බලසේනාව විසින් උපහාර උළෙලක් සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, මඩකලපුව දිස්ත්‍රික් ලේකම්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ, ශාන්ත මයිකල් විද්‍යාලයේ විදුහල්පති, මඩකලපුව බාලදක්‍ෂ සංගමයේ සිද්ත්‍රික් කොමසාරිස් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

තවද, මෙහිදී 231 වන පාබල බලසේනාධිපති විසින් ඔහුගේ දස්කම් අගයනු වස් සමරු තිළිණයක් සහ මඩකලපුව *MJF* සිංහ සමාජය විසින් මුදල් ත්‍යාගයක්ද පිරිනමන ලදී.

# මිහිඳුසෙත් මැදුර සුවසහන නිකේතනයට පරිත්‍යාග රැසක්





කොළඹ ආනන්ද විද්‍යාලයීය 90 වන කණ්ඩායම් සාමාජිකයින් පිරිසක් ඉකුත් ජූලි 04 වන දින අත්තිඩියේ පිහිටි මිහිඳුසෙත් මැදුර සුවසහන නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන පුනරුත්ථාපනලාභීන්ගේ සුවදුක් විමසා බැලීම සඳහා එක්වූහ. එහිදී, එම විරුවන් හට තේපැන් සංග්‍රහයක් පිරිනමා දේශීය ආයුර්වේද ප්‍රතිකාර සඳහා ස්ථාපිත ගොඩනැගිල්ලෙහි නවීකරණ කටයුතු වෙනුවෙන් ද්‍රව්‍යමය ආධාර ලබාදීමටත්, රූපවාහිනී යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමටත් ක්‍රියාකරන ලදී. එම අවස්ථාවට එම නිකේතනයේ සේනාවිධායක ඇතුළු එම කාර්ය මණ්ඩලයේ පිරිසක්ද එක්වූහ.

# 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ හටපිරිස් ලේ දන්දෙති



223 වන පාබල බලසේනාවට අයත් 6 ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ හටපිරිස්වල සහභාගීත්වයෙන් ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 04 වන දින ත්‍රිකුණාමලය මොරවැව රෝහලේදී පැවැත්විණ. රුධිර බැංකු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද මෙම ලේ පරිත්‍යාග කිරීමේ වැඩසටහනේ



ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් පීඩබ්ලිව්එන්පීඩබ්ලිව්බීඑස්යූබී පිළිමතලාව පීඑස්සී සහභාගී විය. 6 ශ්‍රීලසසබ (ආධාරක) බලකායේ නිලධාරී සෙසුනිලයින් 55 දෙනකු එහිදී සිය රුධිරය පරිත්‍යාග කළහ.

# මොග්ගල්ලාන චෛත්‍ය රාජයාණන් පොදු ජනතාවගේ වන්දනාමානයට



2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා අණදෙන නිලධාරීගේ පූර්ණ මඟපෙන්වීම යටතේ එම රෙජිමේන්තු නිලධාරී සෙසුනිලයින් විසින් එම ඒකක කඳවුරු භූමිය ඉදිරිපිට ගිරිතලේ වැව් තාවුල්ල මත අභිනවයෙන් ඉදිකරන ලද මොග්ගල්ලාන මහා චෛත්‍යරාජයාණන් වහන්සේ පසුගියදා පොදු ජනතාවගේ වන්දනාමානයට පාත්‍ර කරමින් නිරාවරණය කෙරිණ. එවකට මෙම රෙජිමේන්තු බලකාධිපති ධූරය දැරූ මේජර් ජෙනරාල් ඒඑල් ඉලංගකෝන් ද එම අවස්ථාවට එක්විය.



# වෘත්තීය පුහුණු පාඨමාලා රැසක් සාර්ථකව නිමවේ



පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන රණවිරු සම්පත් කේන්ද්‍රය මඟින් ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය සමඟ අනුබද්ධිතව 2023 පළමු අඩවසරට අදාලව පවත්වන ලද පාඨමාලා රැසක් අවසන සහතිකපත් බෙදාදීම ඉකුත් ජූනි 28 වන දින රණවිරු සම්පත් කේන්ද්‍රයේදී පැවැත්විණ. මේ යටතේ පරිගණක දෘඩාංග ශිල්පී, උද්‍යාන අලංකරණ ශිල්පී, ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී සහ යතුරුපැදි කාර්මික ශිල්පී යන වෘත්තිය පුහුණු පාඨමාලාවන්හි න්‍යායික පුහුණුව හැදෑරූ අයවලුන් වෙත සහතිකපත් බෙදාදෙනු ලැබීය. මෙම අවස්ථාව සඳහා පුනරුත්ථාපන අධ්‍යක්ෂ, රණවිරු සම්පත් කේන්ද්‍රයේ සේනාවිධායක, අධ්‍යක්ෂ හා එම අධ්‍යක්ෂ මණ්ලයේ කාර්ය මණ්ඩල සාමාජිකයෝද සහභාගී වූහ.





## කාලීන දේශනයක්

10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව තුළ රාජකාරි නියුතු නිලධාරීන්, සෙසුනිලයින් හා 12 ගරේ ඒකකයට අයත් සෙනීන්ගේ සහභාගීත්වයෙන් ඉකුත් ජූනි මස 18 වන දින දේශනයක් පැවැත්විණ. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා ආගමික පසුබිම් මැයෙන් වූ එම දේශනය 10 ශ්‍රීලංජාආබමු ඒකක අණදෙන නිලධාරී මේජර් අයිජීආර් ධම්මික විසින් පවත්වන ලදී.

## 16 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 15 වන සංවත්සරය





වව්නියාව දිස්ත්‍රික්කයෙහි කනගරායකුලම්, කරප්පුකුට්ටි ප්‍රදේශය තුළ ස්ථාපිත 16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවෙහි 15 වන සංවත්සරය පසුගිය ජූලි 01 වන දිනට යෙදී තිබිණ. ඒ වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් කේආර් පෙරේරා ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් මාලාවක් සංවිධානය කෙරුණු අතර, එහිදී, අණදෙන නිලධාරී වෙත කඳවුරු මුරයක් පිරිනැමීම, සියලු හටපිරිස් ඇමතීම මෙන්ම සියලු නිල දිවාභෝජන සංග්‍රහය ප්‍රධාන විය. තවද, අනුරාධපුර ශික්ෂණ රෝහලෙහි ලේ බැංකුව හා සම්බන්ධතාවයෙන් ඒකකයේ සියලුම නිලධාරීන් සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වූ ලේ දන්දීමේ වැඩසටහනක්ද සංවත්සර වැඩසටහන් අතර කැපී පෙනුණි.

# ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාව - අංක 66





යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත යුද්ධ හමුදාවේ සාමාන්‍ය සෙබළ, ලාන්ස් කෝප්‍රල් සහ කෝප්‍රල් නිලයේ අයවලුන්ගේ උපදේශන හැකියාව වර්ධනය කිරීම සඳහා සටන් පුහුණු පාසල - අම්පාර වෙතින් ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාව - අංක 66 ඉකුත් ජූනි 05 වන දින ආරම්භ කර ඉකුත් ජූලි 01 වන දින අවසන් කරන ලදී. මෙම පාඨමාලාව සඳහා යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු වෙතින් සහ පුහුණු පාසල් වෙතින් සිසු සිසුවියන් 144 දෙනකු සහභාගී වූ අතර, පාඨමාලාවේ සමාප්තිය සනිටුහන් කරමින් අවසන් දේශනය එම පුහුණු පාසලේ වැඩබලන සේනාවිධායක කර්නල් එම්කේජ්ඩී චන්ද්‍රලාල් විසින් සිදුකරන ලදී. එහිදී, විශිෂ්ට සාමාර්ථ ලබාගෙන පාඨමාලාවේ ප්‍රථම ස්ථානය දිනාගැනීමට සෙ/387520 රසෙ සේනාරත්න එච්එම්එම්එල්කේ සමත්විය.

# ඇස් කණ්ණාඩි පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්

ජෝර්ජ් ගුණරත්න ඔප්ටිකල් ආයතනයේ සහාය ඇතිව ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ වෙසෙන ඇස් පෙනීම දුර්වල දිළිඳු ජනතාව වෙත නොමිලේ ඇස් පරීක්‍ෂා කර රුපියල් 360000.00 ක පමණ මූල්‍ය වටිනාකමකින් යුත් ඇස් කණ්ණාඩි 200 ක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 02 වන දින ඔඩ්ඩුසුඩාන් ජාතික පාසල් ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. යුද්ධ හමුදාවේ සහ සිවිල් ජනතාව අතර සංහිඳියාව වර්ධනය කිරීම හා ඔවුන්ගේ ජීවිත නගාසිටුවීමේ අරමුණින් 64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩීඩබ්ලිව්කේඑන් ඊරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් මෙම වැඩසටහන පවත්වනු ලැබීය. එම අවස්ථාවට ජෝර්ජ් ගුණරත්න ඔප්ටිකල් ආයතනයේ කළමනාකාර අධ්‍යක්‍ෂක ලක්‍ෂමන් අබේගුණරත්න මහතා ඇතුළු එහි කාර්ය මණ්ඩලය හා 64 වන පාබල සේනාංකයේ භටපිරිස් සහභාගී වූහ.






# පාසල් උපකරණ පරිත්‍යාගයක්



122 වන පාබල බලසේනා බලප්‍රදේශයට අයත් හ/කාවන්තිස්සපුර මහා විද්‍යාලයෙහි ඉගෙනුම ලබන පාසල් ළමුන් 315 දෙනකු සඳහා දිවා ආහාර වේලක් ලබාදීමේ වැඩසටහනක් 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ 33 වන බළඇණි සංවත්සරයට සමගාමීව ඉකුත් ජූලි 07 වන දින එම පාසල් පරිශ්‍රය තුළදී පැවැත්විණ. 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීපීජ් පෙරේරා එච්ඩීඑම්සී පීඑස්සී ගේ මගපෙන්වීම යටතේ, ගංගා කුමාරි පත්මබේරිය යන මහත්මියගේ ධන පරිත්‍යාගයෙන් යුතුව සිදුකළ මෙම වැඩසටහන සඳහා එම සේනාංකයේ සේනාංකාධිපති ඇතුලු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# ගර්භනී මව්වරුන්ට සත්කාරයක්

යුද්ධ හමුදා මූලස්ථානයට අයත් ශාඛා, අංශ, ආයතනයන්හි සේවයේ නියතු ගර්භනී තත්වයේ පසුවන නිලධාරිනියන් හා සෙබළියන් 50 දෙනකු හට දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමීමේ සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ජූලි මස 12 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිණි ජානකී ලියනගේ මහත්මිය ප්‍රධානත්වය දැරූ මෙම වැඩසටහන එම ඒකකයේ 39 වන සංවත්සරයට සමගාමීව පැවැත්විණ.







# සේවා බලකායේ යෝගට් නිෂ්පාදනාගාරය විවෘත කෙරේ





8 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය යටතේ දියතලාව ප්‍රදේශයේ නවතමයෙන් ස්ථාපිත කරන ලද යෝගට් නිෂ්පාදනාගාරය ඉකුත් ජූලි 02 වන දින විවෘත කෙරිණ.

එම අවස්ථාවට යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වාසනා වනිගසේකර මහත්මියගේ ආරාධනයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය. මෙම අවස්ථාවට යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ආර්ඩබ්ලිව්ඩබ්ලිව්එච්ජේබී වනිගසේකර යූඑස්පී ද එක්විය.

# පාබල හමුදා සේවා වනිතා සභාපතිනිය රාජකාරී අරඹමින්



පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ 12 වන සභාපතිනිය වශයෙන් උත්පලා හෙට්ටිආරච්චි මහත්මිය ඉකුත් ජූලි 16 වන දින රාජකාරී ආරම්භ කරනු ලැබුවාය. එම සේවා වනිතා ශාඛාව වෙතින් සිදුකළ රණවිරු සුබසාධන වැඩසටහන්වලදී තම දායකත්වය හා උපදේශකත්වය ලබාදෙමින් සේවා වනිතා ශාඛාවේ ජ්‍යේෂ්ඨ සාමාජිකාවක් ලෙස සිය කාර්යභාරය මැනවින් ඉටුකළ සභාපතිනිය ලෙස වැඩභාරගැනීමෙන් පසු ඉදිරියේදී සිදුකිරීමට නියමිත රණවිරු සුබසාධන කටයුතු සිදුකළ යුතු ආකාරය පිළිබඳ සාමාජිකාවක් සමඟ සැලසුම් කරන ලදී.

# පුනරුත්ථාපන ලාභීන්ගේ සුවදුක් විමසමින්





මිහිඳුසෙත් මැදුර සුවසහන නිකේතනයේ රණක්ෂිතයට පත් පුනරුත්ථාපන ලාභීන්ගේ සුවදුක් විමසීම සඳහා ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ඇතුළු සාමාජිකාවෝ ඉකුත් ජූලි 05 වන දින සංචාරයක නිරතවූහ. එහිදී, ඔවුන් හට කෙටි ආහාර වේලක් සමගින් තේ පැන් සංග්‍රහයක් පිළිගැන්වීමටත්, ආයුර්වේද ගොඩනැගිල්ලෙහි නවීකරණ කටයුතු සඳහා සිමෙන්ති ඇතුළු ද්‍රව්‍යමය ආධාර ලබාදීමටත්, රණක්ෂිත රණවිරුවන් හට ත්‍යාග වවුචර් පත් සහ හදිසි විදුලි බිඳ වැටීමකදී භාවිතා කිරීමට Emergeny Light පරිත්‍යාග කිරීමටත් කටයුතු කෙරිණ.

# උසස් අධ්‍යාපනයට අත්වැලක්





කමාන්ඩෝ රෙජිමේන්තුවට අයත් ආර්ථික අපහසුතාවලින් පෙළෙන සිවිල් සේවක මහතකුගේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය හදාරන දියණියක් වෙත ලැප්ටොප් පරිගණයක් පරිත්‍යාග කිරීම ඉකුත් ජූනි 11 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිදුකෙරිණ. දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ අධ්‍යාපනය හදාරනු ලබන කළණි භාග්‍යා රණසිංහ යන දියණිය වෙත එම පරිත්‍යාගය සිදුකෙරුණු අතර ඒ සඳහා එයිට්කන් ස්පෙන්ස් සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කපිල අබේගුණවර්ධන මහතා විසින් තම ආදරණීය පියාණන් සිහිවීම පිණිස මෙම වටිනා පරිත්‍යාගය සිදුකරන ලදී.

# ශිෂ්‍යාධාර පිරිනමමින්






7 (සේවා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවෙහි ඒකක දිනයට සමගාමීව පසුගිය ජූලි 17 වන දින ඒකකයේ රාජකාරි කරනු ලබන නිලධාරි සෙසුනිලයින්ගේ දරුවන් අතරින් විශේෂ දක්ෂතා දක්වන ලද (5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් අපොස සා/පෙළ සමත්ව A සමාර්ථ 09 ක් ලබාගත්) හා විශේෂ අවශ්‍යතා සහිත වූ දරුවන් 22 දෙනකු සඳහා DSI ආයතනය වෙතින් රුපියල් 5,000.00 බැගින් වූ වව්චර්පත් ලබාදීමට ක්‍රියාකෙරිණ. ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා සභාපතිනියගේ උපදෙස් මත එම ශාඛාවේ සම්බන්ධීකරණයෙන් මෙම සත්කාරය සිදුකෙරිණ.

# පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් ප්‍රජාසත්කාර රැසක්



පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියන්තිකා ද සොයිසා මහත්මිය ඇතුළු සෙසු සාමාජිකාවන් ඉකුත් ජූලි 22 වන දින මුල්ලේරියාව අතරමැදි කඳවුරේ වාට්ටු අංක 05 හි සංචාරයක නිරතවූහ. විශේෂ විමර්ශන ඒකකය විසින් සංවිධානය කරන ලද මෙම සංචාරයේදී නේවාසික රෝගීන් 35 දෙනකු හට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ප්‍රදානය කිරීමද කැලිප්සෝ ප්‍රසංගයක්ද පවත්වා ඔවුනට දිවා ආහාර වේලක් ලබාදීමටද කටයුතු කරනු ලැබීය.





එම සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ කඳවුරක්ද ඉකුත් ජූනි 27 වන දින පොල්හේන්ගොඩ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. ඒ සඳහා 7 වන රෙජිමේන්තු ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය සහ විශේෂ විමර්ශන ඒකකය එක්විය. නාරාහේන්පිට පිහිටි යුද හමුදා රෝහල සමඟ එක්ව පැවැත්වූ මෙම ලේ දන්දීමේ වැඩසටහනට එම බලකායට අයත් නිලධාරීහු හා සෙසුනිලයෝ 100 කට අධික සංඛ්‍යාවක් දායක වූහ. මෙම අවස්ථාව සඳහා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය, එම බලකායේ බලකාධිපති මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා විනයාරක්ෂකාධිපති මේජර් ජෙනරාල් ඒසීඒ ද සොයිසා එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු නිලධාරීන් හා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක්ද සහභාගී වූහ.

# වරුසවිතාන වැඩිහිටි නිවාසයට සත්කාරයක්





සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා සාමාජිකාවෝ ඉකුත් ජූලි 29 වන දින අම්බලන්ගොඩ පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත උදේ, දහවල් සහ රාත්‍රී ආහාරය ලබාදීමේ සත්කාරයකට දායක වූහ. මියගිය හා ආබාධිත රණවිරුවන් හට සෙත්පතා මෙම සත්කාරය සිදුකරන ලදී.

# "මහා බෝධි" ළමා නිවාසයට භාණ්ඩ පරිත්‍යාගයක්





"මහා බෝධි"ළමා නිවාසයේ අවශ්‍යතාවන් සොයාබලා භාණ්ඩ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව මගින් ඉකුත් ජූනි 17 වන දින පැවැත්විණ. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ මගපෙන්වීම යටතේ පැවැත්වුණු මෙම වැඩසටහන සඳහා යුද හමුදා නිලධාරීන් හා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

# කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම





යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශ්‍යාමලි විජේසේකර මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 28 වන දින පනාගොඩ ඉංජිනේරු සේවා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.

මෙම රැස්වීමේදී රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ප්‍රතිලාභ සඳහා සිදුකරන ලද මෙන්ම ක්‍රියාත්මක කිරීමට නියමිත විවිධ සුබසාධන කටයුතු පිළිබඳ සාකච්ඡා කරන ලදී. මෙම අවස්ථාවට සමගාමීව රෙම ශ්‍රීලයුකාබ හා 1 ශ්‍රීලයුකාබ යටතේ රාජකාරි නියුතු සිවිල් කාර්ය මණ්ඩලය වෙත විවිධ වර්ගයේ එළවළු වර්ග 13 කින් සමන්විත නැවුම් එළවළු මලු පරිත්‍යාග කිරීමක්ද සිදුකෙරිණ.

# නම් ගම්

## මතක තබා ගැනීමේ

# කලාව



නම් ගම් මතක තබාගැනීමේ අංග සම්පූර්ණ ශක්තියක් කිසිවකුට හෝ ඇත්තේ නැත. එහෙත්, මෙම හැකියාව ගැබ්ව ඇති වැදගත්කම මතුවන්නේ ඔබේ ව්‍යාපාරික කාර්යාල කටයුතු හෝ පෞද්ගලික මිතුදම් ඉදිරියෙහිදීය. "පුද්ගලයකු අසන මියුරුතම හා වැදගත්ම හඬ වන්නේ ඔහුගේ නමේ උච්චාරණයයි" යනුවෙන් "ඩේල් කානගි" නමැති සමාජ විද්‍යාඥයා විසින් පවසා තිබේ. බොහෝවිට නොනැසෙන නම මිතුරුකමට ගණුදෙනුවකට හෝ හවුල් ව්‍යාපාරයකට ද්වාරය හැරදෙන යතුර ඔබ අලුතින් හඳුනාගන්නා තැනැත්තාගේ නම විය හැකිය. ඇත්තෙන්ම එතරම් ක්ෂණිකව සුහදශීලීත්ව ප්‍රකාශ කෙරෙන අන් චාරිත්‍රයක් ඇත්තේ නැත. යමෙකුගේ නම නිසි පරිදි මතක තබාගැනීම එතරම් වැදගත්ය.

අවන්හල් හිමියකු වන "වික්ටර් ඩුප්රේ" නම් මතක තබාගැනීම කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වයි. ඔහුගේ අවන්හලට නිතිපතා පැමිණෙන එක් තැනැත්තකු දිනක් එහි පැමිණියේ තරුණ කතක සමඟය.

ඔහු අසුන් ගත්තේ ඩුප්රේ හට සිය මිතුරිය හඳුන්වා දෙමිනි. ඔවුන් ආපසු යන විට ඩුප්රේ හට ආචාර කළේ ඇගේ නමද උච්චාරණය කරමිනි. "මම කලින්ම ඒ මහත්මියට ආචාර කරපු වහාම ඇය තරමක විශ්මයට වගේම උද්දාමයටත් පත්වුණා" යි ඩුප්රේ සිහිපත් කරයි. ඒ මොහොතේදී ඇගේ මුහුණේ තිබුණේ කෙතරම් තෘප්තිමත් හැඟීමක්ද කිව්වොත් ඇය නොවරදවාම ආපසු මගේ අවන්හලට එන බව මට වැටහුණා. ඒ විතරක් නොවෙයි ඇය තම මිතුරු මිතුරියන් පවා කැඳවාගෙන එන බව මම දැනගෙන හිටියා. මම කරන වෙළඳාමේ හැටියට එක අමුත්තකුගේ නමක් කියන්නේ අලුත් අමුත්තන් 100 දෙනකුට.

අනෙක් අතට යමෙකුගේ නමක් අමතකවීම යනු සිත් පෑරීමක් හා සමාජමය වශයෙන් ඔබට අපහසුතාවයක් ඇති වීමක් විය හැකිය. ඒ පිළිබඳව මා කර ඇති සමීක්ෂණවලින් මට පෙනී ගිය කරුණක් වන්නේ යමෙකුගේ නමක් අපට අමතක වන්නේ අප විසින් නිසි අවධානය ඊට නොයෙදෙන බැවිණි. එදිනෙදා ජීවිතයේදී අපේ මනසට ඇතුළු වන සිය දහසක් දේ අතුරින් දීර්ඝකාලීන මතකය සඳහා අප විසින් තැන්පත් කරගන්නේ ඉතාම සුළු

> "ඔබට යමෙකුව හඳුන්වාදී තත්පර 10 ක් ගෙවී ගිය පසු ඔහුගේ නම මතක් කරගන්නට තනන්නේ ඔබ ඒ මොහොතෙහි නිසි අවධානයකින් යුතුව නොසිටි නිසාය.
>
> එවැනි අවසථාවකට මුහුණ පෑමට අපහට බොහෝ විට සිදුවන්නේ අපි අප කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමට පුරුදුව සිටින නිසාය"

තොරතුරු සමූහයක් පමණය. අපට එතරම් වැදගත් නොවේ යයි හැඟෙන තොරතුරු අප ගොනු කරන්නේ කෙටිකාලීන මතකය තුළය.

මෙහිදී, මුහුණදිය යුතු අභියෝගය වන්නේ අර හාදයාගේ නම වැනි එතරම් නොවැදගත් තොරතුරක් වැදගත් තොරතුරක් ලෙස දීර්ඝකාලීන මතකයට රිංගවා ගන්නේ කෙලෙසද යන්නයි. ඔබට යමෙකුව හඳුන්වාදී තත්පර 10 ක් ගෙවී ගිය පසු ඔහුගේ නම මතක්කර ගන්නට තනන්නේ ඔබ ඒ මොහොතෙහි නිසි අවධානයකින් යුතුව නොසිටි නිසාය.


එවැනි අවස්ථාවකට මුහුණ පෑමට අප හට බොහෝ විට සිදුවන්නේ අපි අප කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමට පුරුදුව සිටින නිසාය.

කෙනකුගේ නමක් සිහි තබාගැන්මට යෙදිය හැකි එක් උපක්‍රමයක් වන්නේ ඒ තැනැත්තාගේ නම හා ඔහුගේ ස්වරූපය ආදේශ කරගැනීමට මඟක් සොයා ගැනීමය. උදාහරණයක් ලෙස රත්නායක වැනි නමක් ඇති පුද්ගලයකු රතු නැතත් ඔහු රතු පැහැයෙන් දිලෙන මිනිසකු ලෙස ඔබට මනසේ චිත්‍රණය කරගත හැකිය. එමඟින් නැවත ඔහු දුටු විගස ඔහුගේ නම රත්නායක බැව් ඔබට පහසුවෙන් සිහිපත් වනු ඇත. කරුණාතිලකගේ නළලේ තිලකයක් නැති මුත් මනසින් එහි තිලකයක් එබ්බවීමට ඔබට හැකිය.

නම් ගම් මතක තබා ගැනීමට ඔබ සතු හැකියාව ඒ පිළිබඳව ඔබ දක්වන උනන්දුව මත වැඩිදියුණු වනු ඇත. අන්තිමේදී ඔබ ඒ කලාව ප්‍රගුණ කළ විට ඔබද කිසිවකුට අමතක නොවන පුද්ගලයකු බව පෙනී යනු ඇත.

- උපුටාගැනීම

1993 මාර්තු මනහර සඟරාව ඇසුරිනි




# නන්දිකඩාල්

සෙ/ 511904 ව/සැරයන් බණ්ඩාර එච්පීඑස්
පීඩබ්ලිව්වී ආර්එස්පී
විජයබාහු පාබල රෙජිමේන්තුව

# සටනට පණ දුන් අභීත විරුවෙක්

ශ්‍රී දළදා වහන්සේ වැඩ වසන කන්ද උඩරට ප්‍රදේශයේ පේරාදෙණිය මීවතුර නම් සොඳුරු ගම් පියසේ හොරණ ගෙදර උක්කුරාල මහතාටත් පතිරණ ගෙදර උක්කු අම්මා මහත්මියටත් දාව ලොව එළිය දකින හොරණෑ ගෙදර කරුණාරත්න අබේසේකර මහතා කන්ද උඩරටටම උරුම වූ ප්‍රෞඪ ඉතිහාසය රකිමින් ස්වකීය සහකාරිය ලෙස තෝරාගන්නේ තම ඇවැස්ස නෑනා වූ මහ කුඹුරේ ආදර චිත්‍රලතා මහත්මියයි.

ක්‍රිස්තු වර්ෂ 1977 දී උඩරටදී චාරිත්‍රානුකූලව විවාහ වන මොවුන් දෙපළ ස්වකීය නව දිවිය ගොඩනැඟීමේ අරමුණු සහිතව තම අලුත් කැදැල්ල ගොඩනැඟීමට තෝරාගන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොටිකාපොළ ගම් පියසයි. මොවුන් දෙපලගේ දිවි මඟට නව ආලෝකයක් ලැබෙන දිනය ළඟාවූයේ මේ අතුරතුරය. එකී සිහින සැබෑකරමින් උඩරටට උරුම වූ වීර ලෙයින් පෝෂිතව හොරණෑ ගෙදර සෙනරත් බණ්ඩාර නම් පුත් කුමරා මෙලොව එළිය දකින්නේ ක්‍රි:ව 1979 ක් වූ බක් මස 26 වන රිවිදාය.

සැමගේ කරුණාව මැද වැඩෙන මොහුගේ ශික්ෂාග්‍රහණ කාලය එළඹි බැවින් මව්පියන් විසින් ඔහු භාරදෙනු ලබන්නේ කු/සමෝදා‍යා කනිටු විදු මව වෙතටය. ඒ වර්ෂ 1984 දුරුතු මස 01 වන දිනය.

දෙමාපිය පරම්පරාවෙන් ලද දැහැමි ගුණය මැණිකක් නම් එය කපා ඔපදමනු ලැබුවේ කොට්ටාපොළ ශ්‍රී ආනන්දාරාම පොත්ගුල් විහාරයේ හිමිවරුන්ගේ ඇසුරත් ශ්‍රී රාහුල දහම් පාසලෙන් ලත් ඉගෙනුමත් මගිනි. මෙලෙසින් කල්ගෙවන ඔහුගේ පාළුව තනිකම මකන්නටත් දුක සැප බෙදාගැනීමටත් වර්ෂ 1981 ජූනි මස 16 වන දින හොරණෑ ගෙදර නලින්ද අබේරත්න සොයුරාත් වර්ෂ 1985 ජූනි මස 17 වන දින නිරන්ජලා සරෝජනි සොයුරියත් ඔවුන්ගේ කුඩා පවුලට එක්වූහ. නෙවන ශ්‍රේණිය තෙක් මුල් විදුහලේ අධ්‍යාපනය ලත් මොහු හතරවන ශ්‍රේණියේ සිට අධ්‍යාපනය ලබන්නේ මාවතගම සමෝධා‍යා මහා විද්‍යාලයෙනි.

වගකීම් භාරගෙන ඒවා මනා ලෙස ඉටුකරන විනයගරුක නිහතමානී සිසුවකු ලෙස ඔහු කැපී පෙණුනු බවට සහෝදා‍යා මධ්‍ය මහා විද්‍යාලයේ එවකට සිටි විදුහල්පති ගුණපාල රණසිංහ මහතා ඇතුළු ඇදුරු මඬුල්ලත් ඔහුගේ මිතුරු මිතුරියන් ඇතුළු සියලු දෙනාත් සාක්ෂි දරති.

පාසල් අධ්‍යාපනයට මෙවැනි දායකත්වයක් ලබාදුන් ඔහු ශ්‍රී ආනන්දාරාම පොත්ගුල් වෙහෙරටත්, ශ්‍රී රාහුල දහම් පාසලටත් බෞද්ධාගමිකයකු වශයෙන් තම යුතුකම් කොටස මැනවින් ඉටු කළේ තම විනයගරුක දිවි මග ගොඩනැංවීමට ලබාදුන් නොමඳ සහයෝගයට කෘතගුණ දැක්වීමක් ලෙසිණි.

රටේ තැන තැන බෝම්බවලින් මිය යන තම දෙමාපියන් වැනි මව්පියවරුන්, තමන්ගේම සොයුරු සොයුරියන් තම මිතුරු මිතුරියන් වැනි ජනයාත් ගැන සිතූ ඔහු, තිර අධිෂ්ඨානයකට පැමිණෙන්නේ රටේ හෙට දවස රැකදීම පවුලේ දිවිබරට උරදීමටත් වඩා වැදගත් යැයි සිතමිනි. තම අදහස මව්පිය දෙපලටත් සොයුරා සහ සොයුරියටත් දැන්වූ ඔහුට ලැබුණු ප්‍රතිචාරය වූයේ ඔහුගේ අරමුණට අනුමැතියක් නොව විරෝධතාවයකි. එසේ වූයේ එදා ඇතැම් ජනයා තුළ වූ යුද බිහිසුණු නිසාමය. එසේ වුවත්, "තමාට පෙර රට" යන උදාර චේතනාවෙන් සිටි සෙනරත් මහත් වෙහෙසක් දරා තම පවුලේ අනුමැතිය ඒ සඳහා ලබාගන්නේ මව්බිමේ හෙට දවස නිදහස් නිවහල් කිරීමේ උතුම් අරමුණ ඇතිවය.

සැමගේ ආශිර්වාදය මැද වර්ෂ 1987 ක් වූ නොවැම්බර් මස 26 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය හමුදා සේවයට එක්වූ ඔහු පුත්තලමේ පිහිටි විජයබාහු පාබල රෙජිමේන්තු පුහුණු පාසල වෙත ඇතුළුවිය. එහිදී, ඔහු පුහුණු පාඨමාලා අංක 24 සාර්ථකව හදාරා, වර්ෂ 1998 පෙබරවාරි මස 20 වන දින 8 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ නිත්‍ය සාමාජිකයකු බවට පත්විය.

ඉන් ලැබූ දැනුමත්, දක්ෂතාවයත් සමගින් ප්‍රශස්ථ සේවාවක් තම මව්බිම වෙත ලබාදෙමින්  සිටි මොහු යුද්ධ හමුදාවේ අවශ්‍යතාවය මත පසුව 4 වන විජයබාහු පාබල රෙජිමේන්තුව වෙත අන්තර් ඒකක මාරුවක් ලැබුවේය. එම ඒකකය සමගින් එවකට පැවති යුද වාතාවරණය මත පරන්තන්, අලිමංකඩ වෙත්තලකේනි, චාවකච්චේරි, කිලිනොච්චිය වැනි යුද පෙරමුණුවලදී රට ජාතිය වෙනුවෙන් සටන් වැදීමට ඔහුට අවකාශ ලැබුණි.

මෙසේ තම කාය ශක්තිය රට ජාතිය ආගම වෙනුවෙන් කැපකර සිටින අතරතුර සාමාන්‍ය සෙබළ සිට ලාන්ස් කෝප්‍රල් නිලය දක්වා උසස්වීමක් ලැබීමේ භාග්‍යය 2002 ඔක්තෝබර් මස 31 වන දින ඔහු හට හිමි විය. අනතුරුව වර්ෂ 2004 ඔක්තෝබර් මස 13 වන දින සිට අම්පාර යුද්ධ හමුදා පුහුණු පාසල වෙතින් අංක 43 කනිෂ්ඨ උපදේශක පාඨමාලාව හැදෑරීමේ භාග්‍යය ද ඔහුට හිමිවිය. ඉන් අනතුරුව ස්වකීය දක්ෂතාවයන් මනාව උපයෝගී කරගනිමින් ලාන්ස් කෝප්‍රල් සිට කෝප්‍රල් දක්වා නිල උසස් කිරීමේ පරීක්ෂණයට සහභාගී වී ඉන් සමත්වීම හේතුවෙන් යුද්ධ හමුදාවේ තවත් එක් විශිෂ්ට කඩඉමක් වන කෝප්‍රල් නිලයට වර්ෂ 2004 දෙසැම්බර් මස 01 වන දින උසස්වීමේ භාග්‍යද, ඔහුට හිමිවිය.

4 වන විජයබාහු පාබල රෙජිමේන්තුව ක්‍රියාන්විත රාජකාරී සඳහා වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගත වන්නේ මෙම කාල සීමාවේදීය. එහිදී, මොහුට ලැබුණු රාජකාරීන් අතුරින් විශේෂ රාජකාරියක් වූයේ මාර්ග බාධකයෙහි රාජකාරී කිරීමයි. මෙහිදී, ඔහුට වීර සෙබළ සොයුරන් මෙන්ම සොයුරියන් ද මුණගැසුණු අතර, ඔවුන් සමග ද තම දුක සැප බෙදා ගැනීමේ අවස්ථාව හිමිවිය. ගිනි අවියට පෙම්බඳින මොවුන්ගේ තුරුණු දිවියේදී මොහුට හමුවූ සුවිශේෂී සොහොයුරියක් වූයේ කේ දර්ශනී නයනා වේරගොඩ ය. එම සුවිශේෂත්වය මතම ගොඩනැගී මිතුදම පෙම්දමක් වූයේ මොවුන් ද නොදැනුවත්වමය.

වර්ෂ 2006 පෙබරවාරි මස ඇරඹිණ. මෙම පෙම් කතාවට දෙපාර්ශවයේ මව්පිය ආශිර්වාදයත්, යුද්ධ හමුදා අවසරයක් ලැබ යුද්ධ හමුදා සිරිත් මැද සිංහල චාරිත්‍රානුකූලව කිරුළු පළඳන්නට හැකිවූයේ වර්ෂ 2007 මැයි මස 05 වන දින මහම්පිටිය විවාහ ලේකම් කාර්යාලයේදීය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවයේ දශකයක කාලයක් රට වෙනුවෙන් යුතුකම් ඉටු කරමින් සිටින අතරතුර තම සේවයේ තවත් ගෞරවනීය නිලයක් දැරීමේ භාග්‍යය ඔහුට උදාවිය. එනම්, කෝප්‍රල් සිටි සැරයන් දක්වා නිල උසස් කිරීමේ පරීක්ෂණයට සහභාගිවී ඉන් සමත්වීමයි. ඉන්පසු වර්ෂ 2007 ඔක්තෝබර් මස 20 වන දින සැරයන් නිලයට උසස්වීම හේතුකොට ගෙන යුද්ධ හමුදාව තුළ ජ්‍යේෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරියෙක් වීමේ භාග්‍යය මොහුට උදාවිය.

පසුව තම ඒකකය වව්නියාව, පාලමොඩෙයි ප්‍රදේශයේ ඉදිරි ආරක්ෂක වළල්ලේ ස්ථානගතව සිටියදී වර්ෂ 2008 අගෝස්තු මස 24 වන දින සිට වර්ෂ 2008 අගෝස්තු මස 29 වන දින දක්වා එම ප්‍රදේශයේ බලය තහවුරුකර ගැනීම සඳහා මෙම ඒකක "ඩී" කණ්ඩායමේ ඛණ්ඩභාර සැරයන්වරයකු වශයෙන් කටයුතු කිරීමේ අවස්ථාව මොහුට ලැබුණේ කුඩාකල සිට වූ නායකත්ව ලක්ෂණයන්ට ගෞරවයක් ලැබීමට මෙනි. සහජයෙන් ලද අභීත බව හේතුකොටගෙනම "තමාට පෙර රට" අරමුණෙන් ක්‍රියාකළ මොහු තම පිරිසට මගපෙන්වූ අභීත නායකයකු විය. තම අභීත බව මතම ක්‍රියාත්මක වූ මොහු වරක ත්‍රස්තවාදීන්ගේ නිරීක්ෂණ ස්ථානයක් වෙත ප්‍රහාර එල්ල කළේය. තවද, පාලමොඩෙයි ප්‍රදේශයේ තිබූ ත්‍රස්තවාදීන්ට අයත් පාසිලාන් 2000 වර්ගයේ මෝටාර් විදිනයක් නිරීක්ෂණය කර එය විනාශ කිරීම වස් කාලතුවක්කු බලයද ලබාගැනීමට යුහුසුළුව ක්‍රියා කළේය.

දින ගණනාවක් තුළ ත්‍රස්තයින් හා සටන්කර ඔවුන්ගේ ප්‍රහාරවලට ප්‍රතිප්‍රහාර එල්ල කරමින් අසීරු ඉලක්කයක් වී තිබූ පාලමොඩෙයි ප්‍රදේශය අත්පත්කර ගැනීමට නොපසුබට ධෛර්යයකින් යුතුව තම දායකත්වය සැපයීය.

එහිදී, ඔවුන්ගේ අවි ආයුධ හා වාහනවලට විශාල වශයෙන් අලාභහානි සිදුකිරීමට හැකිවිය. තම මව්බිම වෙනුවෙන් මෙසේ කළා වූ විශිෂ්ට සේවය අගයනුවස් ඔහුට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් "රණශූර පදක්කම" ප්‍රදානය කෙරිණ. වර්ෂ 2008 දෙසැම්බර් මස 31 වන දින පිය පදවියට වරම් ලැබූ ඔහු පියකු, රණශූරයකු හා සැමියකු ලෙස සිය පවුලට රැකවරණය ලබාදෙමින් ළඟට වී සිටිය යුතු අවස්ථාවක නැවත කඩිනමින් සේවයට වාර්තා කිරීමට පෙළඹෙන්නේ දියණිය බිහිවූ රට නිදහස්, නිවහල්, සාමකාමී, නොබෙදුණු එකක් කිරීමේ තිර අදිටනින්ය. යුද්ධ හමුදා භටපිරිස් වෙත පුදුකුඩුඉරිප්පු ඉදිරි ආරක්ෂක වළල්ල පුළුල් කරන ලෙස, 8 වන කාර්යය සේනාංකය වෙතින් නියෝග ලබාදුන්නේය. ඒ අනුව වර්ෂ 2009 පෙබරවාරි මස 22 වන දින මෙම ඒකක "ඩී" බලඝණ නිලධාරී අණදෙන ඇතුළු සෙබළුන් විසි එක් දෙනකුගෙන් සමන්විත භට පිරිසක් කුඩා කණ්ඩායම් වශයෙන් බෙදී මෙහෙයුමට එක්විය. එහිදී, සතුරු බංකර් වෙත ළඟාවීමට නොහැකිවන සේ අටවා තිබූ මර උගුල්, බිම් වෙඩි ඉවත් කරමින් ඉතා සූක්ෂම ලෙස බංකර් වෙත ළඟාවී ආර්පීජී, එම්පීඑම්ජී හා සුළු අවි යොදාගනිමින් සතුරා විස්මයට පත් කරමින් දැවැන්ත ප්‍රහාරයක් එල්ල කළහ.

සතුරාගේ බෙදුම්වාදී අරමුණ ව්‍යර්ථ කරමින් ජන්ම භූමියෙහි ආධිපත්‍යය ආරක්ෂා කරගැනීමෙහිලා ඉටුකළා වූ විශිෂ්ට සේවය අගයනුවස් දෙවන වරටත් සෙනරත් බණ්ඩාර නම් වූ රණවිරුවාට දෙවන රණශූර පදක්කමෙන් බුහුමන් ලැබීමට හැකිවිය. මීට අමතරව රට ජාතිය වෙනුවෙන් කළ මෙහෙය අගයනුවස් වන්නි මානුෂීය මෙහෙයුම් පදක්කම්, නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම, පූර්ණභූමි පදක්කම, උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම, රිවිරැස මෙහෙයුම් පදක්කම, පනස් වන නිදහස් ස්වර්ණ ජයන්ති පදක්කම සහ යුද්ධ හමුදා පනස්වන සංවත්සර පදක්කමින්ද පිදුම් ලැබුවේය.

වන්නි මානුෂීය මෙහෙයුම් ඉදිරියට ගමන් කරමින් තිබියදී පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ වර්ග කිලෝමීටර පනහක පමණ සුළු බිම්කඩකට කොටුව සිටි ත්‍රස්තවාදීන් ආරක්ෂක හමුදා පුදුකුඩිඉරිප්පු නගර මධ්‍යයට ඇතුළුවීම වැළැක්වීම අරමුණුකර ගනිමින් හා ඉදිරි ගමනට බාධා පැමිණවීමේ අරමුණින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළහ. ඒ අනුව "ඒ 35" මාර්ගයට දකුණු දෙසින් ඊට සමාන්තරව, ප්‍රදේශය ආවරණය වන පරිදි දැවැන්ත යුද අගලක් සහිත අඩි පහළොවක් පමණ උසැති පස්බැම්මක් ඉදිකර තිබුණි. එම පස්බැම් හේතුවෙන් යුද්ධ හමුදාවේ ඉදිරි ගමන අඩාල විය. එය මැනවින් වටහාගත් සෙනරත් බණ්ඩාර ඇතුළු කණ්ඩායම වර්ෂ 2009 මාර්තු මස 03 වන දින එය අත්පත්කර ගැනීමට දිවි පරදුවට තබා සටන් කළහ. එකී සුවිශේෂී දක්ෂතාවයන් හේතු කොටගෙන තෙවන වරටත් රණශූර පදක්කම පැළඳ ගැනීමට බණ්ඩාර රණවිරුවාට හැකිවිය. මෙවන් ජයග්‍රහණ රැසක් ලැබීමට කනිෂ්ඨ උපදේශක පාඨමාලාව, කොමාන්ඩෝ නායකත්ව පාඨමාලාව, විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාව සහ යුද ටැංකි නාශක මිසයිල පාඨමාලාව යන පාඨමාලා මගින් ඔහු ලබාගත් පන්නරය හේතු වන්නට ඇත.

ලංකා මාතාව බෙදුම්වාදී යුද්ධය නමැති සතුරාගෙන් මුදාගෙන ඒකීයභාවය සාක්ෂාත් කරගැනීමට සූදානම් වන මොහොත එළඹියේ වර්ෂ 2009 මැයි මස 17 වන දින වන්නි මානුෂීය මෙහෙයුමේ අවසන් අදියර ක්‍රියාත්මක කරන අවස්ථාවේදීය. මෙදින සැරයන් සෙනරත් බණ්ඩාර නම් වූ අභීත රණවිරුවා තවත් රණවිරුවන් පිරිසක් සමඟින් රැකසිට පහරදීමේ බණ්ඩයක් ලෙස නන්දිකඩාල් කළපුවේ කඩොලාන දූපතෙහි ස්ථානගතව සිටියේය.

කඩොලාන දූපතෙහි රැකසිට පහරදීමේ කණ්ඩයට ඉදිරියෙන්, වර්ෂ 2009 මැයි මස 18 වන දින අලුයම 0300 ට පමණ ජලය පිරී තිබූ ස්ථානවල සිට ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයක් කුඩා ලී පාරු යොදාගෙන පිහිනමින් ඉදිරි ආරක්ෂක වළල්ල වෙත පැමිණෙන අයුරු ඔහු නිරීක්ෂණය කළේය. ඒ අනුව ත්‍රස්තයන්ගේ ඉදිරිගමන අඩාල කරනුවස් තම අනෙකුත් සහයක බලඇණිවලින් මෝටාර්, කාලතුවක්කු වෙඩි බලය යොදාගත්ත ද කළපුවේ ජලය නිසාවෙන් එම ප්‍රහාරයන් ව්‍යර්ථ විය.

සතුරන් නොනැවතී ඉදිරියට ඇදෙන බව නිරීක්ෂණය කළ මොහු විසින් සහ අන්ධකාරය ආවරණයක් ලෙස යොදාගනිමින් තම සොයුරු පිරිස එම ස්ථානයේ ස්ථානගත කරන ලදී. රැකසිට පහරදීමේ බණ්ඩය ස්ථානගත කළ ප්‍රදේශයට ත්‍රස්තයින් විශාල ප්‍රමාණයක් පැමිණෙන බව ගුවන්විදුලි යන්ත්‍ර මගින් අණදෙන නිලධාරී දැනුවත් කර තමා ඇතුළු බණ්ඩය ත්‍රස්තයින්හට ප්‍රහාර එල්ල කරන බව දැනුම්දීමට සෙනරත් බණ්ඩාර කටයුතු කළේය. මෙහිදී, තමාගේ බණ්ඩයේ තුවාල ලැබූ සෙනින් පසුපසට යවමින් මෙම ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරී එතැනම රැඳී සිට පසුව පැමිණි තවත් අට දෙනකුගෙන් සමන්විත පිරිසක් සමඟ නොකඩවා ප්‍රහාරය දියත් කරන ලද්දේ නොසැලී සිටිමිනි. අලුයම 0530 ට පමණ මෙම රණකාමියා හට ත්‍රස්තවාදී ප්‍රහාරයකින් තුවාල සිදුවුවද තමාට පෙර රට ගැන සිතා නොපසුබටව නායකත්වය දෙන්නේ රට වෙනුවෙන් තම වගකීම මැනවින් ඉටුකිරීම මෙම ජාතික වීරයාගේ තෙවන රණශූර පදක්කමට තදීම සාක්ෂිය විය.

සැරයන් සෙනරත් බණ්ඩාර තුවාල ලැබූ අවස්ථාවේදීම පසුපසට පැමිණීමට මොහු හට අවකාශ තිබුණද මව්බිමේ ඒකීයභාවය හා ස්වාධිපත්‍යය ආරක්ෂා කරගැනීමෙහිලා මොහු නිවැරදි නායකයකු ලෙස අන්තිම හුස්ම පොද වාතලයට මුසුවන තෙක්ම සටන් වදින ලද්දේ ගමේ පන්සලෙන් හා පාසල්වලින්, පොත්පතෙන් උගත් ජාතික වීරයන්ගේ අඩි පාරේ යමිනි. "සමර්ථානං අතිභාරංකං" යන විජයබාහු පාබල රෙජිමේන්තුවෙහි ආදර්ශ පාඨයෙහි තේරුම් වනාහි "තම උපායෙහි, ශිල්පයෙහි සහ වෘත්තියෙහි අති දක්ෂයකුට ඉසිලිය නොහැකි මහා බර කුමක්ද" යන්නය. එම අර්ථය ක්‍රියාවට නංවමින් දශක එකහමාරකට ආසන්න කාලයක ක්‍රියාන්විත අත්දැකීම් යොදාගනිමින් මෙම ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරියගේ වීරත්වය නිසාවෙන් ත්‍රස්තවාදී නායකයා ඇතුළු අනෙකුත් ප්‍රබල ත්‍රස්තවාදී නායකයින්ගේ අරමුණක්ව තිබූ මුලතිව් කැලයට ඇතුළු වී නැවත ප්‍රතිසංවිධානය වීමේ සිහිනය මුළුමනින්ම බොඳකර දමමින් ප්‍රබල ත්‍රස්තවාදී නායකයින් හා මරාගෙන මැරෙන කොටි ත්‍රස්තයින් විශාල ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත්කිරීම උදෙසා බරපතල ලෙස තුවාලවී සිටියදීද අවසන් සුසුම වාතලයට මුසුවනතෙක්ම සටන් වැදීම

හේතුවෙන් පරම වීර විභූෂණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් වර්ෂ 2012 වූ මැයි මස 19 වන දින විජයග්‍රහණ සැමරුම් පෙළපාලියේදී රණවිරු සෙනරත් බණ්ඩාරගේ ආදරණීය දියණිය මිතුණි පූජා බණ්ඩාර වෙත ගෞරවයෙන් යුතුව ප්‍රදානය කරන ලදී.

"සාධවෝ නහි සර්වත්‍ර - චන්දනං න වනේ වනේ"

නානාවිධ වෘක්ෂලතාවන් අතර, සඳුන් වෘක්ෂයෝ අතිශය විරලය. සෑම තැන නොවූවද ඒ දුලබ බව මතින් විහිදෙන පුසුඹ වනයේ දසදෙස පැතිරී පවතින්නේය. මිනිසුන් අතරද එවන් උදාර හදවතින් හෙබි ගුණ සුවඳ දැරුවෝ අතිශයින් විරලය. ස්වකීය ජන්මය ඵලදායි සමාජ මෙහෙවර උදෙසා පුදකළ සත්පුරුෂයින් සැබැවින්ම විරලය. පරම වීර විභූෂණයෙන් පිදුම් ලද සෙනරත් බණ්ඩාර රණවිරුවාද එවැන්නෙකි.

හොරණෑ ගෙදර සෙනරත් බණ්ඩාර රණවිරුවා මෙලොවට බිහිකළ ඒ රණවිරු මාතාව සහ පියා දැනට වයෝවෘද්ධ නමුදු ඔවුන්ගේ වීරෝදාර පුතනුවන්සේම දැයට මෙහෙවර කිරීම පිණිස ජාතියට බත සපයනු වස් කෙත් වතු අස්වද්දනු ලබයි.

සිය ස්වාමියාගේ වීරත්වය ශක්තිය කරගනිමින් රණවිරු සෙනරත් බණ්ඩාරයන්ගේ ආදරණීය බිරිඳ කේ දර්ශනී නයනා වේරගොඩ එම දෙපලගේ ජීවමාන ප්‍රතිමූර්තිය වන පොළොන්නරුව රාජකීය ප්‍රාථමික විද්‍යාලයේ ඉගෙනුම ලබන මිතුණි පූජා බණ්ඩාර දියණියට දිරිය මවක් වී ඇය රැකගනිමින් දිවි ගෙවන්නීය.


සටහන-:
"උත්තමාචාර" ග්‍රන්ථය ඇසුරිනි...

# බලලත් නිලධාරීන් සඳහා නායකත්ව වැඩමුළුවක්








56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ජීපීඑම් කාරියවසම් ආර්එස්පී එන්ඩීසී පීඑස්සී අයිජී ගේ පූර්ණ අධීක්‍ෂණය මත ආසේමු (වන්නි) බලප්‍රදේශයේ රාජකාරී කරනු ලබන රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් හා බලලත් නිලධාරී II නිලයේ අයවලුන් සඳහා "නායකත්ව ගුණාංග සහ අණදීමේ හැකියාව ඉහල නැංවීම" අරමුණු කරගනිමින් වූ වැඩමුළුවක් පසුගිය ජූලි 5 සහ 6 යන දෙදින තුළ ආසේමු (වන්නි) ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. මේ සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයේ රාජකාරී කරනු ලබන රෙජිමේන්තු සැරයන් මේජර්වරු හා බලලත් නිලධාරී II නිලයේ අයවලුන් 90 දෙනකු සහභාගී වූහ. දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයෙහි විද්‍යාපීඨ සැරයන් මේජර් වශයෙන් රාජකාරී කරනු ලැබූ බනි I කේආර්ජී සෙනෙවිරත්න (විශ්‍රාමික), යුද්ධ හමුදා මූලස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් වශයෙන් රාජකාරී කරනු ලැබූ බනි I පීජීඑම්එස්එස් ජයවීර යූඑස්පී (විශ්‍රාමික), බනි I එල්එච්පීපී සරත් කුමාර (විශ්‍රාමික), බනි I ඩබ්ලිව්එම්එස්පී විජේසිංහ (විශ්‍රාමික) හා දැනට යුද්ධ හමුදා මූලස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් රාජකාරී කරනු ලබන බනි I ඩබ්ලිව්පීඩීආර් වීරසිංහ යූඑස්පී යන බලලත් නිලධාරීන් විසින් මෙහි දේශන මෙහෙවනු ලැබූහ. එහිදී, නායකත්වය, විනය පැවැත්ම, සම්මාන සරඹ හා පෙළපාලි, අවමංගල්‍ය සරඹ, රෙසැමේ රාජකාරී හා වගකීම්, ඇඳුම් රෙගුලාසි මාලාව හා ඇඳුම හා පෙනුම පරීක්‍ෂණය සඳහා සූදානම් කිරීම පිළිබඳ දැනුවත් කරන ලදී.

# විවාහ දිවියේ සිරිය කැන්දන
# අඹුසැමි යුවළ



විවාහය ස්ත්‍රිය මෙන්ම පිරිමියා බොහෝ කලක් පෙරුම්පුරා ලබාගන්නා සොඳුරු අවස්ථාවකි. එම සුන්දර ජීවිතය සතුටින් ලබා ගන්නද එය සාර්ථක කරගැනීම හා එහි සතුට භුක්ති විඳීම ගැටළු සහගතය. එනම්, එයට අවශ්‍ය දැනුම ද අප සතු විය යුතුය. බොහෝ දෙනෙක් ටික කලකින්ම කලකිරීමට පත්වේ. තව කෙනෙක් ගැටළු ඇති කරගෙන දික්කසාද දක්වාම ගෙනයයි. තවත් බොහෝ පිරිසක් මුළු ජීවිත කාලයම මානසිකව විඳ විඳ මානසික රෝගවලට ලක් වන අයද මේ අතර ලොව පුරා ම දක්නට ලැබේ. මේ නිසාම මනෝවිද්‍යාවේ නූතන විවාහ උපදේශනය (Merital Counselling) හා ලිංගික උපදේශනය (Sexual Counselling) වැනි විෂය ශාඛාවන්ද බිහිවී ඇත. මේ පිළිබඳව පොත් පත් ද විශාල වශයෙන් ලියැවී ඇත.

අසාර්ථක විවාහයක ප්‍රතිඵල එම යුවළ මෙන්ම දරුවන්ට ද ප්‍රබල ලෙස බලපාන සාධකයකි. එතුළින් ඔවුන් අංගවිකලභාවයට, මානසික රෝගවලට මෙන්ම අපරාධකරුවන් බවට ද පත්වීමේ සම්භාවිතාව ඉහළ අගයක් ගනී. එබැවින් විවාහයට පත්වන හැම යුවළක් ම ඒ ගැන යම් කෙටි හෝ දැනුමක් ලබාගත යුතුය. පවුලක අසාර්ථකත්වයට එක් අයෙක් පමණක් වගකිව නොහැකිය. ස්වාමියා මෙන්ම භාර්යාව ද මේ සඳහා වගකීම භාරගත යුතු බව මනෝවිද්‍යාවේ පෙන්වා දෙයි. මේ අය අතුරින් නොදැනුවත්වම පවුල එහි සාර්ථකත්වයට බලපාන කරුණු රාශියක් සිදුකෙරේ. ඒවා හඳුනාගෙන ඒ අනුව අඩදබරවලට මුල්වන සාධක ඉවත් කරගත යුතුය.

1. විවාහ ගිවිසගත් යුවළ තුළ අන්‍යොන්‍ය ආකල්ප හඳුනා ගැනීම අනිවාර්යයෙන් සිදුවිය යුතුය.

2. එකිනෙකා අභිබවා යයි සිදුනොවිය යුතුය. අධ්‍යාපනික මට්ටම්වලින් උසස් වූ විට කාන්තාව පිරිමියා යටපත් කර ගැනීමට ප්‍රයත්න දැරීම සුලබ දෙයකි. නමුත්, එය ස්වාමියාගේ සතුටට බාධාවක් නොවන අන්දමට තිබිය යුතුය.

3. සැමියා බිරිඳව සැකකිරීම හා බිරිඳ සැමියාව සැකකිරීම එතරම් සුබදායී නොවේ. හීන්නෝන්මාදය යන රෝගයේදී මේ ලක්ෂණ ඇතිවේ. බොහෝ වෙලාවට අනවශ්‍ය ලෙස ඉබේ සැදුන සැක දුරදිග යයි. නිදසුනක් ලෙස සැමියා කාර්යාලයේ සේවිකාවකගේ තේ කෝප්පය බිරිඳගේ තේ කෝප්පයට වඩා රස කිරීම තුළිනි. මෙය ඉවත් විය යුතුය.

4. අනවශ්‍ය විවේචන නිරන්තර සිදුනොවිය යුතුය.

5. අන්‍යොන්‍ය වැරදි දරුවන් ඉදිරියේ ප්‍රකාශ කිරීම ගැටලු ඇති කරයි. එය නොවිය යුතුය.

6. ආත්මාර්ථකාමී ලෙස කටයුතු නොකළ යුතුය.

7. පරණ වැරදි නිතර සිහිකර ගැටළු ඇති නොකළ අලුත් ජීවිතයක් ගතකළ යුතුය.

8. වැඩ කටයුතුවලට අනවශ්‍ය ලෙස අත දැමිය යුතුය යනාදිය ජීවිතයෙන් ඉවත් කර විවාහක යුවළ කලින් දැන නොසිටියද විවාහ වූ දින සිට මනා වූ සම්බන්ධතාවයක් පවත්වා සිය පවුලේ සොම්නස වෙනුවෙන් මානසික හා සමාජයේ පරිසරය සකසා ගත යුතුය.

ආදරය විශ්වයේ පවත්නා සොඳුරුතම ස්වභාව ධර්මයේ දායාදයකි. එමෙන්ම ගැහැනියක හා පිරිමියකු අතර ඇතිවන ආදරය වඩාත් චමත්කාරජනක වනුයේ එයට ස්වභාවධර්මය කැටිකර ඇති අපූර්වත්වය නිසාමය. මනස වර්ධනය වන ළමා කාලයේ සිටම මූලික ප්‍රේරණයක් ලෙස (Motivation) ලුබ්ධිසෙහි (Libodo) හි වර්ධනය වේ. එබැවින් එය අපේක්ෂාවෙන් ම විවාහය සිදුකෙරේ. මෙම තත්ත්වය අහිමි වනවිට ස්වාමියා මෙන්ම කාන්තාවද වෙනත් අයකුගෙන් ආදරේ ලැබීමට පෙළඹේ කොතරම් කාර්යබහුල වුවද සහකරු හෝ සහකාරිය පතන ආදරය ලබාදීමට දවසෙන් වේලාවක් වෙන්කර ගන්න. හෘදයේ නැගෙන එම අසීමිත ආදරය තුළින් බැඳෙන අඹුසැමි යුවළක් වරදට පෙළඹවීම සිත් රිදවීමට අවකාශ නොමැත.

එකිනෙකා අගය කිරීමද විවාහ දිවිය තුළ සාර්ථකත්වය සඳහා කෙරෙන ධනාත්මක පෙළඹවීමකි. සැමියා නිවාඩු දිනක යම් වැඩක් කරන විට තේ එකක් හදාගෙන ළඟට ගොස් උදව් කරමින් ප්‍රශංසා කිරීම සතුටු

> "තමන් කොතරම් කාර්යබහුල වුවද සහකරු හෝ සහකාරිය පතන ආදරේ ලබාදීමට දවසෙන් වේලාවක් වෙන්කර ගන්න හෘදයේ නැගෙන එම අසීමිත ආදරය තුළින් බැඳෙන අඹුසැමි යුවළක් වරදට පෙළඹවීම තබා සිත් රිදවීමට අවකාශ නොමැත"

බස් තීම ආදරේ මෙහි ප්‍රබල බලපෑම් කරන සාධකයකි.

බිරිය ඇඳුම් පැළඳුම් සෝදා පිරිසිදු කර, උයාපිහා, අලුත් යමක් රසවත් ලෙස සකසා ඇති විට ඇයගේ සිත සතුටු වන විදිහේ ප්‍රශංසා කිරීම වැනි දේ සිදුකළ යුතුය.

අලුතෙන් යමක් කරන විට උපකරණ මිලදී ගැනීමේදී මෙන්ම ඇඳුම් පැළඳුම් ගැනීමේදී දෙදෙනාම ගොස් තෝරා ගැනීම මෙන්ම කතිකා කරගෙන යාම සිදුවිය යුතුය.

නිවසෙහි තම සැලසුම් දෙදෙනාම එක්ව සිදුකළ යුතුය. ස්වාමියාගේ අනාගත ඉලක්කය බිරිඳටද කිය යුතුය. ඒ සඳහා ඇයගේ ආදරණීය ප්‍රකාශ නිතුත් කරවීමට අවකාශ සලසාගත යුතුය.

අලුත් බලාපොරොත්තු නැවුම් හැඟුම් ජීවිතයට සතුටක් ගෙන එන බැවින් එය මනාව අත්විඳින්නට තබා ඒකාකාරී බවින් මිදිය යුතුය. මෙහිදී, ගේදොර යාන වාහන පමණක් නොව ආකල්පයන්ටද වෙනස් වන අන්දමට නැවුම් සිතුවිලි එක් කරගත යුතුය.

මම යන ව්‍යවහාරය ඉවත්කර නිතරම අපි අපේ යන ව්‍යවහාරය භාවිත කළ යුතුය. කොතරම් ගැටළු ඇති වුවද සිනහව මුවෙහි තබාගෙන ගැටළු විසඳිය යුතුය. පාර්ශ්වයකට තරහා යන විට අනෙක් පාර්ශ්වය සිනහව මුවට ගෙන කිසිත් ගණන කොට නොගෙන සැනසුම් වදනින් කතා කළ යුතුය. එවිට දෙදෙනාගේ ම ආදරය වඩාත් තහවුරු වනවා මෙන්ම අඩදබරවලින් තොර වාසනාවන්ත යුග දිවියක් ගතකළ හැකිය.

උපුටා ගැනීමකි..

**ජීවිතයට අදාළව සිහින දැකීම නැවතුණු වහාම, ජීවිතයද නවතී.**

**-මැල්කම් ෆෝබ්ස්-**



## ලුහුබැඳියාම සඳහා ඔබටම ඇයිති සිහිනයක් ඇතිකරගන්න.

# ඔබගේ ඉලක්කය නිශ්චය කරගන්න

මිනිසෙකුට ජීවිතයක සාර්ථකත්වය සඳහා ලුහුබැඳයාම පිණිස වන විශාල සිහිනයක් නැත්නම් අරමුණක් තිබිය යුතුය. ජීවිත සාර්ථකත්වය සඳහා ස්වයං පෙළඹවීමක් ජනිත වනුයේ එවිටය. ලුහුබැඳයාම සඳහා විශාල සිහිනයක් ඇත්නම් කිසිලෙසකින් ජීවිතය පිළිබඳ කලකිරීමක් ඇති නොවේ. ඒ වෙනුවට ජීවත්වීම පිළිබඳව දැඩි ඇල්මක් සහ උද්යෝගයක් ඇති වේ. එබැවින් මෙවැනි ඉලක්කයක් ජීවිත සාර්ථකත්වයට මහත් සේ දායක වේ.

ජීවිතයේ සිහින ඇති කර ගැනීම සඳහා වයස් සීමාවක් නැත. ඕනෑම වයසකදී ලුහුබැඳයාම සඳහා සිහින තිබිය යුතුය. ඒ ඒ වයස් වලදී අදාල වයස් කාණ්ඩවලට ගැළපෙන සිහින ඇති කරගත හැකිය. කෙසේ වුවද ජීවිතය ජීවත් කරවීම සඳහා විශාල සිහින මත පදනම් වූ සුබවාදී බලාපොරොත්තු අත්‍යාවශ්‍යය.

**ඔබට ජීවිතයෙන් අවශ්‍ය වී ඇත්තේ කුමක්දැයි නිශ්චිතව දැනගන්න. ඉන්පසු දේ අය ලබා ගැනීම වෙනුවෙන් විඳීමට සිදුවිය හැකි ඕනෑම දුෂ්කරතාවයක් විඳදරා ගැනීමට සූදානම් වන්න.**

- මීට පෙර පරිච්ඡේදයක සවිස්තරව දක්වා ඇති පරිදි ඔබගේ ජීවිතයේ දැක්ම සහ පරමාර්ථ වලට අනුව ජීවිතයේ අරමුණු පැහැදිලි කරගන්න.
- එම දැක්ම මත පදනම්ව ඔබගේ ජීවිතය ගෙවිය යුත්තේ කෙසේ දැයි තීරණය කරන්න.
- එම අරමුණ කරා යාමට කෙටිකාලීන, මැදිකාලීන සහ දීර්ඝ කාලීන ඉලක්ක ඇතිකරගන්න.
- එසේ නිශ්චය කරගත් අරමුණු සහ ඉලක්ක සටහන් කරගන්න.
- එසේ සටහන් තබා ගැනීමෙන් ඔබ අනිවාර්ය බැඳීමකට හසුවනවාට අමතරව කල්යාමේදී ඉලක්ක අමතකවීමට ඇති ඉඩකඩ ඇහිරී යයි.

## ඔබගේ ඉලක්ක නිශ්චය කරගන්න

## *Set your Personal Goals.*

ඔබේ ජීවිතයේ අවසන් පරමාර්ථය කරා ගමන් කිරීමට මාර්ගය තීරණය කරන්න. ඒ සඳහා කළ යුතු දෑ ඉලක්ක වශයෙන් නිශ්චය කරගන්න.

මේ අනුව පහත සඳහන් මාතෘකා යටතේ ඉලක්ක නිශ්චය කරගත යුතු වේ.

### වෘත්තීය ඉලක්ක

- පළමුවෙන්ම ජීවනෝපාය ලෙස අප යෙදීමට කැමැති වන වෘත්තිය කුමක් දැයි නිශ්චිත කරගත යුතු වෙනවා. ඒ සඳහා ඉතාමත් සවිස්තර මගපෙන්වීමක් ඉහත පරිච්ඡේදයේ දක්වා තිබෙනවා. ඒ සඳහා වයස බාධාවක් නොවේ. ඕනෑම වයසකදී ඕනෑම කෙනෙකුට තමන්ගේ ජීවිතයට අදාළව ඕනෑම වෙනස්වීමක් ඇති කරගන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය වන්නේ නිවැරදි තේරීම් සහ අදාල වෙනස්කම් කිරීමේ සැබෑම උවමනාවක් පමණයි.
- දැනට යෙදී සිටින රැකියාව තමන්ට නොගැළපෙන බව හැඟෙයි නම් කළ යුතු පළමු දෙය වන්නේ තමන් හට ගැළපෙන්නෙ කුමන අන්දමක රැකියාවක් දැයි

සොයා ගැනීමයි. ඉන්පසුව ඊකියාවට අවශ්‍ය සුදුසුකම් දැනට ඔබ සතුව නොමැති නම් ඒවා සම්පූර්ණ කරගත යුතු වෙනවා. ඊළඟට සුබවාදී බලාපොරොත්තු දල්වාගෙන බලා සිටින්න සුදුසු මොහොතේදී ගණන් බැලූ අවදානමක් සහිත තීරණ ක්‍රියාත්මක කරන්න.

### අධ්‍යාපනික ඉලක්ක

අධ්‍යාපනික වශයෙන් ඔබට සපුරා ගැනීමට උවමනා වී ඇති ඉලක්ක මොනවාද. ඇතැම්විට එම ඉලක්ක වෘත්තියක් අරමුණු කරගත් ඉලක්ක විය හැකියි. තවත් විටෙක ඒවා වෙනත් අවශ්‍යතාවයන් නිසා හෝ හුදු ආත්ම තෘප්තිය අරමුණු කරගත් අධ්‍යාපනික ඉලක්ක විය හැකියි.

### ආර්ථික ඉලක්ක

ඔබේ ආර්ථික මට්ටම කුමක් විය යුතුද යන්න මෙමගින් අදහස් කෙරේ. කිසියම් කාල පරාසයක් තුළ ඔබ විසින් අත්කර ගැනීමට අපේක්ෂිත ආර්ථික ඉලක්කයන් එම ඉලක්කය වෙත එළැඹීම සඳහා වන යථාර්ථවාදී වැඩපිළිවෙලක් ඔබ සතුව තිබිය යුතුය.

### ශාරීරික ඉලක්ක

ශාරීරික වශයෙන් ඔබ අපේක්ෂා කරන වෙනස්කම් ඉලක්ක වශයෙන් නිශ්චය කරගත යුතුයි. උදාහරණයක් ලෙස ඔබ ස්ථුල ශරීරයක් තිබෙන අයකු විය හැකි. ඔබ ඒ පිළිබඳව සැහෙන කාලයක සිට සිත් තැවුලෙන් පසු වූවා වෙන්නට පුළුවන්. එහෙත් ඒ පිළිබඳව කිසිදු ඉලක්කයක් ඔබ සතුව නොතිබිණි. සිත් තැවුලින් පසුවීමෙන් පමණක් කිසිදු ඵලයක් අත් වන්නේ නැහැ. එමගින් ආහාර පාලනය ශරීරයේ තැන්පත්ව ඇති අනවශ්‍ය මේදය දහනය වන පරිදි සකසාගත් දෛනික ජීවන රටාවක් සහ ශාරීරික ව්‍යායාම ඇතුළත් සැලැස්මක් අනුගමනය කළ යුතු වෙනවා. එහෙත් මේ සියල්ලටම මූලික පදනම වන්නේ ශාරීරික ඉලක්කයක්.

### ආකල්පවල අපේක්ෂිත වෙනසක් සඳහා වන ඉලක්ක

ජීවිතයේ සාර්ථකත්වය කෙරෙහි ආකල්පවල බලපෑම විස්තර සහිතව ඉහත පරිච්ඡේදයෙහි දක්වා තිබෙනවා. සැබැවින් කලින් කලට ජීවිත අත්දැකීම්වලත්, ආකල්පවලත් ධනාත්මක වෙනස්කම් සිදුවිය යුතු වෙනවා. මොකද ජීවිතයේ ඉරණම තීන්දු වන්නේ අප දරණ ආකල්ප මත බැවිනි. ඒ නිසා අවශ්‍ය අවස්ථාවලදී ආකල්ප වෙනස්කම් වලට බඳුන් කිරීම සඳහා වන ඉලක්ක ඇති කරගත යුතු වෙනවා.

> ඉලක්ක සාර්ථක ලෙස ජය ගැනීමෙන් අප තුළ සිදුවන පරිවර්තනය, ඉලක්ක ජය ගැනීමෙන් ලැබෙන ප්‍රතිඵලයට වඩා බොහෝ වටින්නේය.
>
> - සිග් සිග්ලර් -
> ඇමෙරිකන් ලේඛක සහ දේශක

### සමාජ ජීවිතයට අදාළ ඉලක්ක

මෙයින් අදහස් කෙරෙන්නේ සමාජ ජීවිතයේදී අපට බලපාන ඉලක්කයි. සැබැවින්ම සමාජ ජීවිතයේ සාර්ථකත්වය මුළු ජීවිතයටම බලපානවා. එබැවින් සමාජ සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීම විවිධ සංගම්වල සාමාජිකත්වය ලබා ගැනීම සහ සාමාජික යුතුකම්වලට අදාළ ඉලක්ක ආදිය මේ යටතට වැටෙනවා. සමාජ සම්බන්ධතා කෙරෙහි අදාළ වන පුද්ගලික හැසිරීම් රටාවන්හි සිදුවිය යුතු වෙනස්කම්ද ඉලක්ක වශයෙන් ගත යුතු වෙනවා.

### පෞද්ගලික ගෘහ ජීවිතයට අදාළ ඉලක්ක

විවාහ වීම, දරුවන් බිහි කිරීම, නිවාස තැනීම, විනෝදාස්වාදය සඳහා කිරීමට අදහස් කරගෙන සිටින දේවල්වලට අදාල ඉලක්ක ආදිය මින් දැක්වේ. පොතක් පළකිරීම, විදේශ සංචාරයක යෙදීම, කලක සිට තිබූ ආසාවක් වැනි දේවල්ද පෞද්ගලික ජීවිතයේ ඉලක්ක වශයෙන් ගත හැකිය.

### ඔබගේ ආධ්‍යාත්මික දියුණුව සඳහා අපේක්ෂිත ඉලක්ක.

ජීවිතයේ සාර්ථකත්වය සඳහා සාර්ථක අධ්‍යාත්මික පසුබිමක් අත්‍යවශ්‍ය වෙනවා. මේ සඳහා ආගමික ඉගැන්වීම්වලින් ඉමහත් පිටිවහලක් ලැබෙන නමුදු අධ්‍යාත්මික ජීවිතය යන්නෙන් අදහස් කෙරෙන්නේ කිසියම් ආගමික දර්ශනයකට සීමා වීමම නොවෙයි. ඔබේම ඇදහීම් විශ්වාසයන් සහ සදාචාර විනිශ්චයන්ට අනුව ඔබේ ආධ්‍යාත්මික ජීවිතය සකස් කර ගැනීම කළ හැකි ඊට අදාළ ඉලක්කයන් ද සකසා ගත හැකියි.

තමන් ගමන් කළ යුතු දිශාව නිශ්චිතව දන්නා අයවලුන් හට ලෝකය, මග හෙළි පෙහෙළි කොට දෙයි.

## සාර්ථක ඉලක්කවල තිබිය යුතු අනිවාර්ය අංග

### නිශ්චිත සහ පැහැදිලි වීම

සාර්ථක ඉලක්කයක මූලිකම ලක්ෂණයක් වන්නේ එය ඉතාමත්ම පැහැදිලි එමෙන්ම පහසුවෙන් ග්‍රහණය කළ හැකි සහ මනෝ චිත්‍රයක් මවාගත හැකි එකක් වීමයි. මේ මිහිපිට සාර්ථක වී ඇති ඕනෑම ඉලක්කයක් පළමුවෙන්ම නිර්මාණය වී ඇත්තේ මිනිස් මනස තුළය. එබැවින් එවැනි ඕනෑම ඉලක්කයක් ඉතාමත් පැහැදිලි සහ තියුණු ලෙස මනසෙහි නිර්මාණය විය යුතුය. මනසෙහි පැහැදිලිව සටහන් වූ ඕනෑම දෙයක් යථාර්ථයක් බවට පත්කර ගැනීම ප්‍රායෝගිකව කළ හැකියි. එමෙන් ම පැහැදිලිව මවාගත නොහැකි ඉලක්ක වෙත ළඟාවීම අපහසු කාරණයක් වෙනවා.

### යථාර්ථවාදී සහ තාර්කික වීම

ඉලක්ක සාක්ෂාත් කරගැනීමට නොහැකිවීම කෙරෙහි බලපාන ප්‍රධානම කාරණය වන්නේ ඉලක්කය ප්‍රායෝගික වශයෙන් යථාර්ථවාදී සහ තාර්කික නොවීමයි.

47 පිටුව බලන්න...





## යුද්ධ හමුදා සාමාජිකයින් වන ඔබ සඳහා රුපියල් 700.00 කට රුපියල් මිලියන 20 ක ජීවිතාවරණයක් සමග සෞඛ්‍යාවරණයක්

# සුවසහන

## අරමුදලෙන්ම පමණයි...

"පවුලේ කෙනෙකුට අසනීපයක් වුණු වෙලාවට, ලෝකයේ කොහෙන්ම හරි හොඳම ප්‍රතිකාර ලබා ගන්න තමයි අපි හැමෝම බලන්නේ. අපි ගාව සමහර විට ඉතුරුම් තියෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් හදිස්සියකට උකස් කරන්න රන් භාණ්ඩ, ඉඩම්, දේපළ තියෙන්න පුළුවන්. හැබැයි එහෙම කලාම අපේ දරුවන්ගේ අධ්‍යාපනය හා අනාගත අභිවෘද්ධියට ගේ දොරවලට ඉතුරු කරපු මුදල් අපෙන් වැයවෙලා අපේ එදිනෙදා ජීවිතය තවත් ණය බරින් පීඩිත විය හැකියි.

ඒ නිසා තමයි මසකට රු 700/- ක් වැනි ඉතා අඩු වාරික මුදලකට, වඩා වැඩි ප්‍රතිලාභ ලබා දෙන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පමණක් ආවේණික රක්ෂණ යෝජනා ක්‍රමයක් වශයෙන් සුවසහන අරමුදල 2014 වර්ෂයේ ජනවාරි මස සිට සුභසාධක අධ්‍යක්ෂක මණ්ඩලය යටතේ ආරම්භ කර තිබෙන්නේ. රටට, ජාතියට දිවි හිමියෙන් අභිමානවත්ව සේවයක් ඉටුකරන ඔබගේ සේවය ඇගයීමක් වශයෙන් යුද්ධ හමුදාවෙන් ලබාදෙන සුවිශේෂී වරප්‍රසාද වලින් ප්‍රමුඛතම වරප්‍රසාදය වනුයේ සුවසහන රක්ෂණ යෝජනා ක්‍රමයයි.

**ඔබ යුද්ධ හමුදා සක්‍රිය සේවයේ යෙදී සිටිද?**

## නැත්නම්.....

**ඔබ ගෞරවණීය සේවයෙන් විශ්‍රාම ගොස් සුවයෙන් සිටිද?**

ඔබත්, ඔබගේ පවුලේ සාමාජිකයන්ගේත් සෞඛ්‍ය රක්ෂණාවරණයක් හා ජිවිත රක්ෂණයක් ඇතිව සුරක්ෂිත අනාගතයක් සඳහා සුවසහන අරමුදල ඔබගේ වගකීම භාරගැනීමට සූදානම්!

යුද්ධ හමුදාධිපතිතුමන්ගේ උපදෙස්වලට අනුව යුද්ධ හමුදා විධායක ජෙනරාල් තුමාගේ මඟපෙන්වීම යටතේ සුභසාධක අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් වර්තමානයේ රටේ පවතින ආර්ථිකමය තත්ත්වය හමුවේ සියලුම වෛද්‍ය උපකරණ හා වෛද්‍ය සේවාවන්වල මිල සීඝ්‍රයෙන් ඉහල යාම මෙන්ම යුද්ධ හමුදා සාමාජිකයින්/පවුලේ සාමාජිකයින් හට ඇතිවන රෝගාබාධ සඳහා ලබාගන්නා ප්‍රතිකාර වෙනුවෙන් දැනට හිමිගන්වනු ලබන ප්‍රතිලාභ මුදලින් එම වියදම් පියවා ගැනීමට අපහසු බැවින් හා එවැනි අවස්ථාවල ඔවුන් පත්වන මූල්‍යමය අපහසුතාවයන් යම්තාක් දුරට මඟහරවා ගැනීමට මාසික සාමාජික වාරික මුදල වන රු.700/- වැඩි කිරීමකින් තොරව අරමුදලේ මූල්‍ය තත්ත්වයට බලපෑමක් නොවන අයුරින් පහත සඳහන් පරිදි අත්‍යාවශ්‍ය ප්‍රතිලාභ හිමිකම්වල මූල්‍යමය සීමාවන් වැඩිකිරීම හා නව ප්‍රතිලාභ හිමිකම් හඳුන්වාදීම සුවසහන අරමුදල විසින් 2023.07.07 වන දින සිට ක්‍රියාත්මක කර ඇත.

අ. බරපතල රෝග වෙනුවෙන් ප්‍රතිකාර ලබා ගැනීමේදී ඒ සඳහා හිමිකම් ඇති රු. 1,500,000.00 (රුපියල් මිලියන 1.5) ක මුදල ප්‍රමාණවත් නොවන්නේ නම් සාමාන්‍ය රෝහල්ගත කිරීම් යටතේ පවුල් ඒකකයක් සඳහා වාර්ෂිකව හිමි රු. 200,000.00 ක මුදල සහ බරපතල නොවන ශල්‍යකර්ම යටතේ පවුල් ඒකකයක් වෙනුවෙන් වාර්ෂිකව හිමි රු. 300,000.00 ක ප්‍රතිලාභ මුදල් එම වසර තුළ ලබා ගෙන නොමැති නම් එම මුදල සමඟ රු. 2,000,000.00 (රුපියල් මිලියන 2) ක මුදලක් ලබාගැනීමට හැකියාව ඇත.

ආ. බරපතල රෝග කාණ්ඩය යටතේ රෝහල්ගතවීමකින් තොරව බාහිරින් මිලදී ගන්නා ඖෂධ, ශල්‍ය වෛද්‍ය උපකරණ, සැරහුම් ද්‍රව්‍ය, වෛද්‍ය පරීක්ෂණ, වෛද්‍ය හමු (**Channeling**) හා ඖෂධ (***Drugs***) බිල්පත් වෙනුවෙන් වැයවන මුදල බරපතල රෝග කාණ්ඩය යටතේ හිමිකම් ඇති රු.1,500,000.00 මුදලට යටත්ව ප්‍රතිපූර්ණය කිරීමට හැකියාව ඇත.

ඇ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා පමණක් විශේෂ ප්‍රතිලාභ හිමිගැන්වීමක් වශයෙන් ඔවුන් වෙනුවෙන් සිදුකරනු ලබන කථන පුහුණුව, සංඥා පුහුණුව හා මනෝ චිකිත්සාව වැනි විශේෂ ප්‍රතිකාර සඳහා වෛසේඅම නිර්දේශයට අනුව සාමාන්‍ය රෝග කාණ්ඩය යටතේ හිමි රු.200,000.00 මුදලට යටත්ව ප්‍රතිපූර්ණය කිරීමට හැකියාව ඇත.

ඈ. දරුවන් සඳහා පමණක් මුඛ හා දන්ත ප්‍රතිකාර සඳහා දන්තසේවාඅම/වෛසේඅම අධ්‍යක්ෂකගේ අනුමැතියට යටත්ව පහත සඳහන් අවස්ථාවන් සඳහා පමණක් සාමාන්‍ය රෝග කාණ්ඩය යටතේ හිමි රු.200,000.00 හා බරපතල නොවන ශල්‍යකර්ම යටතේ හිමි රු. 300,000.00 ක මුදල සමඟ රු.500,000.00 ක මුදලට යටත්ව සුවසහන අරමුදල වෙතින් ප්‍රතිපූර්ණය කිරීමට හැකියාව ඇත.

1. දත් ඇදි (*Removable Dentures*)
2. ස්නායු පිරවීම (*Root Canal Treatment*)
3. විකලාංග දන්ත වෛද්‍ය ප්‍රතිකාර (*Orthodontic Treatments*)
4. මුඛ හා හනුක ශල්‍ය වෛද්‍ය ප්‍රතතිකාර (*Oral and Maxillofacial Surgeries*)

ඉ. සාමාජිකයා/පවුලේ සාමාජිකයින් හට හදිසි අනතුරු තත්ත්වයකදී හෝ බරපතල රෝගාබාධ තත්ත්වයකදී සිදුවන ඔත්පලවීමක් මත රෝහල් වෙතින් නේවාසිකව ප්‍රතිකාර ලබාගැනීමට නොහැකි අවස්ථාවන්වලදී නිවෙස්ගත තව ප්‍රතිකාර කිරීමට වෛද්‍යවරුන් විසින් උපදෙස් ලබාදී ඇති අවස්ථාවක රෝගියාගේ සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කිරීම සඳහා අධිපෝෂිත ආහාර වට්ටෝරු, අධිපෝෂිත පිටි වර්ග හා පුද්ගලික සනීපාරක්ෂක ද්‍රව්‍ය , ඖෂධ, සැරහුම් හා වෙනත් වෛද්‍ය උපකරණ බාහිරින් මිලදී ගැනීමට වෛසේඅම නිර්දේශය හා සුසාඅම නිලධාරියකුගේ ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසුව කරන ලද නිර්දේශය මත සාමාන්‍ය රෝග කාණ්ඩය යටතේ හිමිකම් ඇති රු.200,000.00 මුදලට යටත්ව ප්‍රතිපූරණය කිරීමට හැකියාව ඇත.

ඊ. වයස අවුරුදු 22 දක්වා පමණක් සාමාජිකයින්ගේ දරුවන් සඳහා හදිසි අනතුරකදී පූර්ණ හෝ අර්ධ ආබාධිත තත්ත්වයට පත්වුවහොත් (උපතේ සිට ඇතිවී තිබෙන ස්වාභාවික ආබාධිත තත්ත්වයන් හැර) වෛසේඅම වෙතින් පත්කරන වෛද්‍ය මණ්ඩලයක් වෙතින් ලබාදෙනු ලබන නිර්දේශිත ආබාධිත ප්‍රතිශතයට අනුව ආබාධිත වන්දි මුදල (100%) ක් එනම් රු.1,000,000.00 (මිලියනයක්) ක උපරිමයකට යටත්ව ප්‍රතිලාභ මුදලක් ලබාදීම.

උ. සාමාජිකයා හට රාජකාරියේදී හෝ රාජකාරියෙන් තොර අවස්ථාවන්හිදී සිදුවන හදිසි අනතුරු තත්වයකදී පූර්ණ කාලීන පූර්ණ ආබාධිත හා පූර්ණ කාලීන අර්ධ ආබාධිත තත්ත්වයන් සඳහා යුද්ධ හමුදා වෛද්‍ය මණ්ඩලයක් මගින් ලබාදෙනු ලබන ආබාධිත ප්‍රතිශතයට අනුව රාජකාරියට අදාල හෝ අදාල නොවන හදිසි අනතුරක් හේතුවෙන් පමණක් සිදුවන ආබාධිත තත්ත්වයන් සඳහා ආබාධිත ප්‍රතිශතය අනුව උපරිමය (100%) එනම් රු. 1,000,000.00 (මිලියනයක්) ක උපරිමයකට යටත්ව ප්‍රතිලාභ මුදලක් ලබාදීම.

ඌ. සාමාජිකයා මියගිය අවස්ථාවේදී කලත්‍රයා හට සාමාජික මරණ වෙනුවෙන් හිමිගන්වන රුපියල් ලක්ෂ 10 ක මුදලින් රු. 500,000.00 ක් (එනම් අඩක්) පමණක් තම ස්වකීය කැමැත්ත මත ලබාගෙන ඉතිරි රු.500,000.00 ක මුදල සුවසහන අරමුදලේ රඳවා තබාගෙන එම මුදලින් ඉදිරි සාමාජික වාරික මුදල් කලත්‍රයාගේ වයස අවුරුදු 80 වන තෙක් අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර, ඒ අනුව වයස අවුරුදු 80 දක්වා කලත්‍රයා හට සාමාජිකත්වය පවත්වාගෙන යාමට හැකියාව ඇත. (කල්පිරෙන වයස අවුරුදු 80 වන තෙක් සාමාජිකයා මියගිය දින සිට ඉදිරියට සාමාජික වාරික මුදල් ගෙවීමක් සිදුකිරීමට අවශ්‍ය නොවේ) ඒ අනුව සක්‍රීයව හා අඛණ්ඩව සුවසහන අරමුදලේ සියලුම වරප්‍රසාද, හිමිකම් හා ප්‍රතිලාභ සහිතව සාමාජිකත්වය සක්‍රියව පවත්වාගෙන යාමට කලත්‍රයාට හා නීත්‍යානුකූල දරුවන් හට වයස අවුරුදු 30 දක්වා (විශේෂ අවශ්‍ය තා ඇති දරුවන් සඳහා වයස් සීමාවේ බලපෑමක් නොමැත) ප්‍රතිලාභ ලබාගැනීමේ හැකියාව ඇත. කලත්‍රයා අවු: 80 ට පෙර මියගිය හොත් රඳවාගත් රු. 500,000.00 ක මුදලින් සාමාජික වාරික මුදල් සඳහා අය වී ඉතිරි මුදලක් ඇත්නම් එම මුදල හා කලත්‍ර මරණ වෙනුවෙන් හිමි රු. 500,000.00 ක මුදල සමඟ නීත්‍යානුකූල දරුවන් වෙත හිමිගැන්වීමට කටයුතු කරනු ලැබේ.

<table>
<tr><th colspan="2">ප්‍රතිලාභ</th><th>නව ප්‍රතිලාභ /මූලයමය සංශෝධන කර ඇති ප්‍රතිලාභ වටිනාකම රු.</th></tr>
<tr><td colspan="3">සාමාජිකයා</td></tr>
<tr><td colspan="2">සාමාජික වයස් සීමාව</td><td>අවු: 80 දක්වා</td></tr>
<tr><td colspan="2">සාමාජික මරණ සඳහා</td><td>1,000,000.00</td></tr>
<tr><td colspan="2">හදිසි අනතුරු (ආබාධිත ප්‍රතිශතය අනුව 100%)</td><td>1,000,000.00</td></tr>
<tr><td colspan="2">බරපතල රෝග ආවරණය (ශල්‍යකර්ම, රෝහල්ගත නොවී බාහිරින් මිලදී ගන්නා ඖෂධ, ශල්‍ය උපකරණ, වෛද්‍ය පරීක්ෂණ, වෛද්‍ය හමු (Channeling) හා ඔසුසල් (Pharmacy) බිල්පත් ඇතුළත්ව)</td><td>1,500,000.00</td></tr>
<tr><td colspan="2">ඇස්කන්නාඩි දීමනාව (වසර 3 කට වරක් රු:20,000.00 ක් හිමිගන්වනු ලබන අතර වසර 3 කට අඩුකාලයකදී උපැස් යුවලේ අළුත්වැඩියා කටයුතු සඳහා එක් වරක් රු:10,000.00 ක් හිමිගන්වනු ලැබේ)</td><td>20,000.00</td></tr>
<tr><td colspan="3">කලත්‍රයා</td></tr>
<tr><td colspan="2">වයස් සීමාව</td><td>අවු: 80 දක්වා</td></tr>
<tr><td colspan="2">මරණ</td><td>500,000.00</td></tr>
<tr><td colspan="2">බරපතල රෝග ආවරණය</td><td>1,500,000.00</td></tr>
<tr><td colspan="3">දරුවන්</td></tr>
<tr><td colspan="2">වයස් සීමාව (විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වයස් සීමාවේ බලපෑමක් නොමැත)</td><td>අවු: 30 දක්වා</td></tr>
<tr><td colspan="2">දරු උපත් සඳහා</td><td>10,000.00</td></tr>
<tr><td rowspan="2">මරණ</td><td>අවුරුදු 01 ට වැඩි දරුවන් සඳහා</td><td>100,000.00</td></tr>
<tr><td>අවුරුදු 01 ට අඩු දරුවන් සඳහා</td><td>50,000.00</td></tr>
<tr><td colspan="2">බරපතල රෝග ආවරණය</td><td>1,500,000.00</td></tr>
<tr><td colspan="2">වයස අවු: 22 දක්වා දරුවන්ගේ හදිසි අනතුරකදී ඇතිවන ආබාධිත තත්වයකදී වෛද්‍යම වෙතින් නිර්දේශිත ආබාධිත ප්‍රතිශතය අනුව 100%</td><td>1,000,000.00</td></tr>
<tr><td colspan="3">බරපතල රෝග ආවරණය</td></tr>
<tr><td colspan="2">බරපතල නොවන ශල්‍යකර්ම වෙනුවෙන් වාර්ෂිකව හිමි රු.300,000.00 ක මුදල හා සාමාන්‍ය රෝග වෙනුවෙන් වාර්ෂිකව හිමි රු.200,000.00 සමග</td><td>500,000.00</td></tr>
<tr><td colspan="3">විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා</td></tr>
<tr><td colspan="2">කථන/සංඥා පුහුණුව හා මනෝ චිකිත්සාව වැනි විශේෂ ප්‍රතිකාර සඳහා සාමාන්‍ය රෝහල්ගත කිරීම් යටතේ පවුල් ඒකකයක් සඳහා වාර්ෂිකව හිමි මුදලින් හිමිගන්වනු ලැබේ</td><td>200,000.00</td></tr>
<tr><td colspan="3">පවුල් ඒකකයක් සඳහා වසරකට (අදාල වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා) සෞඛ්‍ය සහ රෝහල් ප්‍රතිලාභ (අවිවාහක අයවළුන්ගේ දෙමාපියන්ද ඇතුළුව)</td></tr>
<tr><td colspan="2">රෝහල්ගත කිරීම් - සාමාන්‍ය (රජයේ ලියාපදිංචි පුද්ගලික රෝහල්, ආයුර්වේද රෝහල්, ඇස්කන්නාඩි, ගමන් වියදම් උපරිම දින 7 x 1000.00 = 7,000.00 හා රෝග පරීක්ෂණ 419 ඇතුළත්ව)</td><td>200,000.00</td></tr>
<tr><td colspan="2">රෝහල්ගත කිරීම් - සාමාන්‍ය රෝහල්ගත කිරීම් යටතේ පවුල් ඒකකයක් සඳහා වාර්ෂිකව හිමි මුදලින් හිමිගන්වනු ලැබේ. (හදිසි අනතුරු තත්ත්වයකදී හෝ රෝගාබාධ තත්වයකදී සිදුවන ඔත්පලවීමක් හේතුවෙන් නිවෙස්ගතව ප්‍රතිකාර ලබාගැනීමේදී අධිපෝෂිත ආහාර වට්ටෝරු, අධිපෝෂිත පිටි වර්ග හා පුද්ගලික සනීපාරක්ෂක ද්‍රව්‍ය, ඖෂධ, සැරහුම් හා වෙනත් වෛද්‍ය උපකරණ බාහිරින් මිලදී ගැනීම සඳහා ප්‍රතිලාභ හිමිකම)</td><td>200,000.00</td></tr>
<tr><td colspan="2">රෝහල්ගත කිරීම් - බරපතල නොවන සැත්කම් (අදාල වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා)</td><td>300,000.00</td></tr>
<tr><td colspan="3">අවිවාහක අයවළුන්ගේ දෙමාපියන් සඳහා බරපතල රෝග ආවරණය (ජීවිත කාලයටම)</td></tr>
<tr><td colspan="2">මව</td><td>1,500,000.00</td></tr>
<tr><td colspan="2">පියා</td><td>1,500,000.00</td></tr>
<tr><td colspan="3">බරපතල රෝග සඳහා ප්‍රතිකාර ලබාගැනීමේදී ඒ වෙනුවෙන් හිමි රු.1,500,000.00 (මිලියන 1.5) මුදල ප්‍රමාණවත් නොවන අවස්ථාවක පවුල් ඒකකයක් සඳහා වාර්ෂිකව බරපතල නොවන ශල්‍යකර්ම වෙනුවෙන් හිමි රු. 300,000.00 හා සාමාන්‍ය රෝග වෙනුවෙන් වාර්ෂිකව හිමි රු. 200,000.00 සමග රු: මිලියන 2 දක්වා ප්‍රතිලාභ හිමිගන්වනු ලැබේ.</td></tr>
</table>



එ. සුවසහන අරමුදල් ව්‍යවස්ථාවේ ඡේද අංක 13 (ඉ) ට අනුව ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමේ කාලසීමාව දින 90 ක සීමාව ප්‍රමාණවත් නොවන බැවින් එය වසරක් (අවු: 1) දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර ඇත.

සුවසහන අරමුදලේ සාමාජිකත්වය පවත්වාගෙන යන සාමාජිකයා සහ ඔහුගේ යැපෙන්නන් (කලත්‍රයා/දූ දරුවන් සහ අවිවාහක සාමාජිකයින්ගේ මව/පියා) වෙනුවෙන් නවතමයෙන් හඳුන්වා දෙන ලද ප්‍රතිලාභ සහ ක්‍රියාත්මක වන ප්‍රතිලාභවල වැඩිකරන ලද මූල්‍යමය සීමාවන් පහත සඳහන් පරිදි වේ.

යුද්ධ හමුදාධිපතිතුමා විසින් ඉහත සඳහන් පරිදි සුවසහන අරමුදල වෙතින් යුද්ධ හමුදා සාමාජිකයින් වෙත ලබාදෙන ප්‍රතිලාභ ඉහළ නංවන්නේ රණවිරුවන්ට අභිමානවත් අයුරින් සමාජය ඉදිරියේ නැගී සිටීමට අවස්ථාව සලසා දීම සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ජාතියේ සැබෑම ආරක්ෂකයින් වශයෙන් ඔබ සිදුකරන සේවය අගය කිරීම වෙනුවෙනි.

සුවසහන අරමුදල සම්බන්ධව ඔබට පැන නගින ඕනෑම ගැටලුවක් සම්බන්ධව වැඩි විස්තර සඳහා නවතමයෙන් ස්ථාපිත කරන ලද සුවසහන *Hotline* ක්ෂණික දුරකථන මාර්ගයෙන් දවසේ පැය 24 පුරාම අවශ්‍ය විස්තර දැනගත හැක.

## අමතන්න මෙම දුරකතන අංක වෙත

*Hot Line* - 070-2691666, 071-3158572, 070-3158510
යුහ දිගුව - 0114050874, 0114050885, 0114050882, 0114050232,
මානි 1 (සුවසහන අරමුදල) - 076-6907328
මානි 2 (විශ්‍රාම අංශය) - 077-9031015

නිදහස්, ප්‍රීතිමත්, සෞඛ්‍ය සම්පන්න දිවි පෙවෙතක් ඔබට ලබාදීම හා ඔබගේත්, ඔබගේ පවුලේ සාමාජිකයන්ගේත් සුරක්ෂිතභාවයේ ආරක්ෂකයා වශයෙන්ද, ඔබගේ ජීවිතයට ආරක්ෂකයෙකු වන්නට සුවසහන අරමුදල වන අප සූදානම්.
**ඔබට සරණක්... සුවයට සහනයක්...**
සුවසහන අරමුදල යුද්ධ හමුදා සාමාජිකයින් වන ඔබ සඳහාමයි.

සටහන-:
පුනසාධක අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

43 පිටුවෙන්...

**අප කටයුතු කරන්නේ සැප සහ සුඛෝපභෝගී ජීවිතය මූලිකම අවශ්‍යතා ලෙස සලකාය. එහෙත් ජීවිතයේ සතුට සඳහා අවශ්‍ය වන්නේ අපගේ උපයෝගීතාවය පවත්වාගැනීම සඳහා වන අරමුණක් පමණී.**

**- වාලස් කිංග්ස්ලි -**
**බ්‍රිතාන්‍ය ඉතිහාසඥ සහ සාහිත්‍යකරු**

සමහරවිට ජීවිතයේ අප ඉලක්කය ඇති කර ගන්නේ ඒවා පිළිබඳව ශක්‍යතා අවබෝධයකින් නොවෙයි එවැනි අවස්ථාවලදී අවසන් ප්‍රතිඵලය වන්නේ අසාර්ථකවීමයි. මෙසේ වීමට බලපාන අනෙක් සාධකය වන්නේ ඉලක්කය අපගේ ජීවිත පරමාර්ථය සමග නොගැළපීමයි. එනම් ජීවිතයේ ඇතැම් අවස්ථාවල බාහිර බලපෑම් මත ඉලක්ක සඳහා පෙළඹෙනවා. එහෙත් එම ඉලක්කය වෙත යාම සඳහා අත්‍යවශ්‍ය වන හැකියාවන් කුසලතා සහ ස්වයං පෙලඹවීමක් නැති බැවින් එවැනි ඉලක්ක සාර්ථක වීමට ඇති ඉඩකඩද අඩුයි. (උදාහරණයක් ලෙස බාහිර බලපෑම් නිසා යම් අයකුගේ සහජ හැකියාව ක්ෂේත්‍රයට පරිබාහිර ක්ෂේත්‍රයක අධ්‍යාපනයෙහි යෙදීමෙන් සාර්ථක අරමුණු කළ ඉලක්ක වෙත ළගාවීම අපහසු විය හැකියි. එබැවින් ඉලක්ක ඇති කර ගැනීමේදී ඒවායේ යථාර්ථවාදී භාවය මෙන්ම ඒවා කොතෙක් දුරට අපගේ ජීවිතය පරමාර්ථ හා සමග ගැළපෙයිද යන්න පිළිබඳවත් සැලකිල්ලට යොමු කළ යුතු වෙනවා.)

### සාක්ෂාත්කරණය පැහැදිලිව දැක ගැනීමට පුළුවන්කම.

ඉලක්කයට ළගාවීම පැහැදිලිව පෙනෙන්නට තිබීම දුෂ්කරතා මධ්‍යයේ උද්‍යාමය පවත්වාගැනීම සඳහා මහගු පිටුවහලක් සපයනවා. එයම අපව ඉලක්කය හඹායාම සඳහා පෙළඹවීමක් බවට පත්වෙනවා. එබැවින් අවසන් ඉලක්කය මෙන්ම ඊට මෙපිටින් ඇති අතර මැදි ඉලක්කද පැහැදිලිව පෙනෙන්නට තිබිය යුතුයි. එවැනි අතරමැදි ඉලක්ක එකිනෙක පසුකර යාමේදී ඇතිවන සතුටත් අවසන් ඉලක්කය ප්‍රායෝගිකවම ජයගත හැකි වන බවට ඇතිවන හැඟීම යන සාධක දෙකම අවසන් ඉලක්කය කරා යාමට පහසු කරවයි.

### නිශ්චිත කාල රාමුවකට යටත් වූවක් වීම.

හැම විටම ඉලක්කයක් සාක්ෂාත් කරගැනීම නිශ්චිත කාල රාමුවක් තුළ සිදුවිය යුතුය. මක්නිසාද යත් අපට ජීවත්වීම සඳහා ඇත්තේ සීමා සහිත කාලයක් බැවිනි. තවද ඇතැම් ඉලක්කයන්ට සීමා සහිත කාල පරාසයකින් පසුව ළගාවීමෙන් පලක් නැත. එබැවින් ජීවිතය අප විසින් ඇති කර ගන්නා ඕනෑම ඉලක්කයක් නිශ්චිත කාල රාමුවකට යටත් වූවක් විය යුතුය.

සටහන-:
ලුතිනන් කර්නල් චන්න කරුණාරත්න රයුප (විශ්‍රාමික)
ජීවිත මාර්ගෝපදේශන උපදේශක

## මරියම් ගම්මානයක සොඳුරු මතකයන්



# දෙලොවක් අතර ජීවත්වෙමින් ගම්මාන - ජනපද අත්නොහැරි ගැමියන්

බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් ලක් දෙරණේ උග්‍ර වෙමින් පැවති වකවානුවේ ශ්‍රී ලංකා රජයේ ආරාධනයෙන් ඉන්දියානු සාම සාධක හමුදාව *(IPKF)* 1987.07.30 දින ශ්‍රී ලංකාවට පැමිණ ක්‍රමයෙන් උතුරු නැගෙනහිර පළාත්වල එම *LTTE* ත්‍රස්තයින්ගේ ක්‍රියාකාරකම්වලට විරුද්ධව කටයුතු කරන ලදි. ඒ සමගම ඔවුන් ද්‍රවිඩ ගම්මාන, ද්‍රවිඩ වැසියන් *LTTE* සංවිධානයෙන් මුදාගැනීමේ කාර්යයේද නිරත විය. නමුත් විශේෂයෙන් නැගෙනහිර සිංහල ගම්මාන ආරක්ෂාව පිළිබඳ ඔවුන්ගේ වැඩි අවධානයක් යොමු නොවූ බැවින් අනෙකුත් ජාතීන් සමග විශේෂයෙන් සිංහල ගම්මාන ආරක්ෂා කිරීමේ කාර්යය ශ්‍රී ලංකා යුද හමුදාවට පැවරිණ. ඒ අනුව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය 22 වන බලසේනාව යටතේ මොරවැව බල ප්‍රදේශයේ ජනයා හා අනෙකුත් දෑ ආරක්ෂා කිරීමේ කාර්යයේ නිරතවූයේ යුද හමුදාවයි.

මේ අතර, මොරවැව බලප්‍රදේශයේ කඳවුරු ලා සිටි ඉන්දියානු සාම සාධක හමුදා මගින් ඔවුන්ගේ කටයුතු ද සිදුකරන ලදී. මොරවැව යුද්ධ හමුදා බළඇණි මූලය යටතේ (ඉන්දියානු සාමසාධක හමුදා බළඇණි මූලයක්ද යාබදව පිහිටා තිබුණි) නොච්චිකුලම යුද්ධ හමුදා බල ප්‍රදේශයේ අදාළ ගම්මාන, භූමිය ඇතුළු අනෙකුත් දෑ ආරක්ෂා කිරීමේ කටයුතු භාරව කඳවුරු භාර නිලධාරී අණදෙන ලෙස මා 1989 මුල භාගයේදී මාස කිහිපයක් කටයුතු කරනු ලැබීය. මේ වනවිට නොච්චිකුලම ද්‍රවිඩ ගම්මානය ආශ්‍රිතව නොච්චිකුලම පාසල් භූමියේ *IPKF* කඳවුර ද විය. එහි ජනතාව ජීවිකාව ලෙස වී ගොවිතැන ප්‍රධාන ආදායම් මාර්ගය කොටගෙන තිබිණ. අමතරව ගොඩ බෝග, කුකුළන්, ගවයින් ඇති කිරීමද ඔවුන්ගේ අමතර ආදායම් මාර්ගයකි. රාත්‍රී ගම්මාන ආරක්ෂා කිරීමේ ග්‍රාමාරක්ෂක රාජකාරියට රජයෙන් දීමනාවක් ගෙවීමද සිදුවූ අතර, එය මොවුනට අස්වැසිල්ලක් විය. මහදිවුල්වැව යාය *1 (tract 1)* (ජනපදය), මහදිවුල්වැව යාය 2, කම්බකොට්ටේ ගම්මානයද මීට ඇතුළත් විය. මීගස් වැව ජලාශයේ සිට ඇළ මාර්ගයක් ඔස්සේ කිලෝමීටර 4 - 5 ක පමණ දුරක් ජලය (ආසියානු සංවර්ධන බැංකුව යටතේ ක්‍රියාත්මක වූ වාරි ව්‍යාපාරියකි) මහදිවුල්වැව යාය2 දක්වා සැපයීම සිදුවිය.

ග්‍රාමාරක්ෂකයින් පුහුණු කිරීමේ කාර්යය මා භාරයේ සිදු වූ අතර, පරිපාලන කටයුතු, වැටුප් ගෙවීම් ආදී දෑ සිදුකෙරුණේ මොරවැව පොලිසිය මගිනි. එහිදී ග්‍රාමාරක්ෂක භටයින් (ගම්වැසියන්) 100 කට පමණ පුහුණුව ලබාදුන් අතර, රිපීටර් භාවිතය හා අදාළ අනෙකුත් භූමියේ සිදුකළ යුතු දෑ එම පුහුණුවට අයත් විය. *IPKF* පුහුණුව ලැබූ *(Citizen Army)* තරුණයෝ ද ඒ අතර වූහ.

මා විසින් පුහුණු කරන ලද ග්‍රාමාරක්ෂකයකු දිනක් රාත්‍රී බංකරයක රාජකාරියේ සිටියදී උගත් දේ අකුරටම ක්‍රියාවට නැංවූ අවස්ථාවක්ද මතකය. මැදියම් රැයේ මහදිවුල්වැව පියවර 01 ග්‍රාමයේ ඇල අසල වූ බංකරයක් දෙසින් අතු කඩන ශබ්දයක් ඇසී ඇත. එහිදී, රාජකාරියේ යෙදී සිටි ග්‍රාමාරක්ෂක භටයා හමුදාවේ ක්‍රමයට හඳුනාගැනීමේ ක්‍රමවේදය *(Challenging Procedure)* සිදුකර ඇත. *Holt* "නවතිනු", *Hands Up* "අත් ඔසවනු" ආදී වශයෙනි. නමුත්, එහිදී පැමිණ ඇත්තේ සද්ධන්ත අලියෙකි. අලියා නැවතී ඇත. හොඬයද ඔසවා ඇත. හඳුනාගැනීමෙන් අනතුරුව අතේ වූ විදුලි පන්දම වැනීම තුළින් ඌ ආපසු හරවා යවා ඇත. පසුදා මේ ඇබැද්දිය මා හටද දැනගන්නට ලැබිණ.

ක්‍රියාන්විත පරිසරයක් පැවතියද එම ගම්මානවල පාසල්, පන්සල්වල ආගමික කටයුතුද ක්‍රියාත්මකව පැවතිණ. නමුත්, මහදිවුල්වැව, මොරවැව හරහා ත්‍රිකුණාමලයට ගමන් බිමන්

යැමට සිවිල් වැසියන්ට ආරක්‍ෂක හේතූන් මත තහනම් විය. අප කඳවුර ඉදිරියේ වූ ස්ථානයක කඳවුරේ වෛද්‍ය සහයක විසින් නොච්චිකුලම ද්‍රවිඩ වැසියන්ට නිතිපතා සුළු වෛද්‍ය ප්‍රතිකාර, පහසුකම් සැපයීමේ අඛණ්ඩ සත්කාර්යයක්ද සිදුකරන ලදී.

එසේම, එම ගම්මානවල ජන ජීවිතවල ආරවුල්, දුක් ගැනවිලිවලටද විසඳුම් ලබාදීමද මා අතින් සිදුවිය. උදා : කුකුළන් මිරිස් වගාවට හානි කිරීම නිසා යාබද නිවසේ අය කුකුළන්ට වසදීම, අවුරුදු දා නිවසේ ස්වාමිපුරුෂයා නිවසට භාරනොගැනීම ආදිය.

එම කටයුතු අතර, ප්‍රදේශයේ පැතිර පැවති මත්පැන් පෙරීම සහමුලින්ම නතර කිරීමටද හැකිවූ අතර, සිංහල අවුරුදු දා ආරක්‍ෂාකාරීව එම කටයුතුවලට සහාය ලබාදීමටද ක්‍රියාකළ අතර, එය ගම්වැසියන්ගේ ඉමහත් සතුටට හේතුවිය. තවද අපගේ කඳවුරු බේකරියෙන් ගම්වැසියනට පාන් ලබාදීමද (රාත්තල් 1 - 3.25) ඔවුන්ගේ ඉල්ලීම මත සිදුකළේය.

වී වගාවේ විකිණීම් කටයුතු අනුරාධපුර ව්‍යාපාරිකයින් සමග සම්බන්ධීකරණය කරමින් සිදුකිරීමට සහායවීමටත් දෙමළ ගම්මාන ගැටළු හැකි තරමින් විසඳීමටත් මා කටයුතු කළ අතර, ප්‍රදේශයේ පොලිසියට ඔවුන්ගේ වාර්තා කිරීමක් නොවීය. වරෙක මොරවැව ප්‍රාදේශීය ලේකම් තුමන් පවා මෙවැනි තත්ත්වයන් පිළිබඳ ඔහුගේ පැහැදීම මා වෙත ප්‍රකාශ කරන ලදී.

යාබද ඉන්දීය කඳවුරේ භටපිරිස් මාරුවෙන් *(troop change)* පැමිණි නිලධාරී අණදෙන සමග සමීප සම්බන්ධතාවයෙන් කටයුතු කළ අතර, ඉන්දීය ජනරජ නිදහස් දිනයේ දිවා භෝජන සංග්‍රහයකටද අපගේ සාමාජික පිරිසක් සමග සම්බන්ධ වී ඉන්දීය භටපිරිස් සමග දිවා භෝජනයක රසවිඳීමට අවස්ථාවක් ලැබිණ. නිලධාරී අණදෙන කපිතාන් රාජේන්ද්‍ර සිං (6-රාජ්පුට් බළඇණිය) (*6-Raj Poot-Bn.*) ගේ සුහද ආරාධනයෙන් එම අවස්ථාව උදාවීම (අපගේ බළඇණි දිනය මෙන්) භටපිරිස්වල ප්‍රබෝධයට හේතුවිය.

1990 අප්‍රේල් අවුරුදු උත්සවය නොච්චිකුලම ග්‍රාමයේදී රාජ්‍ය හා සිවිල් බලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වූ අතර, ඊට ද්‍රවිඩ වැසියන්ගේ සහභාගීත්වය ගැනීමට නොච්චිකුලම ග්‍රාමයේ සභාපති (තලෙලවර්) ගේ නොමසුරු සහාය මාගේ ඉල්ලීම පරිදි ලැබිණ. අවුරුදු උත්සවයේ තරගවලට මා දන්නා තරමින් LTTE සාමාජිකයින්ද සහභාගී වී ජයග්‍රහණය කරන ලදී.

ඉන්දියානු සාමසාධක හමුදා, 1990 මාර්තු මස ඉවත් වීමත් සමග ප්‍රදේශයේ කටයුතු සංකීර්ණ වීමට හේතු වූයේ බල ප්‍රදේශයේ ද්‍රවිඩ ගම්මාන නොච්චිකුලම, ශාන්තිපුර වැසියන් LTTE සංවිධානය මගින් බලහත්කාරයෙන් පැහැරගෙන යාමට කටයුතු කිරීම හේතුවෙනි. මේ අවස්ථාවට ඔවුන්ගේ විකල්ප ක්‍රමය වූයේ අපගේ කඳවුරෙන් කි.මී. 03 ක පමණ දුරින් වූ අනවසර කොලනියේ නිවසකට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමයි. ඒ වනවිට අප කඳවුරේ රැඳී සිටියේ සුළු භටපිරිසකි. අනෙක් පිරිස රැඳී සිට තිබුණේ ගම්මානවලය. එසේ වුවත්, මා භටපිරිස් පෙළක් සමග අදාළ ස්ථානයට LTTE බාධක මධ්‍යයේ ලඟා වූ අතර, ඒ වනවිට බෝම්බ ප්‍රහාරයට ලක්වූ ළමයා වැතිරී සිටින ලදී. ප්‍රවාහන පහසුකම් නොමැති නිසා රාත්‍රී රෝහලට රැගෙන යාම බොහෝ සෙයින් ප්‍රමාද විය. කෙසේ වෙතත් දරුවා අවාසනාවන්ත ලෙස රෝහලේදී මියයන ලදී.

LTTE ත්‍රස්තවාදීන් විසින් මහදිවුල්වැව පියවර 1 හා 2 ගම්මානවලට පහරදීම් අවස්ථා 2 ක් මාගේ දෙවෙනිවර පැමිණීමෙන් පසු 1990-1991 කාලයේ සිදුවිය.

මීගස්වැව, රොටවැව (මුස්ලිම් ගම්මාන) ප්‍රදේශයේදී මාගේ බල ප්‍රදේශයේ වැසියන් සමග එදිනෙදා බඩුබාහිරාදිය ගැනීමට හොරොව්පතාන නගරයට යන වැසියන් රැගත් මගී ලොරි රථයක් අමානුෂික පහරදීමකට ලක්විය. එය ජීවිත හානිවලින් කෙළවර විය. රියේ ඉදිරිපස ගමන්ගත් රූපසිංහ නම් සෙබළා දිවි බේරාගත් අතර, ඔහු විසින් මානට සිද්ධිය පසුදිනක සැලකරන ලදී. එහිදී, ලොරි රථයේ වූ මවක් තම උකුලේ රඳවාගෙන සිටි කිරි කැටි දරුවා ඇගේ බඩු ගෙනයාමට තිබුණු බාස්කට් එකට සිද්දියේදී දමා යාම නිසා මව මිය ගියත් දරුවා හොරොව්පතාන රෝහලේදී නිරුපද්‍රිතව සිටි බවට දැනගැනීමට ලැබීම මෙලොව එළිය දුටු දරුවාට ජීවත්වීමට වාසනාව ගෙනදෙන්නක් විය.

වරෙක දිවා කාලයේ මහ දිවුල්වැව පියවර 2 කැලෑ භූමියට ආසන්නයේ වූ නිවසක දරුවකු නලවමින් සිටි කාන්තාවකට අසාමාන්‍ය ශබ්දයක් ඇසී ත්‍රස්තවාදීන් යැයි සැක සිතා ඒ දෙසට, ඇය ළඟ වූ රිපීටරයෙන් වෙඩි තැබීමෙන් ග්‍රාමයට සිදුවීමට ගිය විපතක් එම පෙර දැනුම්දීම හේතුවෙන් වළක්වා ගැනීමට හැකිවිය. දිවා කාලයේ පුරුෂ පක්ෂ වගා වැඩ, වෙනත් රාජකාරී වල නියැලෙන අතර, ගම්මානයේ බොහෝවිට ක්‍රියාත්මක වනුයේ එක බංකරයක් පමණකි. එය පාසල ආසන්නයේ දිවා කාලයේ ක්‍රියාත්මක විය.

මෙවැනි ත්‍රස්ත බියවැද්දීම් නිසා බල ප්‍රදේශයේ ඇති හැකි අය ගම හැරදා යාම නොදැනීම සිදුවෙමින් පැවතුනි. කුඹුරු පාලුවට යාම සිදුවීම සමග ක්‍රියාත්මක වූ මා ගමේ පදිංචි අයට පාලු ඉඩම් (කුඹුරු) වගා කිරීමට ඉඩ දුනි. මේ නිසා විනය පරීක්‍ෂණ වැනි දුෂ්කරතාවයන්ට පත්වූවත් මාගේ බළඇණියත් 22 වන බලසේනාවෙන් ලැබුණු සහයෝගයත් නිසා ඒවා මගහරවා ගැනීමට හැකිවිය.

ඊළඟ කන්නයේදී විශේෂයෙන් මහදිවුල්වැව පියවර 2 හි ජනතාව ලද සරුසාර වී අස්වැන්නෙන් 1991 අප්‍රේල් සිංහල හින්දු අලුත් අවුරුදුවලට කඳවුරේ භටපිරිස් සියල්ලටම කැවුම්, කිරිබත්, කෙසෙල් 2- wheel ට්‍රැක්ටරයකින් රැගෙනවිත් ලබාදීම භටපිරිස්වල සතුට දන්වන කරුණකි.

ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මුලිනුපුටා දැමීමේ අදහසින් 22 වන බලසේනාවේ උපදෙස් පරිදි නොච්චිකුලම මාගේ කඳවුරු බල ප්‍රදේශය ගුවන් හමුදාවට පවරා එම ගම්මානවලට උතුරින් වූ වනගත ප්‍රදේශවල එතැන් පටන් අපගේ ක්‍රියාන්විත දියත් කරන ලද අතර, ඒ හේතුවෙන් මෙම ගම්මානවාලට ත්‍රස්ත තර්ජන එල්ලවීම සහමුලින්ම නතර වීමට කරුණු යෙදිණ.

දශක තුනකට එපිටදී ක්‍රියාන්විත බිමෙහි ගෙවූ දුෂ්කර පරිසරයද එම තත්වයන්ට මුහුණදෙමින් ප්‍රදේශයේ සිවිල් ජනතාව සමග සම්බන්ධතාවයෙන් රාජකාරී කළ සුන්දර අතීතය අදටද සමාජයට පාඩම් කියාදේ.



සටහන -:
**මේජර් ආර් ලලිත් ධර්මවික්‍රම**
**විශ්‍රාමික**
**2 ගැමුණු සේවා බළඇණිය**

# පරපුරක අලෝකයෙන් පරපුරක් රකිමු



කොළඹ කොටුවෙන් ගාලු බස්රථයට ගොඩවීමට මා සමග මාගේ පියා බස් නැවතුමට පියනැගුවේ කලුතර සිටිනා මගේ වැඩිමහල් සහෝදරයාගේ නිවසට යාමටය. ඒ දින කිහිපයක් පුරා අසනීපව කොළඹ පෞද්ගලික රෝහලක සිටි මාගේ පියාහට නිසි ප්‍රතිකාර ලබාදීමෙන් අනතුරුව රෝහලින් නිවස වෙත රැගෙනයාමේ වගකීම මාහට පැවරී ඇති බැවිනි. වයස අවුරුදු 23 ක තරුණියක වන මා  පසුපස මාගේ පියාගේ පා සටහන් වැටුණේ, පවුලක වගකීම කාන්තා පිරිමි යන දෙපාර්ශවයටම නිරායාසයෙන් පැවරෙන නිසාමය. නව රැකියාවට කොළඹට පැමිණි මාහට කොළඹ සහ එහි වෙසෙනා මිනිසුන් ගැන නිසි අවබෝධයක් නොවුනද, මම සිතෙහි දැඩි ශක්තියෙන් යුතුව පියාගේ රෝගය සඳහා ප්‍රතිකාර ලබාදී ඒ සියලු කටයුතු සාර්ථකව නිමකර ගැනීමට සමත්වූයෙමි.

මා බස් රථයට ගොඩවූවාය. දින ගණනාවක් පුරා රෝහල් ගතව සිටි නිසාදෝ එහි ඉතිරිව තිබූ එකම අසුනේ හිඳගත් පියා, ගමන් ඇරඹෙත්ම දිග නින්දකට වැටුණේය. මා ඔහු දෙස බලා කල්පනා කරන්නට වූයේ දරුවන් සය දෙනකුගේ පියකු වූ ඔහු අප නිසා විඳි අසීමාන්විත දුක්වේදනා ගැනය. අප වෙනුවෙන් වූ කැපවීම ගැනය. බස් රථය ගාලු පාරේ කලුතර දෙසට ඇදෙන්නේ ද දැඩි රථවාහන තදබදය සමගය. එය මගීන්ගෙන් පිරී ඉතිරීගියේ කොළඹ කොටුවේ සිට නැවතුම් ස්ථාන එකක් හෝ දෙකක් පමණක් පසුකරද්දීමය. ඉතා වෙහෙසකාරී මුහුණු මත වේදනාකාරී හැඟීම්වලින් මිරිකී බස් රථයට නැග තෙරපී සිටින මිනිසුන්ගේ මුහුණු මත ඇඳී තිබුණේ, කියවීමට නොහැකිවූ බොහෝ කතාන්දරය. ඒ ජීවිත තුළ වන බවට සපථ කරමිනි. වෙහෙසකාරී දින ගණනාවක් ගෙවූ මා ද සිටියේ බස් රථයේ ආසනයක් කුමන මොහොතේ හෝ හිස්වේදැයි දැස් යොමමිනි. නොබෝ වේලාවකින් මා අසලවූ යොවනියක් ආසනයෙන් නැගිට ගියාය. මම එහි අසුන් ගතිමි. බස් රථයේ තෙරපී සිටිනා බොහෝ පිරිස් අතර, මැදිවියේ පිරිසකි. පියා තද නින්දකය. පසුගිය දින කිහිපය පුරා ඔහුගේ වැඩකටයුතු සහ කාර්යාලීය වැඩ කිහිපයකට සහභාගී වූ හෙයින් මා ද සිටියේ අධික වෙහෙසකර වූ මොහොතකය.

බස් රථයේ වම්පස සහ දකුණු පස මුල් ආසන හයෙහි හැඩිදැඩි තරුණයින් සහ තරුණියන්ය. වයස අවුරුදු 70 ක පමණ පුද්ගලයකු බස් රථයේ එම ආසන කිහිපය සමීපයෙන් සිටියේය. ඒ තරුණ පිරිස වෙත ඒ වයෝවෘධ පුද්ගලයා ගැන කිසිදු තැකීමක් නැත. මා පිටුපස සිට ඒ දෙස බලාසිටියෙමි. ඒ මහලු මිනිසාගේ දෙනෙත් අග දිලිසෙන කුඩා කඳුලු බිඳු බස් රථයේ පිටුපස දොර අසල ආසනයක සිටි මම දුටිමි.

මා සිටි ස්ථානයේ සිට ඔහු අසුන්ගන්නයැයි ආරාධනා කළේ එහි තෙරපී සිටි පුද්ගලයින්ගේ සහයෝගයෙනි. ඒ මිනිසා දැත් එක්කොට මාහට කෘතඥවනු මම දුටුවෙමි. කිසිවකුටත් තම අපහසුතාවය නොකී, කිසිවකුගෙන්වත් අසුනක් ඉල්ලා ආයාචනා නොකළ ඒ මහලු හදවතේ තෙරපී වේදනාව කොතෙක්දැයි කීමට මා නොදනී. ඒ තරුණයින් සහ තරුණියන් කිසිවකුත් එම පුද්ගලයා කෙරෙහි අවධානය යොමු නොකළේ, මන්දැයි මා හට නොතේරේ. සිය ජංගම දුරකතනයේ උඩ පහළ යන බොහෝ අයගේ ඇඟිලි තුඩු යාන්ත්‍රිකය. කිසිදු මානුෂීය බවක් නොමැති ඒ මුහුණු මත විඩාබර බවක් ද නොවේ. සමාජයේ ඇති පිරිහීමක පිළිබිඹුව ඒ තරුණයින්ගේ ක්‍රියාවෙන් තහවුරුය.

"වැඩිහිටියන්ට ගරු කරමු" ශිෂ්‍යත්ව පන්තියේදී හෝ ඒ ආසන්න වසරකදී පමණක් ඇසූ මාතෘකාවක් වග මතකය. ඉන් පසුව "වැඩිහිටියන්ට ගරු කරමුයි" යන මාතෘකාව මත පදනම් වූ කිසිදු ඉගැන්වීමක් අප විෂය නිර්දේශයේ නොවූවද බොහෝ අධ්‍යාපනික කටයුතු සහ සමාජීය ක්‍රියාවන් තුළ අප ශිෂ්‍යයින් ලෙස සහභාගී වූයේ එකිනෙකා හා බැඳී අපූර්ව සහයෝගීත්වයේ මනුසත් හැඟීම් දාමයකිනි. මුහුදු සුළඟ බස් රථය තුළට පිවිසෙන්නේ වෙහෙසකර බොහෝ මුහුණු තුළට යන්තමින් හෝ සැනසීමක් ලබාදෙමිනි. මා කතා කරනා ඒ "තරුණ තරුණියන්" සියල්ලෝ කිසිදු මානුෂීය බවකින් තොර අයවලුන්ය. "වැඩිහිටියන්ට ගරු කරමු" යන මාතෘකාව ඔවුන්ට අමතකව ගොස් ඇත. මා කම්පා වූයේ ඔවුනට අනාගතයේ මුහුණදීමට සිදුවන බේදනීය අත්දැකීම් ගැනය. අප සමාජයට ලබාදෙන යහපත් සේම අයහපත් සියලු දේ, පෙරළා අපට හිමිවන ප්‍රතිඵලය. ඒ ලබා දෙන ආදර්ශයන් මත ජීවිතය ගොඩනගා ගන්නා කුඩා දරු පරපුර මතුවට එවැනිම තරුණයින් ලෙස සමාජ ගතවනු ඇත. එවැනි දිනෙක මෙම තරුණ පිරිසෙහි හැඩි දැඩි තරුණ ජවය ගෙවී ගොස්ය. ඒ වනවිට ඔවුනට සිය අතීතය සිහිනොවන්නේ නම් අරුමයකි.

මා හිස ඔසවා බැලුවේ වයෝවෘද්ධ ඒ පියා දෙස හා මාගේ පියා දෙසය. මට මගේ පියා මෙතරම් දැනෙන්නේ මාහට ජීවය දුන් ඒ ප්‍රාණයේ ලේ නෑකම නිසාමය. මට ඒ මිනිසා කෙරෙහි මෙතරම් දැනෙන්නේ මා සමාජයට, රට, ජාතියට ඇති ආදරය නිසාමය. එම වයෝවෘද්ධ පුද්ගලයා බස් රථයේ ඉදිරි දොරකඩ දෙසට පියමැන කිසිවක් හඳිසියේ සිහි වූ

ස්වරූපයෙන් දෙපා තුඩු අගින් ඉස්සී මා දෙස බලනු මම දුටිමි. මා සිනාසුනාය. ඒ මුහුණේ පිරී තිබූ කෘතඥ සිනහව මට කිසි දිනෙක අමතක නොවනා වග මට විශ්වාසය. ඒ මිනිසා නැවතත් දැත් එක්කොට මාහට ආචාර කළේය. ඔහු විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයකු වන්නට ඇතැයි මා අනුමාන කළේ, ඔහුගේ ඉරියව් තුළ වූ කියැවීම නිසාමය. දැත් එක්කොට මාහට ආචාර කිරීමට අවැසි නොවන්නේය, මන්ද මා ඒ මිනිසාට වඩා වයසින් බාලය. ඔහු මට කෘතඥ වූවා සේම බස් රථයේ බොහෝ පිරිසක් මට කෘතඥ වූහ. ඒ මොහොතේ මා හදවතේ නැගි ප්‍රීතිය මා ඔහුට කළ උපකාරයේ පින මා මතු භවයටත් රැගෙනයන වත්කමක් නොවේද."හොඳ අම්ම තාත්තෙක්ගෙ දරුවෙක්". කවුදෝ කියනු මම අසා උන්නෙමි. මම සහ මාගේ සහෝදරයින් පස් දෙනාට මාගේ දෙමාපියන් දුන්නේ ජීවිතාවබෝධයයි. එනිසාම එම කියමන සාධාරණ යැයි සිතමි.

පන්තියේ අට වසරට පමණක් ඉගෙනගත් මගේ පියාට සැලකියයුතු දැනුමක් නොවුනද, ජීවිතය නම් වූ "සාගර දියඹ" තරණය කොට, පැමිණ "අම්මා" නම් "නැංගුරමේ" ආධාරයෙන් "අකීකරු දියවැල් රළා" ලඟ අප නංවාගත් "පවුල" නම් වූ "යාත්‍රාවේ කපිතාන්" ඔහුය. ඔහු දුන් ජීවිතාවබෝධය මේ විශ්වයේ මොනයම් ස්ථානයකින් හෝ ගත නොහැකි වන්නේ, පවුල නම් වූ සමීප අධ්‍යාපන ඒකකයේ මුල් පාඩම දෙමාපියන්ම ඉගැන්වීම හැර වෙන කවුරුන් හෝ ආදේශක මානව සම්පත් දායකයින්ට ලබාදිය නොහැකි නිසාමය. ඔබ සහ මම ජීවිතයේ නේකවිධ වූ අවධි පසුකොට පැමිණ ඇත. එහෙත් අප නුදුරේදී සමාජ ගතවන දරුවන්ට නිසි ජීවිත අවබෝධය ලබා දියයුතුමය. එසේනම් දරුවන් ගුණගරුක මානසිකත්වයෙන් අග තැන්පත් කිරීම අප සතු වගකීමකි. මතු පරපුරක ආලෝකයේ පහන් එළි වන්නේ අප දැන් මතය. අප දැල්විය යුත්තේ අනාගත දරුවන්ගේ ජීවිතාලෝකයයි. එය ලබාදීමට ලබාගත්

## “දරුවකු ධනවතෙක් කරන්නට වෙහෙසෙන දෙමාපියන්ට වඩා දරුවන් ගුණවතුන් කරන්නට වෙහෙසෙන දෙමාපියන් ජීවිතයේ සැඳෑ සමය සතුටින් ගෙවා දමයි”

උපාධියේ තරම බලපාන්නේ නැත. කියා දියයුත්තේ " ජීවිතයේ පාඩමය". ලෝකයේ සියලු සමාජීය ඒකකයන් තනි තනිව නිර්මාණය වුව ද එය එකිනෙකට ඈඳෙන්නේ එක්ව වාසය කිරීමේ "බලය" මනාවට පෙන්වා දෙමිණි. ඒ සියලු බැඳීම් ගොඩනැගී, රැකී ආවේ අප එකිනෙකාට ලබාදෙන ගෞරවය හේතුකොටගෙනය. උස් පහත් කුමන සමාජ තරාතිරමක වුවද අප එකිනෙකාට ගෞරව කරනා තුරු. විශේෂයෙන් අප රටේ "වැඩිහිටි පරපුර රැකීම" උතුම් මානුෂීය ගුණාංගයන්ගෙන් හෙබි සමාජයක පිළිබිඹුව වේ. දරුවකු ධනවතෙක් කරන්නට වෙහෙසෙන දෙමාපියන්ට වඩා දරුවන් ගුණවතුන් කරන්නට වෙහෙසෙන දෙමාපියන් ජීවිතයේ සැඳෑ සමය සතුටින් ගෙවා දමයි" යන කියමන සපතවේ යැයි මා අදහන්නේ මාගේ දෑතේ එල්ලී, මාගේ අත් වාරුවෙන් බස් රථයෙන් බැස, සිනා සී, පා නගනා මාගේ පියාගේ දසුන දැකීමෙනි.



සටහන :-
සෙ/බි10෴0 කෝප්‍රල් චතුරානී එච්ඩබ්ලිව්
ශ්‍රීලශ්‍රීපොදුගේ
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය




## “රණවිරුවා” ගැන යමක්

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන රණවිරුවා මාසික සඟරාව වඩා විචිත්‍රවත් ලෙස හා හරවත් ලෙස ඉදිරිපත් කිරීමට අපි නිරතුරුව උත්සාහ ගන්නෙමු. තවද, රණවිරුවා වෙනුවෙන් විශාල වියදමක් දැරුවද එය ඔබ අතට පත් කරනු ලබන්නේ කිසිදු මුදලක් අයකර නොගෙනය. එසේම, රණවිරුවා මුද්‍රණය කරනු ලබන්නේ සීමිත පිටපත් සංඛ්‍යාවක් වුවද ඉන් උපරිමයක් ඔබ වෙත එවීමටද අප කටයුතු යොදා ඇත.

ඉහත තත්වයන් යටතේ ඔබට ලබාදෙන සඟරා නිසි පරිදි සෙබළුන්ගේ පරිශීලනයට ලක්කිරීම ඔබ සතු කාර්යයකි. ඇතැම් විට එය ක්‍රමවත්ව සිදුනොවන බැව් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිරීක්ෂණය වී ඇත. එබැවින් හැකි අයුරින් රණවිරුවා සඟරාව සෙබළුන්ගේ පරිශීලනයට ලක්කරන මෙන් ඉල්ලන්නෙමු. තවද, සමස්ත යුද හමුදාවම නියෝජනය කරන එකම සඟරාව වූ මෙය මගින් උපරිම ප්‍රයෝජන ගන්නා මෙන්ද වැඩිදුරටත් දන්වන්නෙමු.

# සෙබළ සිතුවිලි



## අම්මා නොමැති අවුරුද්ද...

ගොළු වුණ කොවුල් හඬ
සැඟවුනි අතුපතර.....
කිරිබත් සුවඳ අහිමිව
කුස්සිය ලිපට.....
මකුළු දැලෙන් රටා මැවෙයි
ගෙයි වහල.....
අම්මා පින්තූරයක් වී හිනැහෙයි
ගෙයි අතර....

නැකතෙන් කැවූ බත් කට
සිහිවෙයි විටෙක.....
පාළුව දැනී වැටුණෙම්
කඳුළක් නෙතට.....
නමුණුකුල දෙසින් හිරු
බැස ගිය කලට......
අවුරුදු නොඑනු ඇත
කිසිදා අපේ පැලට....
පරවුණ මල් වඩම්
තනි රකිනා බිමක....
කඳුලක් වැටී එක් වුණි
නොදැනීම පසට....
ගොම්මන ඇවිත්
ගෙපැලම ගිලගත් රැයක...
අම්මා හිස පිරිමදියි

(සෙ/513870 බලලත් නිලධාරී 1
ආර්ඩබ්ලිව් ෆොන්සේකා ආර්එස්පී
4 විපාරෙ (රණවිරු සෙවන)

## සීතල වෙල් ගරු පාර...

සීතල උදෑසනක්
දසතින් නැග එන
සුසිනිඳු සුළං රැළි
දඟකාරකමින් නැටුවා
වෙල් යායේ නිල්වන් ගුරු පාරේ
පුංචි දුවක් අත අල්ලා
අකුරට යන හැටි පෙනෙනා
මා හද හැඟුමන් පුබුදු කළා
හිරිමල් යොවනියේ
නුඹ

සෙ/78358
බනි 11 චන්ද්‍රසිරි ඒපීඑස්
අප්‍රසඅ
පුත්තලම

## සෙබළාගේ ජීවිතය...

ගතේ දරනා
යුද්ධ නිලඳුමෙහි බර
මසිතට බොහෝ දැනුනා...
ලක් මවගේ දිවියේ
රැක්ම වෙනුවෙන්
දිවා රෑ බොහෝ වෙහෙසුණා...
ගතට නිවනක්...
නෙතට නින්දක්...
නොමැති දින බොහෝ තිබුණා...
එවන් සමයක
සෙනෙහෙබර පියකු...
දයාබර සැමියකු...
ලෙසින් මා හට
බොහෝ දේ මග හැරී තිබුණා...

## දයාබර දෝණියේ...

සිනා හඬ ගෙයි පුරා පැතිරෙයි
නොමැතිය දෙසවනේ.......
අප්පච්චි කියමින් හඬ තලයි
පුංචි පා පොඩි තබමිනේ.....
පළල් උරතල හිස් තබා සැනසෙයි
ලොවක් උර මත තබා වැන්නේ....
දිනක් පාසා නුඹේ කිරි සුවඳ
විඳ විඳා මසිත් පුරවගන්නට.....
පිනක් නොමැතිය මෙ මා හට
දෝණියේ නුඹෙ දෙකම්මුල් සිඹ
පවසනා දේ අසනු මැනවි
අප්පච්චිගේ උණුසු මට මෙන්
සැනසියන් නුඹ....
අම්මගේ උකුල් තලය මත හිඳ.....

(සෙ/එස්107140
ලා/කෝ බංඩාර කේඒඑච්
9 (සෙව) ඉසේරෙ)

## සිහිලැල් සිසුනිඳු තුරුලතා හරිත වන පෙත...

සිහිලැල් පරිසරය
හරිත දැකුම්කළු වන පෙත
සුසිනිඳු තුරුලතා වෘක්ෂයන් පිරි නෙත නෙත
පාටින් දිදුලන වන අරණ
සිහිලැල් සුළං හමා තුරුලතා ගස් නැළවෙන
සිලි සිලි සිරි හඬ වැසි වසින
සොබාදහම මැව් තුරුලතා
සිහිලැල් හිමිදිරි හිරු රැස
නැහැවෙන සොබාදහම
ජලධාරා සිහිලැල් පිබිඳි හිනැහෙන
වනපෙත නෙක පාටින්
දිලිසෙන වන මල් මාවත
රොන් ගන්නා මීමැසි සමනළ රැන් රැන්
වෙර වීරිය ගෙන නැගී සිටින
යෝධ වෘක්ෂ තඳින්
වන අරණ තුළ අලස කමින් නිදියන
කුණාටු වෘක්ෂයන් දළුලා වැඩි තුරුලතා
අලස යෝධයන් පරදා නැගී
වෘක්ෂයන් අවනතව හඳී තුරුලතා
ගුවන පුරා පිළිරුව දෙති
රණහඬ නංවා පිබිඳි සොබාදහම හරිත වනයේ
තුරුලතා යෝධ වෘක්ෂ මිතුරුව
අහස් කුස තුළ
පිබිඳි මල් ගොමු පා සෙනෙහස
තුරුලතා අලස වූදා වෘක්ෂයන් යෝධයන්ව
මිහිතලය මත රජ කිරුළ දරති
සොබාදහම හා වැජඹෙති මිතුරුව
පරිසරය දැකුම් කළු සිතුවම් මවමින්
සොබාදහම හරිත වන පෙත සුසිනිඳු

නි/70207 කපිතාන් ඒපීඑස් චන්ද්‍රසිරි ගරෙ
අමාප්‍රකා නිල නිවස
කොළඹ 07

## සමාජය දෙස බලාසිටින හැරගිය නුඹට...

## දුක්ඛයක් කී කතාවක්...

නිරුක්ත තරවූ ව්‍යාජ සමාජයක
සමතලියකට තටුසලා ඉගිලෙන්නට
තරම්වත් ඉඩක් නැති අපූරුව...
එසේනම්...
දුටු දුටුවන් පිනවන රෝස මලක් වියයුතුද
නැතිනම් සියලුම ස්පර්ශයන් බිඳහෙලෙන
නිදිකුම්බා පත්‍රයක් විය යුතුද නැත
වෙනස්විය යුත්තේ ව්‍යාජ සමාජයම...
පමණයි...
විවිධාකාර මානසිකත්වය බිඳහෙලා එකම
මානසිකත්වයක මිනිසුන් බිහිවෙමින්
අව්‍යාජ සමාජයක් ගොඩනැගෙනු නියතයි...
එයට අවශ්‍ය වන්නේ ධර්ම මාර්ගයෙහිම
හැසිරීම බව පසක්වී හමාරය...

වරක් නොව සිය දහස් වරක්
කියන්නෙමි
ඇහෙන්නට මුළු ලෝකයටම
ආදරෙයි
ඔබට විතරක් සඳහටම
ඊයෙටත්... අදටත් වගේම
උදාවෙන මතු දිනෙන්
පතන්නට මහ පැතුම් නැත මට
එකම පැතුමක් හැර
දැනෙන දුක් උහුලගෙන
වැටුණු කඳුළු නොපෙන්නා
පිහිදගෙන
අප්පච්චියේ, නුඹයි වෙරදැරුවේ
අපිට ජීවිත තනන්නට
නැති වුනත් අද ඔබ
පතන්නේ නිරතුරුව
සියක්වර ආයු ලැබූ
උපදින්න අප අතරම
අප්පච්චියේ...

සෙ/284470
සැරයන් බංඩාර ඊඑම්පී
3 ශ්‍රීලංසංබ

## ජීවිතය...

එක් කලෙක සිනහව අමතක විය
අවසිහියෙන් සිටිම...
වස්සානය එතැයි බලාපොරොත්තුවෙන්
ගිම්හානයේ පිපී
දරාගැනීම අතින් ඉහළම මල්
මගහැරුනි...
මල් සුවඳයි ජීවිතය ලස්සනයි යැයි
කවි ලිව්වා මිස
ගිම්හානයේ සොඳුරු බව නොදැක
ගිම්හානයට සාප කෙරුවෙමි
ජීවිතයේ බොහෝ ගිම්හාන සාතු
පසුකලෙක හෙයින් මා පසුකලෙක
ගිම්හානයේ අත්හැරුණු
ජීවිතයේ අපූරු සමය විඳගැන්මට
වස්සානය මඳකට හෝ
අමතක කළ යුතුය
ගිම්හානයේ පිපෙන කටෝර මල්ද
බොහෝ සුවඳය...

සෙ/ජේ100380
ලා/කෝ ලංකාපොල එල්ජීඑස්අයි
2 ශ්‍රීලංරබ

## සෙබළ වෘත්තියේ තෘප්තිය...

යුද වැද රට බේරගන්න
පුජාකර ඇඟ ලේ මස්
එවන් උතුම් මිනිසුන් හට
පිහිට වන්නට සිතුනි මටත්
අත් පා කාතිමව සාදා
ඇවිදින විට ඔවුන් සතුටින්
විඳිමි හදපුරා සතුටක්
දැක මා එවන් සතුටක්

සෙ/651520
සැරයන් වටවල ඩබ්ලිව්ඩීඑම්ආර්
රණවිරු සෙවන පුනරුත්ථාපන මධ්‍යස්ථානය

## සිත් ගත් මිනිසා...

නෙතට ගලනා කඳුළු පිසදා
සිනා සෙන්නට ඔබට හැකිනම්
සිතට දැනෙනා දුක් සුසුම් මැද
නොසැවී ඉන්නට ඔබට හැකි නම්
ගතට දැනෙනා වඩා අතරින්
දිවි ගෙවන්නට ඔබට හැකිනම්
සතුට ලබනා උතුම් මිනිසෙකි
එවන් ගතිගුණ ඔබ සතුයි නම්

සෙ/726049
ලා/කෝ ජයතිලක අයිකේජීකේඩී
7 ශ්‍රීලයුකාබ

## පාට හීන...

පාට පාට හීන වැලක්
සිතුවිලි අතරේ ඔතාන
රෑ මැදියම හොරෙන් ඇවිත්
ඔබ කුටියේ සැඟවෙන්නම්
සිහින ලොවක සැරිසරනා
ඔබේ නින්ද නොබිඳෙන්නට
මගේ සුසුම් නොවැදෙන්නට
ඉහ ඉද්දර නවතින්නම්

සෙ/522754
කෝප්‍රල් මාලිංග ඩීඩීසී
14 විපාරෙ

## අහිමි සිහිනය...

නෙතු යුගල අග දිලිසී
දගපාන කඳුලු නුඹ
නෙත රිදවා හඬවා ගලායයි සරදමට
සිත්වමන මත හැඬවූ අඳුරු සෝ සුසුම ඔබ
හිත රිදවා රිදවාම හැරයාවි මා සිතම
පින්බර අලුයමක
පෙනි පෙනී නොපෙනෙනා නුඹ
අහිමි සිහිනයකි කිසිදාක හැබෑවක් නොවන

සෙ/386685
රසෙ සංජීව එන්ජීවල්වන්
511 වන පාබල බසේමු

## දිනන් හෙට දිනා...

ලොවේ තනිවූ අහිංසක හිත
මව්ගේ ඇකයෙන් දුරස්ලන ගත
ඇතත් ගතවූ දිවියෙ දොම්නස
ලැබෙයි දවසක නුඹට සොම්නස

පුතේ දවසක
තනිවුවත් ඔබ ලොවේ කොතැනක
ඔබගේ සිහිනය දිනන් හෙට දින
යහපත්ම දරුවකු වෙමින් ලෝකෙට

සෙ/ආර්102471
කාසෙ ජිනදාස පේජ්පී
2(සෙවා) ශ්‍රීලයුකාබ

## මා හිමි සඳු...

පුන් සඳක් කුමට මට
ඔබේ උවන දකින විට
තුරු පොකුරු කුමට මට
ඔය නුවන් තරුය මට
හිරු තප්ත කුමට මට
නුඹේ උණුහුම දැනෙනකොට
හැල් සුළං ඕනි නෑ මට
මා නිවෙන්නෙමි ඔය පපුව යට
නතරවෙනදා හුස්ම මගේ
යහන වේවා උයම නුඹේ...

සෙ/680267
කෝප්‍රල් ඉන්ද්‍රසේන එස්පීඑස්එම්
7 ශ්‍රීලයුපොහේබ


ක්‍රීඩා
විත්ති

# ජාත්‍යන්තර ජයග්‍රහණ






## ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේදී යුද්ධ හමුදා මලල ක්‍රීඩිකාවන් රන් සහ ලෝකඩ පදක්කම් දිනා ගනී

පසුගියදා තායිලන්තයේ බැංකොක් නුවර පැවති ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේ (*AAC*) - 2023, මීටර් 400 ධාවන ඉසව්වෙන් (කාන්තා අංශය) තරග කරනු ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කෝප්‍රල් නදීෂා රාමනායක වසර 23 කට පසු ශ්‍රී ලංකාවට රන් පදක්කමක් දිනා දීමට සමත් වූවාය. මෙරට නියෝජනය කරමින් යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 8 දෙනකු මෙම තරගාවලියට සහභාගී වූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කෝප්‍රල් ලේකම්ගේ එච්එල්එන්ඩී හෙල්ල විසිකිරීමේ (කාන්තා අංශය) ඉසව්වේ නව ශ්‍රී ලංකා වාර්තාවක් (මීටර් 60.93) පිහිටුවමින් ලෝකඩ පදක්කම දිනාගැනීමට සමත් වූවාය.

ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියකදී රන් පදක්කමක් දිනූ 8 වැනි ශ්‍රී ලංකා ක්‍රීඩිකාව ලෙස කෝප්‍රල් නදීෂා රාමනායක ඉතිහාසයට එක්විය. තත්පර 52.61 කින් එම ඉසව්වේ තරගය නිමා කරන ලද ඇය අවසන් මහා තරගයට පෙර පැවති අවසන් පූර්ව වටයේදී තත්පර 53.06 කින් තරගය නිම කිරීමට සමත් වූවාය.

## ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේ මිශ්‍ර සහාය දිවීමේ තරගයෙන් ශ්‍රී ලංකාවට රිදී පදක්කමක්

තායිලන්තයේ බැංකොක් නුවරදී පැවැත්වන ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේදී 400 × 4 මිශ්‍ර සහය දිවීමේ තරග ඉසව්වෙන් ශ්‍රී ලංකා මලල ක්‍රීඩා කණ්ඩායම තත්පර 3:15.41 කින් තරගය නිමකරමින් රිදී පදක්කම දිනාගත්තේය.

එම කණ්ඩායමට අයත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතරින් තිදෙනකුම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කල අය වීම විශේෂත්වයකි. එම තිදෙනා වූයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සැරයන් කුමාරගේ එච්කේකේ, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ බොම්බාඩියර් දර්ශන එස්ඒ සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කෝප්‍රල් රාමනායක එන් යන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ය.



# පැරා මලල ක්‍රීඩා ලෝක ශූරතාවලියේදී යුද්ධ හමුදා ක්‍රීඩකයාට ලෝකඩ පදක්කමක්

ඉකුත් ජූලි 13 වන දින ප්‍රංශයේ පැරිස් නුවර පැවති 2023 පැරා මලල ක්‍රීඩා ලෝක ශූරතාවලියේදී හෙල්ල විසිකිරීමේ ***F***44 ඉසව්වෙන් ලෝකඩ පදක්කම හිමිකර ගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ මාණ්ඩලික සැරයන් දුලාන් කේද්එස් සමත් විය. යුද්ධ හමුදාවේ දක්ෂතම පැරා මලල ක්‍රීඩකයකු ලෙස ප්‍රසිද්ධියට පත් නත් ජෙ‍යකොනොනි එම ඉසව්වෙන් ලෝකඩ පදක්කම හිමිකරගනු ලැබුවේ මීටර් 64.06 ක දුරක් වාර්තා කරමිනි. මෙම පැරා මලල ක්‍රීඩා ලෝක ශූරතාවලිය සඳහා මෙරට නියෝජනය කරමින් ජාතික පැරා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගී වූහ.



# කොරියානු තානාපති කුසලාන ටයිකොන්ඩෝ තරඟාවලියේ ජයග්‍රහණය යුද්ධ හමුදාවට



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ටයිකොන්ඩෝ ක්‍රීඩකයෝ ඉකුත් ජූලි මස 08 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති කොරියානු තානාපති කුසලාන ටයිකොන්ඩෝ තරඟාවලියේ පිරිමි සහ කාන්තා කාණ්ඩය වැඩිම ඉසව් ගණනකින් ශූරතාවයන් දිනා ගැනීමට සමත්වූහ. තරඟාවලියේ කිලෝග්‍රෑම් 54 - 68 පිරිමි කාණ්ඩය, කිලෝග්‍රෑම් 46 - 58 ත් පහළ සහ කිලෝග්‍රෑම් 61 - 75 ට අඩු කාන්තා සහ ***Aerobics*** කාණ්ඩයේ ශූරතාවය යුද්ධ හමුදා ක්‍රීඩකයින් විසින් දිනාගත් අතර කිලෝග්‍රෑම් 54 - 68 පිරිමි (බී කණ්ඩායම) අනුශූරතාව ද දිනාගත්හ. මෙහිදී ටයිකොන්ඩෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 31 දෙනකු ප්‍රතිවාදීන් සමග තියුණු ලෙස තරඟවැදී මෙම විශිෂ්ට දස්කම් දක්වමින් ශූරතාවයන් දිනාගැනීමට සමත්වීම විශේෂත්වයකි.

# ජාතික ජයග්‍රහණ

## ජාතික ජල ක්‍රීඩා පිහිනුම් ශූරතාවලියේදී යුද්ධ හමුදා ක්‍රීඩකයෝ දස්කම් දක්වති

ජාතික හා ජාතික කනිෂ්ඨ පිහිනුම් ශූරතාවලිය - 2023, දිවයින පුරා පිහිනුම් ක්‍රීඩකයින් රැසකගේ සහභාගීත්වයෙන් ඉකුත් ජූනි මස 29 වන දින සිට ජූලි මස 01 වන දින දක්වා සුගතදාස ක්‍රීඩාංගණ පිහිනුම් තටාකයේදී පැවැත්විණ. තරඟාවලිය සඳහා දිවයිනේ පාසල් සහ විවිධ ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පිහිනුම් ක්‍රීඩකයෝ 600කට අධික පිරිසක් සහභාගී වූහ.



එහිදී යුද්ධ හමුදා පිහිණුම් කණ්ඩායම රන් පදක්කම් 4ක්, රිදී පදක්කම් 11ක් සහ ලෝකඩ පදක්කම් 3ක් හිමිකර ගනිමින් තරඟාවලියේ පිරිමි කාණ්ඩයේ දෙවන ස්ථානය හිමිකර ගන්නා ලදී. යුද්ධ හමුදා ජල ක්‍රීඩා කම්ටුවේ සභාපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී විසින් පිහිණුම් ශූරතාවයට සහභාගී වූ යුද්ධ හමුදා පිහිණුම් ක්‍රීඩකයින් දිරිගන්වමින් ඔවුනට උපදෙස් හා පහසුකම් සලසාදෙනු ලැබිය.

# ආරක්ෂක සේවා ජයග්‍රහණ

## ආරක්ෂක සේවා බොක්සිං තරඟාවලියේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා බොක්සිං ක්‍රීඩකයින්ගෙන් සුවිශේෂී දස්කම්





ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ජූලි මස 12 සහ 13 දෙදින තුළ පනාගොඩ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්වූ ආරක්ෂක සේවා ක්‍රීඩා බොක්සිං තරඟාවලියේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා බොක්සිං ක්‍රීඩකයෝ සුවිශේෂී දස්කම් දැක්වූහ. මෙම තරඟාවලියේදී, යුද්ධ හමුදා පිරිමි බොක්සිං ක්‍රීඩකයින් තරඟ ඉසව් 10 කින් රන් පදක්කම් 08 ක් සහ රිදී පදක්කම් 02 ක් දිනාගනිමින් පිරිමි කාණ්ඩයේ ශූරතාවය දිනාගත් අතර යුද්ධ හමුදා කාන්තා බොක්සිං ක්‍රීඩිකාවන් සමස්ත තරඟ ඉසව් හතරෙන් රන් පදක්කම් 02 ක්, රිදී පදක්කමක් සහ ලෝකඩ පදක්කමක් හිමිකරගනිමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ සම ශූරතාවය දිනාගත්හ.

මෙහි පිරිමි කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ ලාන්ස් කෝප්‍රල් ආර්.එම්.පී. ධර්මසේන සහ කාන්තා කාණ්ඩයේ හොඳම පරාජිත ක්‍රීඩිකාව ලෙස යුද්ධ හමුදා කාන්තා බලකායේ සාමාන්‍ය සෙබළ දසුනිකා එම්ජීඑම්ටී සම්මාන හිමිකරගනු ලැබූහ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූ 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා බොක්සිං කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා බොක්සිං කමිටුවේ සභාපති එයාර් වයිස් මාර්ෂල් ඊජ්එන්එස් ප්‍රනාන්දු තරඟාවලියේ ජයග්‍රාහකයින් වෙත සහතිකපත් සහ කුසලාන ප්‍රදානය කළහ. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා බොක්සිං කමිටුවේ ලේකම් කර්නල් ඒකේඩී අධිකාරි යූඑස්පී සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

## 101 වන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියේදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් දස්කම්



ජාතික මලල ක්‍රීඩා කමිටුව වෙතින් සංවිධානය කරනු ලැබූ 101 වන "ජාතික මලල ක්‍රීඩා ශූරතාවලිය - 2023", පසුගිය ජූලි මස 28 වන දින සිට 30 දින දක්වා සුගතදාස ජාතික ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. එහිදී, ජාත්‍යන්තර ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමඟ තරඟවැදුනු ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ රන් පදක්කම් 12 ක්, රිදී පදක්කම් 12 ක් සහ ලෝකඩ පදක්කම් 17 ක් දිනාගැනීමට සමත් වූහ. යුද්ධ හමුදා මලල ක්‍රීඩාවට නව පරිච්ඡේදයක් එක්කරමින් මෙම තරඟාවලියේදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් මීටර් 100, මීටර් 200, මීටර් 400, මීටර් 800, මීටර් 1500, මීටර් 5000, මීටර් 10000, මීටර් 110 කඩුලු පැනීම, මීටර් 400 කඩුලු පැනීම, උස පැනීම, දුර පැනීම, තුන්පිම්ම, හෙල්ල විසිකිරීම, කවපෙත්ත විසිකිරීම යන ඉසව් තුළින් ජයග්‍රහණ ලබාගැනීම කැපීපෙනේ.

# ශිෂ්‍ය නිලධාරීන් කොළඹ ප්‍රදේශයේ සංචාරයක







යුද්ධ හමුදා යුද විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරීන්ගේ පාඨමාලාව අංක 08 හදාරනු ලබන ශිෂ්‍ය නිලධාරීහු ඉකුත් ජූලි 10, 11 සහ 12 යන දිනයන්හි කොළඹ ප්‍රදේශයේ අධ්‍යයන සංචාරයක් සිදුකළහ. මෙම සංචාරයේදී ඔවුන් ශ්‍රී ලංකා නාවික හමුදා නාවික විධාන පර්යන්තය, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථාන පරිශ්‍රය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය යන ස්ථානයන්හි සංචාරය කරන ලදී. එමගින් ශිෂ්‍ය නිලධාරීන් හට දැනුම හා අත්දැකීම් රැසක් ලබාගැනීමට හැකිවූ අතර, මෙම අවස්ථාව සඳහා යුද හමුදා යුද විද්‍යාලයේ සේනාවිධායක බ්‍රිගේඩියර් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ද එක්විය.


# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
කේඩබ්ලිව්එස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආර්එම්ඩබ්ලිව්පීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්ඩබ්ලිව් ලක්ෂිකා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 මනි II සේනාරත්න ජීසී 3 ඉංජිනේරු
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉංජිනේරු
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉංජිනේරු

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# ලුතිනන් කර්නල් ආර්පීකේඑස්එස් රණසිංහ ගේ දේහය වෙත අවසන් ගෞරව පුදකෙරේ

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් ලුතිනන් කර්නල් ආර්පීකේඑස්එස් රණසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරී පසුගියදා හදිසි අසනීප තත්වයක් හේතුවෙන් දැයෙන් සමුගත්තේය. වසර 28 කට වැඩි කාලයක් රට වෙනුවෙන් සේවය කොට ඇති එම නිලධාරීගේ දේහය පිළිබඳ අවසන් කටයුතු පසුගිය ජූලි 07 දින පස්වරුවේ යුද්ධ හමුදා සාමාජිකයන් සහ ඥාතීන්ගේ සහභාගීත්වයෙන් හෝමාගම, ගලවිලවත්ත - නියදගල සුසාන භූමියේදී සිදුකෙරිණි. එහිදී යුද්ධ හමුදාධිපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූද එම නිලධාරීගේ දේහය වෙත අවසන් ගෞරවාචාර දක්වා පවුලේ ඥාතීන් වෙත සිය ශෝකය ප්‍රකාශ කළේය.

# බංකරයෙන් පිට



හැම සෙබළකුටම යුදබිමේ නවාතැනක් තිබුණා. හරියට ඒක ගෙදර වගේ. සුවපහසු තැනක් නොවුනත් ජීවිතේ වැඩිකාලයක් ඔවුන් ගෙව්වෙ එතන. දුක වේදනාව දරාගත්ත, සතුට සිනහව බෙදාගත්ත ඒ බංකර් තුළ සොඳුරු කතාබස් බොහොමයි. යුදබිමේ දහස් ගණන් තිබුණු එවැනි තැන් අතර බොහෝ දෙනකුගෙ ඉරණම ලියවුණු අඳුරු කථාත් එමට තිබුණා. කොහොම උනත් අද ඒ තැන් දිරාගොස්. සලකුණක්වත් නැති තරමට වැහිල ගිහින්. අද වනවිට ඒ වියළි පරිසරයෙ ගුරුපාට මකාගෙන කොළපාට ගස්වැල් දළු දැම්මත් විරුවන් ගැන මැකිගිය මතක අවදිවෙන එක නවත්වන්න බැහැ.


රණබිමේ මතක
රටම නිදද්දී වටම රැකදුන්
නොපියවූ දෑස්...
අසුරු සැනින් අවදානම මතුවෙන තැන්වල
ඇහිපිල්ලමක්වත් නොගසාම ඔවුන්
නිරතුරු ඔබේ රැකවරණය සැදුවා...
මුළු රටම සුවසේ නිදපු හැම රාත්‍රියකදීම
නොපියවී තිබුණෙ ඔවුන්ගෙ දෑස් විතරමයි...
ඔබ දන්නවාද?
යුද්ධයක් නැතත්
ඔබ ගැනත් රට ගැනත් සෙවිල්ලෙන්
ඒ දෑස් තවමත් අවදියෙන් බව...